www.energy.gov.lk

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

இலங்கை நிலைபெறுதகு வலு அதிகாரசபை

Sri Lanka Sustainable Energy Authority



# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT 2023

# වාර්ෂික වාර්තාව 2023

වාර්ෂික වාර්තාව 2023

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

www.energy.gov.lk

# අන්තර්ගතය

## අප ගැන


| | |
|---|---|
| සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිළිබඳව | 02 |
| දැක්ම / මෙහෙවර | 04 |
| ඉලක්ක / මූලික හරයන් / අරමුණු | 05 |
| ආයතනික සන්ධිස්ථාන | 08 |
| කාර්ය සාධනය / ජයග්‍රහණ | 09 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 15 |
| අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය | 17 |
| කළමනාකරණ මණ්ඩලය | 19 |
| විගණන සහ කළමනාකරණ කමිටුව | 20 |


## ආයතනික පාලය


| | |
|---|---|
| ආයතනික පාලනය | 23 |
| අවදානම් කළමනාකරණය | 24 |
| ආයතනික ව්‍යුහය / ප්‍රධාන අංශ | 25 |
| කාර්යය මණ්ඩලය | 27 |


## කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ


| | |
|---|---|
| කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ | 31 |
| 2024 වසරේ ක්‍රියාකාරී සැලැස්ම | 41 |


## මූල්‍ය තොරතුරු


| | |
|---|---|
| අදායම් ප්‍රකාශය | 45 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 46 |
| ප්‍රාග්ධන වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 47 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 48 |
| අයවැය හා සත්‍ය ප්‍රමාණයන් සංසන්දනාත්මක ප්‍රකාශය | 49 |
| මූල්‍ය ප්‍රකාශවලට සටහන් | 53 |


## විගණන වාර්තාව


| | |
|---|---|
| ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව | 83 |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිරීක්ෂණ | 95 |







# අප ගැන...

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත ප්‍රකාරව 2007 වසරේ ඔක්තෝබර් මස පළමු වැනි දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්ථාපනය කරන ලදී.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති විප්ලවයේ පුරෝගාමී පාලන ආයතනයයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන ලද්දේ දිවයින පුරා විහිදී ඇති පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ක්‍රියාශීලිව හඳුනා ගැනීම, එමඟින් කාර්යක්ෂම, ඵලදායි සහ පරිසර හිතකාමී ලෙස බලශක්ති අවශ්‍යතා සපුරාලමින්, බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ ප්‍රධාන ආයතනය යන අරමුණ ඇතිව ය. ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනයේ එවැනි තීරණාත්මක ක්ෂේත්‍රයක් හසුරුවන ආයතනයක් ලෙස, මෙරට බහුලව ඇති සූර්ය, සුළං, ජලය සහ ජෛව බලශක්ති ප්‍රභවයන් අඛණ්ඩව සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වන අපගේ අරමුණයි. අනාගතයේදී පිරිසුදු, තිරසාර සහ දේශීය වශයෙන් සපුරා ගන්නා ලද බලශක්ති පරිභෝජනයක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවනු පිණිස බලශක්ති ක්ෂේත්‍රයේ උපාය මාර්ගික ආයෝජන දිරිමත් කිරීම අප විසින් අපේක්ෂා කෙරේ. එමෙන්ම ම නව්‍ය බලශක්ති විසඳුම් සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට හේතුවන පර්යේෂණ හා සංවර්ධනය ද, දැනුම ලබාදීම ද, සිදු කරමින් අප රට සතු බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමට අපේක්ෂිත ය.

# දැක්ම

තිරසාර සහ
බලශක්ති
සුරක්ෂිත
ශ්‍රී ලංකාවක්.

# මෙහෙවර

පුනර්ජනනීය බලශක්තිය,
බලශක්ති කාර්යක්ෂමතාවය සහ
බලශක්ති තිරසාරත්වයට
නායකත්වය දෙමින්,
බලහක්ති සුරක්ෂිතතාවය වෙන යන
මාවතේ ජාතික ආර්ථිකයට මෙන්ම
පෘථිවිය මත ඇති බලපෑම
අඩු තරමින් සුසාධනයෙන් නියාමනයෙන් හා
දැනුම් කළමනාකරණයෙන් රටේ බලශක්ති
සංක්‍රාන්තියට මංපෙත් හෙළිකරමින්
සුනිත්‍ය බලශක්ති අගය දාමයන්
ස්ථාපනය කිරීම...

# අපගේ ඉලක්ක

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ දැක්ම සහ මෙහෙවර සාර්ථක කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද යන්න සඳහා ඉලක්ක මඟින් මඟ පෙන්වීමක් කෙරේ. උපාය මාර්ගික අරමුණු, උපාය මාර්ග සහ ක්‍රියාකාරකම් සැකසීම සඳහා ඉලක්ක වැදගත් වේ. ඒ අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හඳුනාගෙන ඇති ඉලක්ක මෙසේ ය:

- ☑ ප්‍රාථමික බලශක්ති සැපයුමේ පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය වැඩි කිරීම
- ☑ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කරමින් ද, බලශක්ති සංරක්ෂණය සිදු කරමින් ද සියළු අංශවල ඇති බලශක්ති නාස්තිය අවම කිරීම.
- ☑ ආර්ථිකය ශක්තිමත් කරනු වස්, ප්‍රබල තිරසාර බලශක්ති වැඩසටහන් සැකසීමට හේතුභූත වන පරිසරයක් නිර්මාණය කිරීම
- ☑ බලශක්ති පරිහරණයෙන් පරිසරයට විමෝචනය කෙරෙන හරිතාගාර වායු ප්‍රමාණය අවම කිරීමට දායකවීම
- ☑ තිරසාර බලශක්ති වැඩසටහන්වලට සශ්‍රික පරිසරයක් සැපයීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් සැකසීම
- ☑ සමාජය, බලශක්තිය පිළිබඳ සවිඥානික සමාජයක් බවට පරිවර්තනය කිරීම

# මූලික හරයන්

## තිරසාර බව

ඉදිරි පරම්පරා සඳහා ප්‍රතිලාභ දිගු කාලීන වශයෙන් අවධාරණය කරන්නා වූ සමාජීය, ආර්ථික හා පාරිසරික වශයෙන් තිරසාර සහ සවිඥානික අධිකාරියක් වීම

## විශ්වාසනීයත්වය

අධිකාරියේ පාර්ශ්වකරුවන් අතර සහ සමාජයේ විශ්වාසදායී ලෙස ද ආචාර ධර්ම ආරක්ෂා කරමින වෘත්තීය මට්ටමෙන් ක්‍රියා කිරීම අධිකාරියේ ඉහළ ම අභිරුචිය වේ.

## මහජනතාව වෙත යොමුවීම

ජාතික වගකීමට දායක වන අතර රටේ සංවර්ධනයට සහාය ලබාදීම අරමුණ කර ගැනීම.
දැනුවත් කිරීම හා ප්‍රජාවට දැනුම බෙදාදීම මෙන්ම ප්‍රාදේශීය ආර්ථිකය නඟා සිටුවීමට සහාය ලබාදීම.

## අඛණ්ඩ අභිවෘද්ධිය

ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ සම්පත් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ ඒවාට වටිනාකමක් එකතු කිරීම. නවයතාවයෙන් යුත් ප්‍රතිලාභ ජාතියට අත්කර දෙමින් අධිකාරියේ දියුණුව ද අධීක්ෂණය කිරීම.

# අරමුණු

2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතෙහි, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූලික අරමුණු නියම කර තිබේ. එම අරමුණු පහත පරිදි ය:

බලශක්ති සුරක්ෂිතතාව ඉහළ නැංවීම සහ එමඟින් රටට ආර්ථික සහ සමාජීය ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ අරමුණ ඇතිව පුනර්ජනනීය බලශක්ති සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ සංවර්ධනය කිරීම.

ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමෙන් හා විශ්ලේෂණය කිරීමෙන් ද, අදාළ තොරතුරු කළමනාකරණය කිරීමෙන් ද රටෙහි බලශක්තිය බෙදා හැරීමේ ආරක්ෂාව, ප්‍රවර්ධනය සහ පිරිවැය ඵලදායිතාව ඇති කිරීම.

ගෘහස්ත, වාණිජ, කෘෂිකාර්මික, ප්‍රවාහන සහ අනෙකුත් අදාළ ක්ෂේත්‍රවල බලශක්ති භාවිතය සඳහා බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් හඳුනාගැනීම, ප්‍රවර්ධනය, පහසුකම් සැපයීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම.

අධිකාරියේ අරමුණු ක්‍රියාවට නැංවීම සඳහාත්, බලශක්තිය සඳහා අවම ආර්ථික පිරිවැයක් ඇති කිරීම සඳහාත්, ජාතියට බලශක්ති සුරක්ෂිතභාවය ලබාදීම සඳහාත් අධිකාරිය සතුව ප්‍රමාණවත් අරමුදල් පවතින්නේ ද යන්න සහතික කිරීම.

# ආයතනික සන්ධිස්ථාන

- බලශක්ති ක්ෂේත්‍රයේ යහපැවැත්ම උදෙසා හිතකර ප්‍රතිපත්ති සකස් කිරීම
- පුනර්ජනනීය බලශක්ති අංශය වැඩි කිරීම
- බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.
- මහජනතාව බලගැන්වීම

## 2010

☑ විදුල්කා ප්‍රදර්ශනය, සම්මන්ත්‍රණය, ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මානය ආරම්භ කිරීම

☑ විදුලි උපකරණ සඳහා අනිවාර්ය බලශක්ති ලේබල් ප්‍රථම වරට හඳුන්වා දීම. - සංයුක්ත ප්‍රතිදීප්ත පහන් සඳහා

☑ පියැසි මත සූර්යය බල පද්ධති සඳහා ශුද්ධ මිනුම් ක්‍රමයක් ආරම්භ කිරීම

## 2011

☑ පාසල් බලශක්ති සමාජ හඳුන්වාදීම

☑ හම්බන්තොට ප්‍රදේශයේ ඉදි කෙරුණු මෙගා වොට් 1.237ක ධාරිතාව ඇති ප්‍රථම සූර්ය බලාගාරය ජාතික පද්ධතියට සම්බන්ධ කිරීම

## 2014

☑ ශ්‍රී ලංකාවේ සූර්ය සම්පත් සිතියම ප්‍රකාශයට පත් කිරීම

## 2015

☑ ප්‍රතිපත්ති ඉලක්ක සපුරා ගනිමින් සමස්ත විදුලිය ජනනයෙන් 10%ක් නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් උත්පාදනය කර ගැනීම

## 2016

☑ පියැසි මත විදුලිය උත්පාදනය කිරීම වැඩි කරමින් සූර්ය බල සංග්‍රාමය වැඩසටහන ආරම්භ කිරීම, ශුද්ධ ගිණුම් ක්‍රමය ආරම්භ කිරීම.

## 2017

☑ වැඩසටහන් 10ක් සමඟින් ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණ මෙහෙයුම් පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය ස්ථාපනය කිරීම

## 2018

☑ සූර්ය බල සංග්‍රාමය වැඩ සටහන යටතේ ස්ථාපිත මෙගා වොට් 100 ඉලක්කය ළඟා කර ගැනීම.

☑ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන / ආහාර හා කෘෂිකර්ම සංවිධානය /ගෝලීය පාරිසරික වැඩසටහන යන සංවිධාන මඟින් ක්‍රියාත්මක කරන ලද තිරසාර ජෛව ස්කන්ධ බලශක්ති වැඩසටහන අතිශය සතුටුදායක මට්ටමකට නිම කිරීම.

## 2019

☑ ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රකාශයට සහ උපාය මාර්ග පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

☑ නිවැසියන් සඳහා වූ තිරසාර බලශක්ති මාර්ගෝපදේශනය ප්‍රකාශයට පත්කිරීම

☑ ශ්‍රී ලංකාවේ ජෛව ස්කන්ධ සම්පත් සිතියම ප්‍රකාශයට පත් කිරීම

☑ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන/ආහාර හා කෘෂිකර්ම සංවිධානය/ගෝලීය පාරිසරික වැඩසටහන යන සංවිධානවලින් ක්‍රියාත්මක කෙරුණු බලශක්ති ක්ෂේත්‍රයේ කාබන් විමෝචන අඩු කිරීමේ ජාතික ව්‍යාපෘතිය අවසන් කිරීම

## 2020

☑ පුනර්ජනනීය ප්‍රභව මඟින් විදුලිය උත්පාදනය මෙගා වොට් පැය 1000 දක්වා ළඟා වීම

☑ පියැසි මත සූර්ය බල විදුලි උත්පාදන ධාරිතාව මෙගා වොට් 300 ඉක්මවා යෑම

☑ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීම

☑ විදුලි පංකා සහ ශීතකරණ සඳහා බලශක්ති ලේබලකරණ නියාමනයන් අවසන් කිරීම

## 2021

☑ පියැසි මත සූර්ය විදුලි පද්ධති 30 000කට අධික සංඛ්‍යාවකින් මෙගා වොට් 400ක ධාරිතාවක් ළඟා කර ගැනීම.

☑ යුරෝපා සංගමයේ සහය මත ශ්‍රී ලංකා පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආරම්භ කිරීම

☑ බලශක්ති කාර්යක්ෂම ගොඩනැඟිලි සඳහා වූ රීති සංග්‍රහය සංශෝධනය කර අවසන් කිරීම

## 2022

☑ පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම 2022 - 2026 සම්පූර්ණ කිරීම

☑ පියැසි මත සූර්ය විදුලි උත්පාදනය කරන පද්ධති 45 000කින් මෙගා වොට් 600ක ධාරිතාවක් ළඟා කර ගැනීම.

☑ නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් මුළුවිදුලි බල ජනනය සඳහා කෙරෙන දායකත්වය 18%ක් දක්වා ඉහළ නැංවීම

☑ වායු සමීකරණයන් පරීක්ෂා කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම

## 2023

☑ **පියසි මත සූර්ය විදුලි පද්ධති 5000කට අධික ප්‍රමාණයක් තුලින් මෙගා වොට් 800ක ධාරිතාවය ඉක්මවීම**

☑ **සමුච්චිත පුණර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාව මෙගා වොට් 1700ය ඉක්මවීම**

☑ **ප්‍රථම පාවෙන සූර්ය බලාගාර ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලබා ගැනීම**

☑ **බලශක්ති කාර්යක්ෂම ශීතකරණ සඳහා වන රෙගුලාසි ගැසට් කිරීම**

# කාර්ය සාධනය - 2023

### සම්පත් පහසු කිරීම සහ ධාරිතාව එකතු කිරීම

2023 වසරේදී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මෙගාවොට් 189.4ක් එකතු කරමින් පුනර්ජනනීය බලශක්ති ධාරිතාව පුළුල් කර සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගත්තේ ය. මෙයට පොළව මත සවි කරන ලද සූර්ය බල පද්ධති මඟින් ජනනය කෙරුණු මෙගාවොට් 9ක් ද, පියැසි මත ඉඳි කරන ලද සූර්ය පැනල මඟින් ජනනය කෙරුණු මෙගාවොට් 156ක් ද, ජෛව ස්කන්ධ මඟින් ජනනය කෙරුණු මෙගාවොට් 4ක් ද, සුළං මඟින් ජනනය කෙරුණු මෙගාවොට් 15ක් ද, කුඩා ජල විදුලි බලාගාර මඟින් ජනනය කෙරුණු මෙගාවොට් 5.4 ක්ද ඇතුළත් විණ. පියැසි මත ඉඳි කරන ලද සූර්ය බලාගාර ද ඇතුළුව සම්පූර්ණ පුනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙගාවොට් 1699.4 දක්වා මෙමඟින් ඉහළ නැංවිණ.

කෙසේ වුවද, ලංකා විදුලි බල මණ්ඩලයේ 2023 - 2042 දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට අනුව 2030 වන විට ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට ඉලක්ක කෙරෙන පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණය මෙගාවොට් 8819ක් පමණ වේ. 2023 වසරෙහි ඉලක්කය මෙගාවොට් 2029ක් ජනනය කිරීමයි. එසේ වුවත් පියැසි මත ඉඳි කරන සූර්ය බලාගාර මඟින් කෙරෙන උත්පාදනය ද ඇතුළුව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් (ප්‍රධාන ජල විදුලි විදුලි බලාගාර හැර) මෙගාවොට් 1699.4ක් පමණ ජනනය කර ගැනීමට අපි සමත්ව සිටින්නෙමු. මේ අනුව 2023 වසරේ ඉලක්කය සපුරා ගැනීමට මෙගාවොට් 329.3ක පරතරයක් පමණක් පවතී.

මීට අමතරව මෙගාවොට් 64.72 පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමටත්, මෙගාවොට් 299.15 සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කිරීමටත්, මෙගාවොට් 475.19 සඳහා තාවකාලික අනුමැතිය ලබා දීමටත් හැකි විය. අනාගතයේදී පුනර්ජනීය බලශක්ති ක්ෂේත්‍රය තවදුරටත් පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම් මෙම ක්‍රියාවන්වලින් තුලින් පෙන්නුම් කෙරේ.

ඒ සඳහා වන වැඩසටහන් කඩිනම් කිරීම සඳහා, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඉදිරි වසරවලදී මහා පරිමාණ ජාතික ව්‍යාපෘති ඒකාබද්ධ කිරීමට සැලසුම් කර ඇත. එමඟින් ඉලක්ක ගත සහ සත්‍ය විදුලි ජනනය අතර පරතරය පියවා ගැනීම සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත සංක්‍රමණය වේගවත් කිරීම අරමුණු කර ගෙන තිබේ.

### සූර්ය බල සංග්‍රාමය

සූර්ය බල සංග්‍රාමය වැඩසටහන මඟින් පියැසි 54,375කට අධික ප්‍රමාණයක සූර්ය බලාගාර ඉදිකිරීමෙන් මෙගාවොට් 816ක සම්පූර්ණ ධාරිතාවක් සාර්ථකව එකතු කර ඇත. මෙය රටේ වාර්ෂික විදුලි ඉල්ලුමෙන් 5%කට ආසන්න ප්‍රමාණයකි. 2023 වසරේදී, මෙම වැඩසටහනෙන් මෙගාවොට් 156ක් එකතු වූ අතර, එය මෙගාවොට් 160 ඉලක්කයට මඳක් අඩු විණි. රජයේ ගොඩනැගිලි සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සූර්ය බලාගාර ඉදිකිරීම වැනි අඛණ්ඩ ව්‍යාපෘති මඟින් තිරසාර බලශක්ති සංවර්ධනය සඳහා වූ කැපවීම පෙන්නුම් කෙරේ. ඉන්දීය ණය වැඩපිළිවෙල 2023 වසර ආරම්භ විණ. පියැසි මත සූර්යය බල පද්ධති ස්ථාපනය, බැටරි ගබඩා කිරීම සහ පාවෙන සූර්යය ව්‍යාපෘති වැනි කාර්යයන් සඳහා එමඟින් මූලික වශයෙන් සහය ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්ති භාවිතය වේගවත් කිරීම එහි අරමුණයි. මෙයට අමතරව, ඉන්දීය අරමුදල් යටතේ යාපනයේ කුඩා දූපත් තුනක දෙමුහුම් පුනර්ජනනීය බලශක්ති පද්ධතියක් ඉදිකිරීමට සහය ලැබේ. එමඟින් පවුල් 3000 කට පමණ ප්‍රතිලාභ ලබාදීම අරමුණු කර ඇත.

### සම්පත් හඳුනාගැනීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ක්‍රියාකාරී ප්‍රවේශය 2020/2021දී ආරම්භ වූයේ සම්පත් හඳුනාගැනීමට ප්‍රමුඛත්වය ලබා දීමෙනි. භූගෝලීය තොරතුරු පද්ධති මඟින් හඳුනාගත් මෙගාවොට් 3000 ක සූර්ය බලශක්ති සහ මෙගාවොට් 1000 ක සුළං බල ව්‍යාපෘති සඳහා 2023 දී කැබිනට් අනුමැතිය ලබා ගත් අතර ව්‍යාපෘති ස්ථාන ලැයිස්තුව සකස් කිරීමත්, ගැසට් කිරීමත් සිදු කෙරිණ.

### ආයෝජනයට සූදානම් කරන ලද ජාතික උද්‍යාන ව්‍යාපෘති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මෙගාවොට් 956 ක ව්‍යාපෘති සඳහා පූර්ව සංවර්ධන කටයුතු සඳහා සක්‍රීයව සම්බන්ධ වී ඇත. රටේ විදුලි අවශ්‍යතා සඳහා සැලකිය යුතු දායකත්වයක් එමඟින් ලැබෙනු ඇත. මෙගාවොට් 234ක සුළං බලයක් උත්පාදනය කිරීම ඉලක්ක කරගත් පුනරින් සුළං බලශක්ති උද්‍යානය ඒ අතරින් කැපී පෙනෙන ව්‍යාපෘතියකි. 2023 දී, ඊට අදාළ අත්‍යවශ්‍ය අධ්‍යයනයන් සාර්ථකව නිම කෙරිණ. පාරිසරික බලපෑම් තක්සේරු අනුමැතිය සහ ඊට අවශ්‍ය අනෙකුත් සියලුම අනුමැතීන් ලබා ගන්නා ලදී.

තවද සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ද අභිවෘද්ධියක් ලබා ගනිමින් තිබේ. කිලෝමීටර 4 ක ප්‍රවේශ මාර්ගයක් ඉදිකර ඇත. පරිසර කළමනාකරණ සැලැස්මේ දක්වා ඇති සැලසුම් කරන ලද නැවත වන වගා කටයුතුවලින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් ද සිදු කෙරී තිබේ. එසේම, මන්නාරම සුළං විදුලි බලාගාරයේ 11 වන අදියර ව්‍යාපෘතිය සඳහා ද බොහෝ අනුමැතීන් ලැබී ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය මේ වන විට සිදු කෙරෙමින් පවතී.

මීට අමතරව, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙගාවොට් 210 ක ව්‍යාපෘතියක් වන වෙරවිල් සුළං උද්‍යානයේ මූලික නිෂ්කාශන ද සහිතව ඉදිරියට කෙරෙමින් ඇත. පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ අදියර අවසන් කරන ලදී. මෙම සංවර්ධනයන් මඟින් ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම් දියුණු කිරීමේ කාර්යයෙහි සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කෙරේ.

## නව මැදිහත්වීමක් ලෙස පාවෙන සූර්යය බල පද්ධති ඉදිකිරීම

කොරියානු ආධාර යටතේ කිරිඉබ්බන් වැවෙහි සහ චන්ද්‍රිකා වැවෙහි මෙගාවොට් 1 බැගින් වූ පාවෙන සූර්ය බල පද්ධති ඉදි කිරීමේ ව්‍යාපෘතියක් 2023 වසරේදී අනුමත විණ.

## ශ්‍රී ලංකා ජාතික බලශක්ති තුලනය

ශ්‍රී ලංකා ජාතික බලශක්ති තුලනය, ජාතියේ බලශක්ති අංශයේ ක්‍රියාකාරීත්වය සොයා බැලීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා ජාතික බලශක්ති තුලනය - 2020 ප්‍රකාශයට පත් කරන ලද අතර 2021 වාර්තාව මුද්‍රණ මට්ටමේ පවතී. 2022 වාර්තාව සඳහා දත්ත ඇතුළත් කිරීම සක්‍රියව සිදු කෙරේ.

## බලශක්ති කළමනාකරණ පද්ධති

බලශක්ති කළමනාකරණ පද්ධති ක්ෂේත්‍රයේ, බලශක්ති කළමනාකරු / විගණක වැඩසටහන වැනි මුල පිරීම් කර්මාන්තවල සහ ව්‍යාපාරවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට හේතු වේ. බලශක්ති කළමනාකරුවන් 250 ක්, පිළිගත් බලශක්ති විගණකවරුන් 24 ක් සහ බලශක්ති සේවා සමාගම් 30 ක් බලශක්ති කළමනාකරණ සේවා සැපයීම සඳහා සම්බන්ධ වී ඇත. මූල්‍ය හා සිල්ලර අංශ සඳහා මිණුම් දඬු 2023 දී ප්‍රකාශයට පත් කරන ලද අතර සුපිරි වෙළඳසැල් අලෙවිසැල් 45 ක් ජාතික බලශක්ති මිණුම් සලකුණු පද්ධතිය සමඟ එක් වීමට අත්සන් කර තිබේ. තවද, විවිධ ආයතන සඳහා උපදේශන සේවා, බලශක්ති විගණන සහ බලශක්ති කළමනාකරණ පුහුණු වැඩසටහන් දෙකක් සිදු කරන ලදී.

## පර්යේෂණ සහ සමීක්ෂණ

සමීක්ෂණ සහ පර්යේෂණ ප්‍රයත්නයන් ක්‍රියාත්මක වෙමින් පවතින වායු සමීකරණ සමීක්ෂණයක් ද ඇතුළත්ව, සිසිලන යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය කේන්ද්‍ර කර ගනිමින් ආරම්භක මට්ටමේ විගණන 100 කින් සිදු කෙරී ඇත. කාර්යක්ෂම ශීතකරණ ප්‍රතිස්ථාපන වැඩසටහන මඟින් ගෘහස්ථ විදුලි පරිභෝජනය 30% කින් අඩු කිරීම අරමුණු කෙරේ. වීදි ආලෝකකරණය සඳහා සුදුසු තාක්ෂණයන් පිළිබඳ සහයෝගී අධ්‍යයනයක් ලංකා විදුලි සමාගම සමඟ සිදු කෙරෙමින් පවතී.

## පද්ධති සහ සැලසුම්

බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ පරිචයන් සංග්‍රහය සංශෝධනය කිරීම, පද්ධති සහ සැලසුම් අංශයේ ප්‍රයත්නයෙන් සිදු කෙරිණ. ඉන්ධන කාර්යක්ෂමතා ලේබල් කිරීමට සහ විද්‍යුත් සංචලතා ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමට ප්‍රවාහන අංශය ආරම්භ කර තිබේ.

## ගෘහස්ත, කෘෂිකර්ම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ

බලශක්ති උපකරණ ලේබල් කිරීමේ වැඩපිළිවෙල යටතේ එල්.ඊ.ඩී. පැනල සඳහා ස්වේච්ඡා ලේබල් කිරීම ද, ශීතකරණ බලශක්ති ලේබල් කිරීමේ රෙගුලාසි ද ගැසට් කර ඇත. විවිධ උපකරණ සඳහා පරීක්ෂණ / මිණුම් සලකුණු කිරීමේ ව්‍යාපෘති ද ඒ යටතේ ආරම්භ කර තිබේ. ගෘහස්ත අංශය තුළ, අධීක්ෂණය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. බලශක්ති කාර්යක්ෂම ජෛව ස්කන්ධ පිසුම් උදුන් පරීක්ෂා කිරීම අවසන් කරන ලදී.

## ප්‍රචාරණ සහ ප්‍රවර්ධන

ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය යටතේ බලශක්ති ධාරිතාව ගොඩනැගීම සඳහා ගුරුවරුන් 440 දෙනෙකු සම්බන්ධ කරගෙන පුහුණු සැසි සම්පූර්ණ කරන ලදී.

## අරමුදල් සම්පාදනය

අරමුදල් සම්පාදනය මඟින් පනතේ විධිවිධාන ප්‍රකාරව සෙස් සහ රාජ්‍ය භාගය සක්‍රීය කිරීම, තිරසාර බලශක්ති අරමුදල සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සහ පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා අයවැය උපයෝජනය අඛණ්ඩව අධීක්ෂණය යන කාර්යයන් සිදු කෙරේ.

# කාර්යසාධනට අදාල වැදගත් කරුණු

| විස්තරය | ඒකකය | 2022 | 2023 |
|---|---|---|---|
| පුනර්ජනනීය විදුලි බල උත්පාදනය | ගි.වො | 8301 | 7795 |
| කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව | මෙ.වො | 429 | 437 |
| සූර්ය බලශක්ති ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව (භූමියට සවිකරන ලද) | මෙ.වො | 130 | 140 |
| සුළං බලශක්ති ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව | මෙ.වො | 148 | 263 |
| ජෛව ස්කන්ධ බලශක්ති ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව | මෙ.වො | 59 | 50 |
| ජාතික පද්ධතියට සම්බන්ධ කර ඇති, පියැසි මත සූර්ය බල පද්ධති සමුච්චිත සංඛ්‍යාව | - | 46,203 | 55128 |
| පියැසි මත සූර්ය බල ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව | මෙ.වො | 656.97 | 813 |
| පියැසි මත සූර්ය බල ව්‍යාපෘතිවලින් කෙරෙන විදුලිය ජනනය | ගි.වො | 530 | 632 |
| කාර්යක්ෂම උපකරණවලින් කෙරෙන විදුලිය ඉතිරිය | ගි.වො | 600 | 125 |
| වළක්වන ලද කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය | කිලෝ ටොන් | | 5986.4 |
| **මානව ප්‍රාග්ධනය** | | | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මුළු සේවකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 97 | 94 |
| වසර 10 ට වඩා සේවා පළපුරුද්ද ඇති සේවකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 60 | 61 |
| වසර 5 ට වඩා සේවා පළපුරුද්ද ඇති සේවකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 77 | 77 |
| **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය** | | | |
| සිදු කරන ලද බලශක්ති විගණන සංඛ්‍යාව | සංඛ්‍යාව | 5 | 4 |
| බලශක්ති කළමනාකරුවන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 238 | 250 |
| කුළී පදනම මත උපකරණ-දින සංඛ්‍යාව | සංඛ්‍යාව | 1140 | 2273 |
| ප්‍රකාශයට පත් කරන ලද බලශක්ති ලේබලකරණ ප්‍රමිතීන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 1 | 1 |
| හම්බන්තොට සූර්ය උද්‍යානය නැරඹීමට පැමිණි සංඛ්‍යාව | සංඛ්‍යාව | | 1483 |
| ශ්‍රී.ලං.ස.බ.අ ලියාපදිංචි කරගන්නා ලද සූර්ය සේවා සමාගම් සංඛ්‍යාව | සංඛ්‍යාව | 373 | 506 |
| ශ්‍රී.ලං.ස.බ.අ ලියාපදිංචි කරගන්නා ලද බලශක්ති සේවා සමාගම් සංඛ්‍යාව | සංඛ්‍යාව | 29 | 30 |
| බලශක්ති කළමනාකරණය පිළිබඳ පුහුණුව ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 110 | 500 |
| සූර්යබල විද්‍යුත් තාක්ෂණ පිළිබඳව පුහුණුව ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | | 650* |
| ප්‍රකාශයට පත් කරන ලද සූර්ය බලශක්ති ප්‍රමිතීන් සංඛ්‍යාව | සංඛ්‍යාව | - | 1 |
| පහසුකම් සපයන ලද පර්යේෂණ සංඛ්‍යාව | සංඛ්‍යාව | - | 3 |
| පළ කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව | සංඛ්‍යාව | 1 | 6 |

***ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම, ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සහ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය යන ආයතනවල සහයෝගීතාවයෙන් පුද්ගලයන් 3 800ක් මෙයට අමතරව පුහුණුව ලබා ඇත**

1,378 ගි.වො → කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය

818 ගි.වො → සුළං බලාගාර ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය

859 ගි.වො → සූර්යබලාගාර ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය

167 ගි.වො → ජෛව ස්කන්ධ ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය









# ජයග්‍රහණ


පුනර්ජනනීය බලශක්ති ව්‍යාපාර ස්ථාපිත ධාරිතාව වැඩිවීම
1,800
1,600
1,400
1,200
1,000
800
600
400
200
0
2007 2008 2009 2010 2011 2012 2013 2014 2015 2016 2017 2018 2019 2020 2021 2022 2023
පුනර්ජනනීය බලශක්ති
පියැසි සූර්ය පද්ධති


පුනර්ජනනීය බලශක්ති හරහා නිෂ්පාදිත විදුලි ප්‍රමාණය
7000
6000
5000
4000
3000
2000
1000
0
70%
60%
50%
40%
30%
20%
10%
0%
2007 2008 2009 2010 2011 2012 2013 2014 2015 2016 2017 2018 2019 2020 2021 2022 2023
මහා පරිමාණ ජල විදුලිය (Gwh)
වෙනත් පුනර්ජනනීය බලශක්ති (Gwh)
පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය (%)


පුනර්ජනනීය බලශක්ති ප්‍රභවය අනුව ධාරිතාව වැඩිවීම
1,000
800
600
400
200
0
2007 2008 2009 2010 2011 2012 2013 2014 2015 2016 2017 2018 2019 2020 2021 2022 2023
ජල
සූර්ය
පියැසි සූර්ය පද්ධති
ජෛව ස්කන්ධය
සුලං
වෙනත්







# සභාපතිතුමාගේ පණිවිඩය

මෙය බලශක්ති සංක්‍රාන්තිය පිළිබඳ දැවැන්ත ගෝලීය සංවාදයක් පවතින කාලයකි. පසුගිය කාලපරිච්ඡේදවල ලෝකයේ බලශක්ති සැපයුම් රටාව ඛනිජ තෙල් ආධිපත්‍යය දැරූ අතර, එය ගෝලීය තිරසාරභාවය කෙරෙහි බැරෑරුම් ලෙස අවධානය යොමු කිරීමට ලෝකය හේතු විය. මූලික වශයෙන්, ඛනිජ තෙල් ඉන්ධන දහනය හේතුවෙන් සිදුවන හරිතාගාර වායු (GHG) විමෝචනය ගෝලීය මට්ටමින් උෂ්ණත්වය ඉහළ යාමට හේතු වී ඇති අතර එමඟින් සමස්ත ලෝකයම දේශගුණික විපර්යාසවල ප්‍රතිවිපාකවලට ලක්වීමට හේතු වී තිබේ. මේ අතර ඛණිජ තෙල් සම්පත අඩුවීමත් සමඟ ඉන්ධන සැපයුමෙහිම තිරසාර බවක් දක්නට නැත. එබැවින්, ගෝලීය මට්ටමින් කතා බහට ලක් කෙරෙන බලශක්ති සංක්‍රාන්තිය යනු ලෝකයේ බලශක්ති සුසමාදර්ශයේ තවත් වෙනසක් නොව, බලශක්ති ප්‍රධාන තල්ලුවක් වන ආර්ථිකයේ සමස්ත සන්දර්භය තුළ දූරදර්ශී ප්‍රවේශයක් ලබා දීමයි. තවද, පුනර්ජනනීය බලශක්ති සම්පත් පොහොසත් රටවල් ගෝලීය බලශක්ති ක්ෂේත්‍රයේ ධ්‍රැවීයතාවක් ගනිමින් සිටී. මෙම පසුබිම තුළ, ශ්‍රී ලංකාව පැහැදිලිවම ගෝලීය ප්‍රවණතා සමඟ සමපාත විය යුතු අතර, රජයේ ඉහළ කැපවීම සන්දර්භය සමඟ හොඳින් ගැලපේ. මෙම තත්ත්වය තුළ, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි හි කාර්යභාරය ඉතා වැදගත් වේ

2023 දී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් සම්බන්ධ වී ඇත්තේ 2030 වසරේදී සමස්ථ විදුලි ජනනයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් තුලින් සැපයීමේ දැවැන්ත රජයේ ඉලක්කය සමඟ ය. මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති සහ විශේෂයෙන්ම වහල මත ඇති සූර්ය බලශක්ති වැඩසටහන මඟින් රටේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන න්‍යාය පත්‍රයට ඉහළ ජවයක් ලබා දෙමින් මේ සඳහා යහපත් ගතිකත්වයක් එක් කළ හැකිය. පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහන්වල කැපී පෙනෙන ප්‍රගතියට අමතරව, සමස්ත තිරසාර අංගයන් ඇතුළත් කිරීම සහතික කිරීමට ගෙන ඇති උත්සාහයන් ද විශේෂයෙන් සඳහන් කළ යුතුය. පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්‍රියාවලියේ දී සමාජ-පාරිසරික මානයන්ට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපරිම අවධානය යොමු කෙරේ. එහි දී, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ සමපාත වන ප්‍රමුඛ සහ නිසි සැලකිල්කට ගත යුතු අංශයන් හඳුනාගෙන ඒ අනුව ව්‍යාපෘතින් පෙළගස්වා ඇත.

සියල්ලන්ටම ප්‍රථම බලශක්ති කාර්යක්ෂමතාවයේ සහ සංරක්ෂණයේ වැදගත්කම අපට වැටහෙනවා. ගෝලීය තිරසාර බලශක්ති සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ස්ථාපිත ඉලක්කයන් තුලින් 50% ක් විවිධ තාක්ෂනික ප්‍රවේශයන් හා මානව මැදිහත්වීම් හරහා බලශක්තිය සඳහා වන ඉල්ලුම අඩු කරගැනීම සඳහා වන අතර ඉතිරි 50%  පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය හරහා සපුරා ගැනිමට අපේක්ෂා කෙරේ. ආයතන මට්ටමින් බලශක්ති කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා විශේෂයෙන් හඳුන්වා දී ඇති ක්‍රමානුකූල ප්‍රවේශයන් පිළිබඳව මම සතුටු වෙමි. මෙමගින් අවසාන භාවිත අංශ සඳහා ඔවුන්ගේ බලශක්ති පිරිවැය අඩු කර ගැනීමට හැකි වන අතර, එය පුළුල් අර්ථයෙන් රටේ බලශක්ති සුරක්ෂිතභාවය සාක්ෂාත් කර ගැනීමට උපකාරී වනු ඇත.

රටේ තිරසාර බලශක්ති සංවර්ධන න්‍යාය පත්‍රය විශිෂ්ට යථාර්ථයක් බවට පත් කිරීම සඳහා බලශක්ති ක්ෂේත්‍රය තුල රැදෙමින් අපට විවිධ ආකාරයෙන් මඟපෙන්වූ , සහය දුන් සියලූම පාර්ශ්වකරුවන්ට මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර ඉදිරියේදිත් ඔබගේ සහයෝගීතාවය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.



ඉංජිනේරු රංජිත් සේපාල
සභාපති



# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්ෂේත්‍රය තුළ සූර්ය බලශක්ති ව්‍යාපෘතිවල වේගවත් සංවර්ධනයක් මෙම වසරේදී නිරීක්ෂණය කළ හැකි විය. මේ අනුව සූර්ය වහල වැඩසටහන සංකේතාත්මක වැඩසටහනක් වූ අතර, ධාරිතා එකතු කිරීම සැලසුම් කර ඇති ප්‍රමාණයට වඩා වේගවත් පියවරක් වාර්තා කළ අතර, එය ඉදිරි කාලපරිච්ඡේදවල දී සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන ඉලක්ක සඳහා සහත් රුකුළක් වනු අතැයි අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන කෙතරම් පුලුල්ව පැතිරී ඇත්ද යත්, සමාගම් 500 කට ආසන්න සංඛ්‍යාවක් සම්බන්ධ වී ඇති අතර, තාක්ෂණ ශිල්පීන් ඇතුළු විශාල පිරිසකට රැකියා අවස්ථා නිර්මාණය කර ඇත. තවද, මධ්‍ය පරිමාණයේ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමටත් ඉඩම් ලබා ගැනීම, පාරිසරික අනුමැතිය ලබා ගැනීම ආදී කටයුතු ද සිදු කරගනිමින් ප්‍රථම මහා පරිමාණ සූර්ය බල ව්‍යාපෘතිය සහ පරිමාණ සුළං බල ව්‍යාපෘතියක් සිදු කරිමටද පෞද්ගලික අංශයේ ව්‍යාවසායකයින් විසින් උනන්දුවක් දක්වන ලදී

පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්ෂේත්‍රයේ තවත් පුනුරුදයක් ලෙස ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා නව මාර්ග ගවේෂණය කළ හැකි විය. කොරියානු රජයේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක වන චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැවේ මෙගාවොට් 1ක ධාරිතාවයකින් යුත් පාවෙන සූර්ය බලශක්තිය පිළිබඳ නියමු ව්‍යාපෘති මේ සම්බන්ධයෙන් සම්භාව්‍ය උදාහරණ ලෙස දැක්විය හැකිය. ජපානයේ සහ කොරියාවේ ප්‍රදාන ආධාර හරහා ක්‍රියාත්මක කරන ලද ප්‍රථම පොලොව මත වු සූර්ය බලශක්ති ව්‍යාපෘති මට මතකයි, සූර්ය බලශක්තිය පිළිබඳ විශාල පියවරක් සඳහා මංපෙත් තලය බවට පත් වූ අතර, මෙම නියමු ව්‍යාපෘති හරහා ලබාගත් අත්දැකීම් පාවෙන තවත් අවස්ථා විවර කරනු ඇතැයි මම සිතමි. සූර්ය බලය, විශේෂයෙන් මහා පරිමාණයෙන්. USAID ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහනේ සහාය ඇතිව මහා පරිමාණ පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනයන් ද සිදු කළ හැකි අතර, බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණය යන ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් නගා සිටුවීම සඳහා සහයෝගීතාව ලබා දී ඇත. බලශක්ති කාර්යක්ෂමතාව ක්ෂේත්‍රය තුළ, උපකරණ බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන, බලශක්ති කාර්යක්ෂමතාව ගොඩනැගීමේ සංග්‍රහය සඳහා වූ ව්‍යවහාර සංග්‍රහය පිළිබඳ වැඩසටහන යනාදිය ඒවායේ සන්ධිස්ථානවලට තවදුරටත් එකතු කරමින් අඛණ්ඩව සිදු කරන ලද අතර, බලශක්ති පරිභෝජන මිණුම් සලකුණු පිළිබඳ වැඩසටහන හරහා විශේෂ සන්ධිස්ථානයක් නිර්මාණය කළ හැකිය. එය ආයතන විසින් බලශක්ති පරිභෝජන වාර්තා කිරීම සඳහා නියාමන මැදිහත්වීම් වලට තුඩු දුන්නේය. ලෝක බැංකු සමූහයේ සහය හරහා තවත් පුනර්ජනනීය බලශක්ති වර්ගයක් ගවේෂණය කළ හැකි අතර, එහිදී ඔවුන් වෙරළාසන්න සුළං බලශක්ති සංවර්ධනය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කළ අතර, එය ප්‍රදේශයක් ලෙස සුළං බලය සඳහා සැලකිය යුතු ධාරිතාවක් එකතු කිරීමක් දක්වයි. බලශක්ති අපනයන සඳහා ද අවස්ථා විවර වනු ඇත.

පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතාවයේ සෘජු මැදිහත්වීම්වලින් ඔබ්බට යමින්, දිගුකාලීනව තිරසාර බලශක්ති ධාවනයට සහාය වන තාක්ෂණ සංවර්ධනය පිළිබඳ පුළුල් සංවාදයකට අධිකාරියට සම්බන්ධ විය හැකි අතර ඒ යටතේ බලශක්ති ගබඩා කිරීමේ තාක්ෂණයන්, හරිත හයිඩ්‍රජන් යනාදිය මධ්‍ය කාලීනව ප්‍රධාන ප්‍රවාහයන් ලෙස දියුණු කිරීමට කිරීමට බලාපොරොත්තු වේ.

මේ අනුව, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය  විසින් 2023 වර්ෂයේදී සැපයුම් පාර්ශවීය කළමනාකරණය සහ ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණය යන තේමාත්මක ක්ෂේත්‍ර දෙකෙහි සිය වැඩසටහන් සාර්ථකව ක්‍රියාවට නංවා ඇත. බලශක්ති ඉල්ලුම අඩු කිරීම හෝ තිරසාර බලශක්ති ප්‍රභවයන් භාවිතා කරමින් බලශක්ති සැපයීම තුළින් සෘජු ප්‍රතිලාභයට අමතරව, බලශක්ති තිරසාරත්වයේ සංකල්පීය අඛණ්ඩතාව මෙම වැඩසටහන් හරහා දිගු ගමනක් යනු ඇත. තිරසාර බලශක්තිය විෂය ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් සංවර්ධනය වන ක්ෂේත්‍රයක් වන බැවින් මෙය විශේෂයෙන් වැදගත් වන්නේ මෙම විෂයය තුළ රැස් කර ගන්නා දැනුම සහ කුසලතා විශාල වශයෙන් සමාජයට පුළුල් ප්‍රතිලාභ ලබා දීමේ වැඩසටහන් පුළුල් කිරීමට සහ ජාතික තිරසාර බලශක්ති ඉලක්ක සපුරාලීමට උපකාර වන බැවිනි.



ඉංජිනේරු ජේ.එම්.අතුල
අධ්‍යක්ෂ ජනරාල්

# කළමනාකරණ මණ්ඩලය

**ඉංජි. රංජිත් සේපාල මයා**
සභාපති
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**කේ.ඒ.එස්. මහේෂිකා මිය**
අතිරේක ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ටී.ඒ.ආර්. රේණුකා මිය**
අතිරේක ලේකම් (සංවර්ධන)
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

**පී. නාමගල් මිය**
අධ්‍යක්ෂ
කර්මාන්ත අමාත්‍යාංශය

**ලතීෂා ලියනගේ මිය**
අතිරේක ලේකම්
(පරිපාලන හා මානව සම්පත් කළමණාකරන) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

**දමිත කුමාරසිංහ මයා**
අධ්‍යක්ෂ ජනරාල්
මහජන උපයෝගීතා කොමිෂන් සභාව

**එන්. එම්. එස්. පී. කරුණාදාස මයා**
සහකාර අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
(ජනවාරි - මැයි)

**ජනක ධර්මකීර්ති මයා**
ලේකම්
වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

**ඩබ්. ජේ. එල්. එස්. ප්‍රනාන්දු මයා**
පත්කල සාමාජික
(ජනවාරි - පෙබරවාරි)

**කුලානි එච්. ඩබ්. කරුණාරත්න මිය**
අධ්‍යක්ෂ (විමර්ශන)
පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

**ආර්. එල්. මොලගොඩ මයා**
අධ්‍යක්ෂ (තාක්ෂණික)
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

**තරණි අනෝජා ගමගේ මිය**
අතිරේක ලේකම්
වාරිමාර්ග අමාත්‍යාංශය

**දිමන්ත සෙනෙවිරත්න මයා**
ප්‍රධාන විධායක නිලධාරී
ජාතික සංවර්ධන බැංකුව
(සැප්තැම්බර් - දෙසැම්බර්)

**ඒ. එල්. කේ. එම්. එම්. පී. බණ්ඩාර මයා**
අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
(මැයි - දෙසැම්බර්)

**ආර්. එම්. එස්. පී. එස්. බණ්ඩාර මයා**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල් අමාත්‍යාංශය
(මැයි - දෙසැම්බර්)

**ඉංජි. කුෂාන් ජයසූරිය මයා**
පත්කල සාමාජික

**ඩිලාන් විදානපතිරණ මයා**
පත්කල සාමාජික

**මනිල් මඩුගල්ල මයා**
පත්කල සාමාජික

**අජිත් දමුණුපොල මයා**
පත්කල සාමාජික

# විගණන සහ කළමනාකරණ කමිටුව

## සාමාජිකයන්

**එන්. එම්. එස්. පී. කරුණාදාස මහතා**
සහකාර අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

**පී. නාමගල් මහත්මිය**
අධ්‍යක්ෂ, කර්මාන්ත අමාත්‍යාංශය

**අජිත් දමුණුපොළ මහතා**
කළමනාකරණ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**ආර්. එම්. එස්. පී. බණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

## නිරීක්ෂකයන්

**එන්. ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මිය**
විගණන අධිකාරී
ජාතික විගණන කාර්යාලය

**එම්. පී. කන්දීබන් මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය.

**තයලිනි තවමානන් මිය**
ප්‍රධාන අභ්‍යන්තර විගණක
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය





# ආයතනික පාලනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය සමානත්වය, සාධාරණත්වය, අපක්ෂපාතීත්වය, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම පහ ගුරු කරගෙන ක්‍රියාත්මක වේ. මෙම පාලන මූලධර්ම පදනම ලෙස තබා ගනිමින් සියලුම පාර්ශ්වකරුවන් සමඟ සවිමත් සබඳතා ගොඩනඟා ගැනීමට ද, තිරසාර බලශක්ති සංවර්ධනය උදෙසා හිතකර හිතකර පරිසරයක් පෝෂණය කිරීමට ද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය උත්සාහ ගනිමින් සිටියි. රජයේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය උදෙසා ආචාර ධර්ම ප්‍රමිතීන්ට අනුගත වෙමින් අධිකාරියෙහි කටයුතු ක්‍රියාත්මක කෙරේ. රජය විසින් ප්‍රකාශිත ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යුහයන් සහ තොරතුරු පෙළ ගැස්වීමට අධිකාරිය කැප වී නිවැරදිව ක්‍රියා කරයි.

### කළමනාකරණ මණ්ඩලය

2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත ප්‍රකාරව පවරා ඇති රාජකාරි ඉටුකිරීම සම්බන්ධයෙන් අවසන් වගකීම දරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලය විසිනි. විෂය භාර අමාත්‍යවරයා පත් කළ සභාපතිවරයා ඊට නායකත්වය ලබා දෙයි.

### වගකීම

පනතේ දක්වා ඇති අරමුණු සපුරාලීම, පනතෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සහ සපයා ඇති මූල්‍ය තොරතුරුවල නිරවද්‍යභාවය උදෙසා අභ්‍යන්තර පාලන පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවසන් වගකීම දරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලය විසිනි. අධිකාරියෙහි කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රියාත්මක කරන අතර කළමනාකරණ මණ්ඩලයේ පාලනයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරයි.

අධිකාරියේ මූල්‍ය අංශයේ කටයුතු අධීක්ෂණය කරන විගණන සහ කළමනාකරණ කමිටුව නම් වූ අනුකමිටුවක් මඟින් මණ්ඩලයට සහාය සැපයේ. එමෙන් ම මණ්ඩලයේ හැකියාවෙන් ඔබ්බෙහි පවතින, තාක්ෂණික වශයෙන් සංකීර්ණ වූ කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අවශ්‍යතාව මතු වූ විට බාහිර උපදේශක කමිටුවක සහාය, මණ්ඩලයට ලැබෙයි.

අධිකාරියේ සියලුම ම ප්‍රසම්පාදන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට දැඩි ලෙස යටත්ව සිදු කරනු ලැබේ. බලාපොරොත්තු වන ප්‍රසම්පාදනයේ වටිනාකම මත ස්වාධීන තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු දෙකක මඟපෙන්වීම යටතේ එකී කාර්යය අධිකාරියේ නිලධාරීහු සපුරති.

### සංයුතිය

නිල බලයෙන් පත්වන සාමාජිකයන් දොළොස්දෙනෙකුගෙන් ද, සභාපතිවරයා ඇතුළුව පත් කරගන්නා ලද සාමාජිකයන් නවදෙනෙකුගෙන් ද වශයෙන් කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් විසි එක්දෙනෙකුගෙන් සමන්විත ය.

### කළමනාකරණ මණ්ඩල රැස්වීම්

දින දර්ශනය මත පදනම්ව කළමනාකරණ මණ්ඩල රැස්වීම් සැලසුම් කෙරෙන අතර අවම වශයෙන් මසකට එක රැස්වීමක්වත් පැවැත් වේ. අධිකාරියේ උපාය මාර්ගික දිශානතිය සකස් කිරීම, සියලුම ක්‍රියාකාරකම්වල කාර්යසාධනය සහ ප්‍රගතිය සමාලෝචනය කිරීම, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සමාලෝචනය, වැඩසටහන් සැකසීම යන කාර්යයන් මෙකී රැස්වීම්වලදී සිදු කෙරේ. අධිකාරියේ නිලධාරීන්ට, අධිකාරියේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අදාළ වන යෝජනා, මණ්ඩලයේ අවධානයට යොමු කිරීම සඳහා ඉදිරිපත් කිරීමට මෙම රැස්වීම්වලදී ඉඩ ලැබෙයි. සෑම රැස්වීමකට ම පළමුව කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ට ප්‍රමාණවත් තරම් ලේඛන ලබාදීමට පියවර ගැනේ. 2023 වර්ෂයේ පැවැති රැස්වීම් සඳහා කළමනාකරණ මණ්ඩලයේ සහභාගීත්වය පහත දැක් වේ.

| රැස්වීම් අංකය | රැස් වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 2023/03/16 | 13 |
| 2 | 2022/05/10 | 12 |
| 3 | 2023/06/23 | 12 |
| 4 | 2023/07/27 | 14 |
| 5 | 2023/09/20 | 15 |
| 6 | 2023/10/25 | 11 |
| 7 | 2023/12/07 | 10 |

### ශෛනතික අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීම

අධිකාරිය ස්ථාපනය කරන ලද පනතේ විධිවිධාන සහ රජය මඟින් වරින් වර පනවනු ලබන නීති, රෙගුලාසි හා මාර්ගෝපදේශනයන්ට අනුකූලතාව දක්වන බව සහතික කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය සෑම උත්සාහයක් ම දරයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට ද 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට ද අනුකූලව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශය සකස් කෙරෙන බව මණ්ඩලය මඟින් සහතික කෙරේ.

# අවදානම් කළමනාකරණය

මනා කළමනාකරණයේදී සහ පාලනයේදී අවදානම් කළමනාකරණය අවශ්‍ය ම අංගයක් බව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අවබෝධ කරගෙන ඇති අතර තිරසාර බලශක්තියට අදාළ වන පොදු අවදානම් ද අතිරේක අවදානම් ද එම අධිකාරිය හඳුනාගෙන ඇත. එම විශේෂ අවදානම් ප්‍රධාන වශයෙන් සම්බන්ධ වන්නේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා එය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්තිමය පරිසරය සමඟ ය. එබැවින් මූල්‍ය සහ මෙහෙයුම් පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් කළමනාකරණ මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ එක්ව අවදානම් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. අභ්‍යන්තර විගණන සහ කළමනාකරණ කණ්ඩායමක් අධිකාරියේ පද්ධතිවල කාර්යසාධනය විටින් විට සමාලෝචනය කරයි.

### අවදානම් සංස්කෘතිය

අවදානම් තත්ත්වය කළමනාකරණ මණ්ඩලයේ පැහැදිලි අවධානයට ලක්ව ඇති අතර අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් විශේෂ වැඩපිළිවෙලක් පවත්වාගෙන යනු ලැබේ. ආචාර ධාර්මික මූලධර්ම වෙත ඇති ස්වකීය කැපවීම පිළිබිඹු කරමින් කළමනාකාරිත්වය තීරණ ගැනීමේදී සියලුම පාර්ශවකරුවන්ගේ තත්ත්වය සැලකිල්ලට ගනු ලැබේ. නායකත්වයට අනුව, කාර්ය මණ්ඩලය ද එවැනි සදාචාරාත්මක මූලධර්මවල වැදගත්කම හඳුනාගෙන එය අඛණ්ඩව අනුගමනය කරයි.

### අවදානම් හඳුනාගැනීම

අවදානම් හඳුනාගැනීමේදී අධිකාරිය බාහිර පරිසරය සමීපව නිරීක්ෂණය කරයි. ඒ අනුව හඳුනාගන්නා අවදානම්, ගෝලීය බලශක්ති කර්මාන්තයට සහ මෙරටට සුවිශේෂී වන ආකාරය අනුව ඒවා වර්ග කිරීමට ද අධිකාරිය කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීමට අධිකාරිය 2019 වසරේදී දායකත්වය ලබා දෙන අතර අධිකාරිය එහි වැඩසටහන්වලට ප්‍රතිපත්තිමය පසුබිමට සාධනීය වන ලෙස ප්‍රකාශිත ප්‍රතිපත්තියට එකඟ වන වැඩසටහන් හඳුනාගෙන තිබේ.

### අවදානම් කළමනාකරණය

පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සහ බලශක්ති නාස්තිය අවම කිරීම අධිකාරිය මූලික ක්ෂේත්‍ර ලෙස සලකයි. පොසිල ඉන්ධන මිල අඩුවීමේ ප්‍රධාන අවදානම් හඳුනාගැනීමට ද පියවර ගැනේ. මෙය පුනර්ජනනීය බලශක්තිය වෙනුවට ඇති ඉතා ලාභ විලක්පයක් බවට පත්වීමේ අවදානමක් ඇති අතර භාවිතා කරන්නන් අතින් බලශක්තිය අපතේ යෑමට ද එය හේතු විය හැකි ය.

ඒ අනුව පොසිල ඉන්ධන මිල පහළ මට්ටමක පවතින තත්ත්වයක වුවද තිරසාර බලශක්ති සේවාවන්ට ඇති ඉල්ලුම අහිමි නොවන පරිදි අවම පිරිවැය තත්වයක් දක්වා තිරසාර බලශක්ති වෙළෙඳපොළ පරිවර්තනය කිරීමේ අරමුණෙන් අවදානම් කළමනාකරණ ක්‍රමෝපායක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අනුගමනය කරනු ලැබේ. සැලකිය යුතු ධාරිතාවක් එකතු කරගැනීම සඳහා ප්‍රවේශයන් කිහිපයකින් පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල සහාය ලබාදෙයි.

පියැසි මත සූර්ය පැනල ඉදි කිරීමේ කර්මාන්තයේ තරගකාරීත්වය දිරිගැන්වීම සඳහා නව සමාගම් විශාල සංඛ්‍යාවකට සේවා සම්පාදකයන් ලෙස එකතුවීමට අවස්ථාව සලසමින් සූර්ය බලශක්ති කර්මාන්තය පෝෂණය කරන ලදී. සූර්යාලෝකයෙන් විදුලිය උත්පාදනය කරගැනීමේ මිල තරගකාරී තත්ත්වයකට පත් කර ගැනීමට එය ඉවහල් විණ. ඒ හා සමානවම, බලශක්ති සේවා සපයන සමාගම් පෝෂණය කෙරිණ; ඒවාට සහාය ලබාදෙන ලදී. විදුලිය සහ පොසිල ඉන්ධනවල මිල පහළ මට්ටමක පැවැතිය ද මෙම සමාගම්වලට, කර්මාන්තයට සහ ආර්ථිකයට බලශක්ති කාර්යක්ෂමතා සේවා සැපයුම අඛණ්ඩව ම සිදුකළ හැකිව තිබේ.

පාරිභෝගික බදු සහ උත්පාදන පිරිවැය වැඩිවීම නිසා විදුලිය කර්මාන්තයට සැලකිය යුතු අලාභයක් සිදුවෙමින් පවතින අතර එය මුදල් ප්‍රවාහයෙහි අර්බුධයක් ඇති කිරීමට ද හේතුවක් වී ඇත. පුනර්ජනනීය බලශක්ති කර්මාන්තයට මෙම වර්ධනයන් අහිතකර ලෙස බලපාන අතර එමඟින් කර්මාන්තයට අන් කවරදාකටත් වඩා සැලකිය යුතු තරමේ අවදානමට මුහුණ දීමට සිදු වේ.

### සම්පත් අහිමි වීමේ අවදානම

රටෙහි අගනා පුනර්ජනනීය බලශක්ති සම්පත්වලට, ඉඩම් පරිහරණය කිරීමේ රටාව වෙනස්වීම සහ මානව ක්‍රියාකාරකම් අහිතකර අන්දමෙන් බලපා තිබේ. ජනාවාස ව්‍යාප්තවීම හේතුවෙන් එළදායි සුළං බලශක්ති සම්පත අනූන බිම් විශාල ප්‍රමාණයක් අහිමි වී ඇත. වන විනාශය හේතුවෙන් ගංගාවල ජල පෝෂක ප්‍රදේශවලට අයහපත් බලපෑම් එල්ල වී තිබේ. අතීතයේ විශිෂ්ට ජල ප්‍රවාහ බව පෙන්නුම් කළ ද ජල විදුලි බල සම්පත් අක්‍රමවත් බවක් පෙන්නුම් කරන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. දේශගුණික විපර්යාසවල සෘජු ප්‍රතිඵල, වාණිජ වගාවන් ව්‍යාප්ත වීම, වර්ෂාපතන රටාවන් වෙනස්වීම එම අක්‍රමවත් බවට තවදුරටත් හේතු වී ඇත. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට එරෙහිව සිවිල් සමාජ සංවිධාන ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග වැඩිවීම ද මෙම ස්වභාවික හේතූන් සමඟ මිශ්‍ර වී තිබේ. 2023 වසරේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගඋත්තරකරුවකු බව දක්වමින් නඩු 14ක් ගොනු කර තිබිණ. එළදායී පුනර්ජනනීය බලශක්ති සම්පත් දැඩි ලෙස අහිමි වී යෑමට එවැනි පියවර හේතු වී ඇත.

### බලශක්ති සේවාවන්හි මිල පහළ මට්ටමක පැවතීමේ අවදානම

විදුලිය මිල 2014 වසරේදී 25%කින් අඩු කරන ලද අතර එය බලශක්ති සේවා කර්මාන්තයට බලපෑවේ ය. කර්මාන්ත අංශය සඳහා ද දිවා කාලයේදී ඉතා අඩු බදු පනවමින් නිෂ්පාදන පිරිවැය අඩු කරන ලදී. මේ නිසා බලශක්ති නාස්තිය අඩු කිරීමට ඇති උනන්දුව හීන වී ගියේ ය. බලශක්ති සේවා අංශයේ සැලකිය යුතු වෙළඳපොළ හැකිලීමකට එය හේතු විණ. කාර්මික තාපන අවශ්‍යතා සඳහා පොසිල ඉන්ධන යොදා ගැනීම අඩු මට්ටමක පැවතීම නිසා ද මෙකී ගැටලුව ඉස්මතු විණ. එසේ වුවද ආයතනික පරිශීලකයෝ සීමිත පිරිසක්, මහා පරිමාණයෙන් බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිවල නිරත වෙමින් කාබන් විමෝචනය අවම කරගැනීමටත් මෙහෙයුම් පිරිවැය අඩු කරගැනීමටත් සමත් වූහ. එමඟින් සැලකිය යුතු ප්‍රතිලාභ ලබා ගනිමින් ඔවුහු තිරසාර ඉලක්ක හඹා ගියහ.

### අවදානම් නිරීක්ෂණය සහ සමාලෝචනය

අධිකාරියේ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් පවතින්නේ ද යන්න සහ ඒවායෙහි ක්‍රියාකාරිත්වය කාලීන සමාලෝචනයකට ලක් කෙරෙන අතර අදාළ පාලන යාන්ත්‍රණයන්හි දුර්වලතා හඳුනාගෙන අවශ්‍ය අභ්‍යන්තර සහ බාහිර වෙනස්කම් සිදු කිරීම එහි අරමුණයි. සිදු කෙරෙමින් පවතින අධීක්ෂණ කටයුතුවල හෝ වෙනම සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල අගැයීම් කටයුතු හෝ සම්බන්ධයෙන් අවසන් වගකීම දරන්නේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ විගණන හා කළමනාකරණ කමිටුව ය. අධිකාරියෙහි විවිධ සේවා සැපයුම් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් පද්ධති පාදක විගණන කටයුතු සිදු කිරීමේ කාර්යය අභ්‍යන්තර විගණක සිදු කරයි. අධිකාරයෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වාර්ෂිකව සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබේ.

# සංවිධානයේ ව්‍යුහය




නියෝජ්‍ය අධ්‍යක්ෂවරු / සහකාර අධ්‍යක්ෂකවරු

කනිෂ්ඨ කළමනාකරුවන් (තාක්ෂණික / තාක්ෂණික නොවන)

කළමනාකරණ සහයකයන් (තාක්ෂණික / තාක්ෂණික නොවන)

ක්ෂේත්‍ර සහායකයන් (රියදුරන්) / කාර්යාලීය කාර්යය සහායකයන් / කම්කරුවන්

# ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රධාන අංශ

වැඩසටහන්, අංශ එකොළහක් යටතේ ක්‍රියාත්මක කෙරේ. මූල්‍ය, තොරතුරු කළමනාකරණ සහ පරිපාලන හා මානව සම්පත් යන තවත් අංශ තුනක සහාය ද ඊට ලැබෙයි.

| අංශය | අංශය |
|---|---|
| පර්යේෂණ හා සංවර්ධන | තිරසාර බලශක්ති තාක්‍ෂණ සංවර්ධනය සහ ජාතික පරිමාණයේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |
| අරමුදල් සම්පාදනය | සංවර්ධන හවුල්කරුවන් සහ අරමුදල් සපයන්නන් සමඟ සම්බන්ධ වී තිරසාර බලශක්ති ව්‍යාපාර සඳහා ආයෝජන සහ ණය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම |
| සම්පත් අනුරූපකරණය | සියලුම පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සම්බන්ධ ගවේෂණය, තක්සේරු කිරීම සහ පිහිටි භූමි හඳුනාගැනීම |
| සම්පත් සංවර්ධනය සහ පහසුකම් සැපයීම | ව්‍යාපෘති සංවර්ධකයින් සහ අදාළ ව්‍යවස්ථාපිත ආයතන සමඟ සම්බන්ධ වී පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම |
| පුනර්ජනනීය බලශක්ති සේවා | කුඩා පරිමාණ විදුලි උත්පාදන ඒකක විශාල සංඛ්‍යාවක ව්‍යවසායකයින් සහ සේවා සපයන්නන් සම්බන්ධ කර ගැනීම |
| සමීක්ෂණ සහ පර්යේෂණ | තිරසාර බලශක්ති සංවර්ධනයට අදාළ ක්ෂේත්‍ර විමර්ශන සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම |
| පද්ධති සහ සැලසුම් | මහා පරිමාණ වෙළෙඳපොළ පරිවර්තනයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික පරිමාණ මැදිහත්වීම් සහ ඒකාබද්ධ යෝජනා ක්‍රම සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම |
| කර්මාන්ත සහ සේවා අංශය | මහා පරිමාණ බලශක්ති පරිශීලක ක්ෂේත්‍රවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| ගෘහ, කෘෂිකර්ම, සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ | උපකරණ බලශක්ති කාර්යක්ෂමතා වැඩසටහන ඇතුළුව කුඩා පරිමාණ බලශක්ති පරිශීලකයන්ගේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| ප්‍රතිපත්ති උපදේශන සේවා | ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපාය මාර්ග විශ්ලේෂණය සහ සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා බලශක්ති තුලනය සම්පාදනය කිරීම ඇතුළුව ජාතික බලශක්ති තොරතුරු කළමනාකරණය කිරීම |
| ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය | රටේ ක්‍රියාත්මක කර ඇති තිරසාර බලශක්ති වැඩසටහන් සඳහා සියලුම පුරවැසියන් සහ බලශක්ති භාවිත කරන්නන් සම්බන්ධ කර ගැනීම |
| පරිපාලන හා මානව සම්පත් අංශය | සියලුම පරිපාලන කටයුතු, මානව සම්පත් කළමනාකරණය සහ උපකාරක සේවා |
| මූල්‍ය අංශය | විචක්ෂණශීලීව ක්‍රියා කරමින් අධිකාරියේ මූල්‍යයේ අංශයේ සියලු කටයුතු පාලනය කිරීම |

# ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2023.12.31 දිනට අනුමත සහ තත්‍ය සේවක සංඛ්‍යාව

| නිල නාමය / තනතුර | වැටුප් කේතය | මට්ටම | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුරුවල සිටින මුළු සංඛ්‍යාව | පුරප්පාඩු වී ඇති මුළු තනතුරු ගණන |
|---|---|---|---|---|---|
| **ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්** | | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | HM2-3 | ජ්‍යේෂ්ඨ | 01 | 01 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | HM2-1 | ජ්‍යේෂ්ඨ | 02 | 02 | - |
| අධ්‍යක්ෂ | HM1-1 | ජ්‍යේෂ්ඨ | 14 | 11 | 03 |
| **මධ්‍යම කළමනාකරුවන්**<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂක | MM1-1 | ජ්‍යේෂ්ඨ | 48 | 26 | 22 |
| **කණිෂ්ඨ කළමනාකරුවන්**<br>විගණන නිලධාරී 01/ සංඛ්‍යාන නිලධාරී 01/ ප්‍රසම්පාදන නිලධාරී 01/<br>පරිපාලන නිලධාරී 01/ මූල්‍ය නිලධාරී 01/<br>ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී 01/ GIS නිලධාරී 02/<br>ඉඩම් අත්පත් කරගැනීමේ නිලධාරී 01/ මාධ්‍ය නිලධාරී 01/<br>පර්යේෂණ සහ අනුරූප නිලධාරී 01 | JM 1-2 | තෘතීක | 11 | 09 | 02 |
| **කළමනාකරණ සහකාර**<br>තාක්ෂණික සහකාර | MA2-2 | ද්විතික | 17 | 04 | 13 |
| **කළමනාකරන සහකාර**<br>කළමනාකරන සහකාර | MA1-2 | ද්විතික | 27 | 14 | 13 |
| **ප්‍රාථමික මට්ටම - පුහුණු**<br>ක්ෂේත්‍ර සහායකයන් | PL-3 | ප්‍රාථමික | 20 | 13 | 07 |
| **ප්‍රාථමික මට්ටම - නුපුහුණු**<br>කාර්යාලීය සහයක / කම්කරු | PL-1 | ප්‍රාථමික | 20 | 13 | 07 |
| **මුළු ගණන** | | | **160** | **93** | **67** |

# කාර්යය මණ්ඩලයේ සංයුතිය




### ජ්‍යේෂ්ඨ මට්ටමේ සංයුතිය







# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ප්‍රධාන අංශ දෙකක් හරහා සිය වැඩසටහන් මෙහෙයවයි: සැපයුම් පාර්ශ්වීය කළමනාකරණය සහ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය යනු එම උපාය මාර්ග දෙක ය. සැපයුම් පාර්ශ්වීය ක්‍රියාකාරකම්වල අරමුණ වන්නේ සම්පත් බෙදා වෙන් කිරීම වැඩි කිරීම සහ ජාතික පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහනට සහාය වීමයි. මෙම වැඩසටහන පැරිස් සම්මුතිය සමඟ සහ අපගේ ජාතික පුනර්ජනනීය බලශක්ති න්‍යාය පත්‍රය මගින් සකසා ඇති ඉලක්ක සමඟ සමපාත වේ. අනෙක් අතට, ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණ ක්‍රියාකාරකම් මගින් කාර්යක්‍ෂමතාව වැඩිදියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් බලශක්ති සංරක්ෂණ කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙම ප්‍රයත්නයන්ට විවිධ අංශවල බලශක්ති කාර්යක්‍ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ. බලශක්ති ක්ෂේත්‍රය තුල නියාමන මාර්ගෝපදේශයන් නියම කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්‍ෂනය කිරීමට අදාළ කටයුතු සැපයුම් පාර්ශවීය කළමණාකරන සහ ඉල්ලුම් පාර්ශවීය කළමණාකරන යන දෙඅංශයම මඟින් සිදු කරනු ලබයි. මෙයට අමතරව, මෙම දෙඅංශයම මගින් දැනුවත් කිරීමේ වැඩසටහන්, පර්යේෂණ සහ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක මඟින් ක්ෂේත්‍රයේ වර්ධනයට දායකත්වය සපයනු ලැබේ. එසේ කිරීමෙන්, ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව, ජාතියේ අනාගත බලශක්ති ඉලක්ක සහ බලශක්ති කර්මාන්තයේ තිරසාරභාවය සඳහා සිය පාර්ශ්වකරුවන් කටයුතු කරන බව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහතික කරයි.

## 2. කාර්ය සාධනය - 2023

### 2.1 සැපයුම් පාර්ශ්වීය කළමනාකරණ ක්‍රියාකාරකම්

සැපයුම් පාර්ශවීය කළමනාකරණ අංශයේ පරමාර්ථය වන්නේ බලශක්තිය සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සහ රටට ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් පුනර්ජනනිය බලශක්තිය සම්පත් තක්සේරු කිරීම සහ සංවර්ධන කිරීමයි. සම්පත් සිතියම් ගත කිරීම, පර්යේෂණ සහ සංවර්ධන, පුනර්ජනනීය බලශක්ති සේවා සහ සම්පත් සංවර්ධනය සහ පහසුකම් සැපයීම යන අංශයන්හි ව්‍යාපාති සහ වැඩසටහන් වල ප්‍රගතිය මෙම පරිච්ඡේදයෙන් සඳහන් කෙරේ.

#### 2.1.1 පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධනය

කුඩා පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක ව්‍යාපෘති සංවර්ධන චක්‍රයේ ඉතා වැදගත් ම සහ ප්‍රථම ක්‍රියාකාරකම වන්නේ, සම්පත් හඳුනාගැනීමයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම මත පදනම්ව ඉඩම් පිළිබඳව පුළුල් විශ්ලේෂණයක් සිදු කරන ලදී. 2023 - 2042 දිගුකාලීන උත්පාදන ව්‍යාප්ති සැලැස්මට අනුකූලව ඉදිරි කාලපරිච්ඡේදවල සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති හඳුනා ගැනිණි.පහත දැක්වෙන විශේෂිත ඉඩම් ලැයිස්තුව සඳහා 2023 දෙසැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. 2030 වන විට 70% ක විදුලිය උත්පාදනය කිරීමේ ජාතික පුනර්ජනනීය බලශක්ති ඉලක්කය සපුරාලීම සඳහා මෙගාවොට් 3,000 ක සූර්ය බලශක්ති ව්‍යාපෘති සහ මෙගාවොට් 1,000 සුළං බල ව්‍යාපෘති ඊට ඇතුළත් වේ.

##### 2.1.1.1 පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා හඳුනාගත් ඉඩම්

සූර්ය බලශක්ති සංවර්ධනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් මෙගාවොට් 3,000ක සූර්ය බලශක්ති ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අක්කර 19,500ක් හඳුනාගෙන ඇති අතර ඒ පිළිබඳ තොරතුරු පළමුවන වගුවෙන් දැක්වෙන අතර මෙගාවොට් 1,000 ක සුළං බලයක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉඩම් අක්කර 2,000 ක් පිළිබඳ තොරතුරු දෙවන වගුවෙන් නිරූපනය වේ.

**වගුව 1: සූර්ය බලශක්ති සංවර්ධනය සඳහා හඳුනාගත් ප්‍රදේශ පිළිබඳ සාරාංශය**

| ඉඩම් හිමිකාරීත්වය | මුළු ප්‍රමාණය (අක්කර) | යෝජිත මුළු ධාරිතාව (මෙගාවොට්) |
|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 3,185 | 650 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ඉඩම් පාදක ව්‍යාපෘති) | 1,275 | 260 |
| කර්මාන්ත අමාත්‍යංශය | 200 | 50 |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (ජලාශ) | 450 | 90 |
| මහවැලි (ජලාශ) | 12,611 | 2,524 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ජලාශ) | 1,979 | 396 |
| එකතුව | 19,500 | 3,920 |

**වගුව 2: සුළං බලශක්ති සංවර්ධනය සඳහා හඳුනාගත් ඉඩම්වල සාරාංශය**

| ඉඩම් හිමිකාරීත්වය | මුළු ප්‍රමාණය (අක්කර) | යෝජිත මුළු ධාරිතාව (මෙගාවොට්) |
|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1,544 | 772 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 310 | 155 |
| කර්මාන්ත අමාත්‍යංශය | 200 | 100 |
| එකතුව | 2,054 | 1,027 |

#### 2.1.2 ආයෝජනයට සූදානම් ජාතික උද්‍යාන ව්‍යාපෘති සංවර්ධනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සිදු කරනු ලබන මහා පරිමාණ ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල පූර්ව සංවර්ධන ක්‍රියාකාරකම් වගුවේ දක්වා ඇත. එම ව්‍යාපෘතිවලින් උත්පාදනය කෙරෙන ධාරිතාව මෙගාවොට් 956 ක් පමණ වේ. ඉලක්කගත උත්පාදනය ගිගාවොට් පැය 3,373 කි. පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිවලින් කෙරෙන දායකත්වය සහ ඒවායේ වර්තමාන ප්‍රගතිය වගුව 3 මගින් නිරූපණය කෙරේ.

**වගුව 3 ජාතික බලශක්ති උද්‍යාන සාරාංශය**

| විස්තරය | පුනරින් | මන්නාරම | සියඹලා-න්ඩුව | වෙරවිල් | කරච්චි |
|---|---|---|---|---|---|
| තාක්ෂණය | සුලං | සුලං | සූර්ය | සුලං | සුලං |
| ධාරිතාවය (මෙගා වොට්) | 234 | 250 | 100 | 210 | 162 |
| වාර්ෂික විදුලි උත්පාදනය (ගිගා වෝට්) | 807 | 991 | 180 | 786 | 609 |
| වාර්ෂික කාබන් ඩයොක්සයිඩ් විමෝෂණ ඉතිරිය (ටොන්) | 588,948 | 723,181 | 131,364 | 573,622 | 444,361 |
| වාර්ෂික ඉන්දන ඉතිරිය (මිලියන් ලීටර්) | 201.7 | 247.7 | 45.0 | 196.5 | 152.2 |
| ජාලගත කිරීමට අපේක්ෂිත වසර | 2026 | 2026 | 2025 | 2027 | 2027 |

##### 2.1.2.1 පුනරීන් සුළං - සූර්ය දෙමුහුම් බලශක්ති උද්‍යානය

උතුරු පළාත තුළ විශේෂයෙන් වෙරළබඩ ප්‍රදේශවල විශිෂ්ට සුළං බල විභවයක් පවතී. පුනරීන් ප්‍රදේශය මහා පරිමාණ සූර්ය - සුළං දෙමුහුම් බලශක්ති ව්‍යාපෘතියක් සඳහා හඳුනාගෙන ඇත. යෝජිත පුනරීන් සුළං සහ සූර්ය දෙමුහුම් බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිය, පුනර්ජනනීය බලශක්තිය පදනම් කර ගත් බලශක්ති උත්පාදන විශාලත ම ව්‍යාපෘතිය වනු ඇත. එය මෙගාවොට් 100ක සුළං බල ව්‍යාපෘතියකින් (අදියර 1), මෙගාවොට් 134ක සුළං බල ව්‍යාපෘතියකින් (අදියර 11) සහ මෙගාවොට් 150ක සූර්ය බල ව්‍යාපෘතියකින් (අදියර 111) සමන්විත ය. ව්‍යාපෘති භූමිය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, යාපනය කලපුවට දෙසට වූ පටු බිම් තීරුවක් වන පුනරීන් අර්ධද්වීපයේ පිහිටා ඇත. මෙම ව්‍යාපෘතියේ සුළං බල ධාරිතාව 2026 දී ලබාදීමට බලාපොරොත්තු වේ.

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය



රූපය 1 - පුනරින් සූර්ය - සුළං දෙමුහුම් බලශක්ති උද්‍යානය

### 2.1.2.2 සියඹලාණ්ඩුව මෙගා වොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය

උද්‍යාන සංකල්ප ව්‍යාපෘති යටතේ ප්‍රථමවරට ආරම්භ කෙරුණේ සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බලශක්ති ව්‍යාපෘතියයි. එය 2018 වසරේ සිට සක්‍රිය මට්ටමෙන් ප්‍රගතිය අත්පත් කරගනිමින් ඇත. මෙම ව්‍යාපෘතියෙන් වාර්ෂිකව ගිගාවොට් පැය 180ක පිවිතුරු විදුලිය ධාරිතාවක් ජනනය කිරීමට බලාපොරොත්තු වේ. එමගින් පරිසරයට ධනාත්මක බලපෑමක් ඇති කෙරේ. වාර්ෂිකව පරිසරයට විමෝචනය කෙරෙන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 131,364 කින් පමණ අඩු කිරීමට මෙම බලාගාරය හේතු වේ. මෙයට අමතරව, වාර්ෂිකව ලීටර් මිලියන 45 ක ඉන්ධන ප්‍රමාණයක් ඉතිරියක් කර ගැනීමටත් මෙම බලාගාරය නිසා පුළුවන. මෙම සංඛ්‍යාවන් ගණනය කර තිබෙන්නේ විදුලිබල පද්ධතියේ විමෝචන සාධකය කිලෝවොට් පැයට කාබන්ඩයොක්සයිඩ් කිලෝග්‍රෑම් 0.7298 (0.7298kg $CO_2$/kWh) වශයෙන් ද කිලෝවොට් පැයකට ඩීසල් ලීටර් 4ක ඉතිරියක් සිදු වන්නේ යැයි ද උපකල්පනය කිරීමෙනි. හරිත හා තිරසාර අනාගතයක් කරා සංක්‍රමණය වීමේදී සූර්ය බලශක්ති විභවය සියඹලාණ්ඩුව සූර්ය ව්‍යාපෘතිය මගින් නිදර්ශනය කෙරේ.



රූපය 2: සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය

### 2.1.2.3 මන්නාරම දෙවන අදියර මෙගාවොට් 250 ක ධාරිතා-වයකින් යුත් සුළං බල ව්‍යාපෘතිය

කල්පිටිය අර්ධද්වීපයේ සිට මන්නාරම දූපත දක්වා වයඹ වෙරළබඩ කලාපයේ සැලකිය යුතු සුළං සම්පත් විභවයක් ඇත. එය සැලකිල්ලට ගනිමින්, දිගුකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්ම යටතේ රටේ උතුරු සහ වයඹ වෙරළ තීරයෙන් මෙගාවොට් 2,000 ක් පමණ ජනනය කර ගැනීමට බලාපොරොත්තු වේ. (ලංකා විදුලිබල මණ්ඩලය, දිගු කාලීන උත්පාදන ව්‍යාප්ති සැලැස්ම 2022 - 2041හි කෙටුම්පත) එහිදී මන්නාරම දූපතට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ.
මන්නාරම දෙවන අදියර සුළං බලාගාර ව්‍යාපෘතිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කෙරේ. එහි ධාරිතාව මෙගාවොට් 250ක් වන අතර, එය මෙගාවොට් 5.2ක බැගින් වූ ධාරිතාවයෙන් යුත් ටර්බයින 55කින් සමන්විත වේ. ඇස්තමේන්තුගත වාර්ෂික විදුලි උත්පාදනය ගිගාවොට් පැය 991 ක් පමණ වේ.



රූපය 3: මන්නාරම දෙවන අදියර සුළං බල ව්‍යාපෘති ස්ථානය

### 2.1.2.4 වේරවිල් සුළං බල උද්‍යානය

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වෙරවිල් හි මෙගාවොට් 210ක සුළං බල උද්‍යාන ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සැලසුම් කරයි. ගෝලීය සුළං බල සිතියමෙහි දත්ත මත පදනම්ව, පූර්ව ශක්‍යතා අධ්‍යයනයකින් පෙන්නුම් කෙරෙන්නේ මෙම කලාපයේ මෙගාවොට් 210 ක බලශක්ති උත්පාදනයක් සිදු කළ හැකි බවයි. ඒ අනුව ඇස්තමේන්තුගත වාර්ෂික බලශක්ති උත්පාදනය ගිගාවොට් පැය 786 ක් පමණ වේ. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ඒජන්සියේ ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහනේ තාක්ෂණික සහාය මත මෙම ව්‍යාපෘතියේ කුරුළු අධ්‍යයනය සහ පාරිසරික බලපෑම් තක්සේරුව සිදු කරන ලදී.



රූපය 4: වේරවිල් සුළං බල ව්‍යාපෘතිය පිහිටීමට අපේක්ෂිත ස්ථානය

### 2.1.2.5 කරච්චි සුළං - සූර්ය දෙමුහුම් බලශක්ති උද්‍යානය

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රදේශයේ සුළං - සූර්ය දෙමුහුම් බලශක්ති ව්‍යාපෘතියක් සඳහා වෙන් කරන ලදී. මෙම කලාපයෙන් මෙගාවොට් 162 ක සුළං බල ධාරිතාවක් ලබා ගත හැකි බවට තීරණය කර ඇත. එනිසා වාර්ෂිකව දළ වශයෙන් ගිගාවොට් පැය 606 ක විදුලි උත්පාදනයක් සිදුකර ගත හැකි වේ. ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය 2023 වසරේදී ආරම්භ කරන ලදී.



රූපය 5: කරච්චි සුළං බල ව්‍යාපෘතිය ස්ථාපනය කෙරෙන ස්ථානය

### 2.1.3 පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති

### 2.1.3.1 කිරිඉබ්බන් වැව සහ චන්ද්‍රිකා වැව පාවෙන සූර්ය බල ව්‍යාපෘති

කිරිඉබ්බන් වැව සහ චන්ද්‍රිකා වැව මත මෙගාවොට් 1ක බැගින් වූ පාවෙන සූර්ය බල පද්ධති ඉදි කිරීම සඳහා දළ වශයෙන් දකුණු කොරියා වොන් බිලියන 14.3 ක් සහ දකුණු කොරියාවේ වොන් බිලියන 6.83ක් ප්‍රදානය කිරීමට දකුණු කොරියාවේ වෙළෙඳ, කර්මාන්ත සහ බලශක්ති අමාත්‍යාංශය එකඟ වී ඇත. ව්‍යාපෘතිය සඳහා අනුමැතින් ලබාගැනීමේ ක්‍රියාවලිය 2023 වසරේදී අවසන් විය.

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය







රූපය 6: රජයන් දෙක අතර ගිවිසුම් අත්සන් කිරීම

### 2.1.3.2 යාපනයේ කුඩා දූපත් තුනක දෙමුහුම් පුනර්ජනනීය බලශක්ති පද්ධතියක් ඉදිකිරීම

යාපනයේ අනලතිව්, ඩෙල්ෆ් සහ නයිනතිව් යන දූපත් තුනේ දෙමුහුම් බලාගාර ඉදි කිරීම සඳහා ඉන්දීය රජය ප්‍රදානයක් ලබා දෙන අතර එම ව්‍යාපෘතිවලින් පවුල් 3000කට පමණ ප්‍රතිලාභ ලැබේ. කුඩා හුදකලා දූපත් තුනක වාසය කරන ග්‍රාමීය ප්‍රජාවට ක්ෂුද්‍ර ජාල පද්ධතියකින් (Micro-Grid System) එලදායී ලෙස බලශක්ති භාවිත කිරීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඉඩකඩ සැලසේ. දෙමුහුම් බල ශක්ති පද්ධතිය සඳහා සූර්ය බලය, සුළං බලය, ඩීසල් උත්පාදක යන්ත්‍රය සහ ලිතියම් - අයන බැටරි භාවිතා කෙරෙනු ඇත. ප්‍රශස්ත ජනන මිශ්‍රණයට අනුරූප වන බැටරි ගබඩාකරණය සහිත සූර්යය, සුළං සහ ඩීසල් ප්‍රභවයන්ගේ ධාරිතාව පහත පරිදි වේ.

**වගුව 5: ප්‍රශස්ත ජනන මිශ්‍රණයට අනුරූප වන බැටරි ගබඩාකරණය සහිත සූර්යය, සුළං සහ ඩීසල් ප්‍රභවයන්ගේ ධාරිතාව**

| දිවයින | ඩීසල් ජෙනරේටර | සූර්යය බල උත්පාදනය | සුළං බල උත්පාදනය | බැටරි ගබඩාකරණය |
|---|---|---|---|---|
| නයිනතිව් | 300 kW + 500 kW | 700 kW | 200 kW | 1000 kWh (550 kW) |
| අනලතිව් | 150 kW + 300 kW | 300 kW | 80 kW | 550 kWh (275 kW) |
| ඩෙල්ෆ් | 300 kW + 500 kW | 700 kW | 250 kW | 800h (650 kW) |

මෙම ව්‍යාපෘතිය විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියක් මගින් U-Solar Clean Energy (pvt) Ltd වෙත ලබා දෙන ලදී.

### 2.1.4 පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම

2023 දී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා වූ සිය කැපවීම අඛණ්ඩව සිදු කරන ලද අතර, නව පුනර්ජනනීය බලශක්ති මෙගාවොට් 1,699.4 ක සමුච්චිත ධාරිතාවක් ස්ථාපනය කිරීමට පහසුකම් සපයන ලදී. එය රටේ ස්ථාපිත ධාරිතාවයෙන් 34.3% ක නියෝජනයකි. මෙය පෙර වසරේ පුනර්ජනනීය බලශක්ති ධාරිතාව අභිබවා යෑමකි. පුනර්ජනනීය බලශක්ති අංශයේ වර්ධනය රූප සටහන 7 හි දැක් වේ.

2023 දී මෙගාවොට් 769 ක පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කරන ලදී. මෙගාවොට් 64.72 ක් සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කෙරිණ. මෙගාවොට් 299.15 ක් සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කරන ලදී. එසේ ම මෙගාවොට් 475.19 ක් සඳහා තාවකාලික අනුමැතිය නිකුත් කෙරිණ. එම විස්තර 6 වන වගුවේ දක්වා ඇත.




රූපය 7: සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සමුච්චිත ධාරිතා එකතුව

**වගුව 6: ව්‍යාපෘති පිළිබඳ විස්තර**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව මෙ.වො. | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව මෙ.වො. | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව මෙ.වො. | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව මෙ.වො. |
|---|---|---|---|---|---|---|---|---|
| කුඩා ජලවිදුලි බල | 8 | 19.10 | 03 | 3.15 | 09 | 10.82 | 02 | 5.40 |
| සුළං බල | 4 | 20.00 | 02 | 10.00 | 01 | 10.00 | 02 | 15 |
| සූර්යය බල | 12 | 436.09 | 17 | 286.00 | 03 | 24.50 | 08 | 09 |
| ජෛව ස්කන්ධ | - | - | - | - | 01 | 10.00 | - | - |
| කෘෂිකාර්මික/කාර්මික අපද්‍රව්‍යය | - | - | - | - | 2 | 6.00 | 1 | 4 |
| නාගරික ඝන අපද්‍රව්‍යය | - | - | -- | - | - | - | 1 | 10 |
| එකතුව | | 475.19 | | 299.15 | | 64.72 | | 33.40 |

### 2.1.5 පුනර්ජනනීය බලශක්ති සේවා

#### 2.1.5.1 සූර්ය බල සංග්‍රාමය




රූපය 8: පියැසි මත ඉදි කරන සූර්ය බල පද්ධතිවල වර්ධනය

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය

සූර්ය බල සංග්‍රාමය වැඩසටහන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ප්‍රමුඛත ම වේගවත් ඉදිරියට ගමන් කරන වැඩසටහනකි. එහි වර්ධනය රූප සටහන 8 හි දැක් වේ. 2018 වන විට, කුඩා පරිමාණ සූර්ය බල පද්ධති වේගවත්ව ව්‍යාප්ත වෙමින් තිබිණ. ඉන් ලැබෙන ධාරිතාව මෙගාවොට් 100 පසු කරමින් සන්ධිස්ථානයක් කරා ළඟා විණ. ජාතික විදුලිබල පද්ධතියට සූර්ය බලශක්තිය ඒකාබද්ධ කිරීම යෝජනා ක්‍රම 3 යටතේ, එනම් ශුද්ධ මිනුම්කරණය, ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් යන අංශවලින් සිදු කෙරේ. පියැසි මත ඉදි කරන සූර්ය බල පද්ධති මගින් මෙගාවොට් 816 කට වඩා සමුච්චිත ධාරිතාවක් ලබා ගැනීමට හැකි වී ඇත. එකී මෙගාවොට් 156 ක නව පියැසි සූර්ය පද්ධති ද 2023 වසරේදී එකතු විණ. තාක්ෂණික විශේෂඥතාව ඉහළ නැංවීම සඳහා, තාක්ෂණ නිලධාරීන් 600 දෙනෙකු එක්දින පුහුණු වැඩසටහනකින් පුහුණු කෙරිණ. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ එක්ව 90 දෙනෙකු ද පුහුණු කෙරිණ. ඔවුහු තෙවන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලදහ.

### 2.1.5.2 ඉන්දීය ණය වැඩපිළිවෙල යටතේ ඉදි කෙරෙන මෙගාවොට් 135 සූර්ය බලාගාර

ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්ති සංවර්ධනයේ ප්‍රගතියට සහාය වීම සඳහා ඉන්දීය රජය, ඉන්දියානු එක්සිම් බැංකුව හරහා ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ණය පහසුකම් ලබා දී ඇත.

මෙම වැඩසටහන යටතේ, 2023 දී, රජයේ ගොඩනැගිලිවල මෙගාවොට් 80 ක සූර්ය බල පද්ධති ස්ථාපනයටත්, අඩු ආදායම්ලාභී නිවාසවලට මෙගාවොට් 50 ක බැටරි ගබඩාකරණය සහිත සූර්ය බල පද්ධති පියැසි මත ස්ථාපනයටත්, මෙගාවොට් 50 ක සූර්ය බල පද්ධති ආගමික ආයතනවල පියැසි මත ඉදිකිරීමටත් ආධාර ලබා දී තිබේ. ස්ථානවලින් 86% ක් (4098) සමීක්ෂණය කර ඇති අතර උපදේශක කණ්ඩායම් විසින් සවිස්තරාත්මක වාර්තා සකස් කර ඇත.

### 2.1.6 පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ධාරිතා සංවර්ධනය

යුරෝපා සංගමයේ අරමුදල් සහිත 'ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ සඳහා පුහුණු මධ්‍යස්ථාන' ව්‍යාපෘතියේ සහාය ඇතිව විශ්ව විද්‍යාල පහක පුනර්ජනනීය බලශක්ති පුහුණු පහසුකම් ස්ථාපිත කෙරිණ. කාර්මික ශිල්පීන්, ඉංජිනේරුවන් සහ ව්‍යාපෘති කළමනාකරුවන් සඳහා පුනර්ජනනීය බලශක්ති පාඨමාලා සංවර්ධනය කිරීමට හවුල්කාර සංවිධානයක් ලෙස ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය දායකත්වය ලබා දුන්නේ ය.

එම ව්‍යාපෘතියේ ම පහසුකම් පුළුල් කරමින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ තෙවන මට්ටමේ සහ සිව් වන මට්ටම් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සමඟ ජාතික නිපුණතා ප්‍රමිතීන් සකස් කරන ලදී. සුළං බල තාක්ෂණ ශිල්පීන් වෙනුවෙන් වැඩමුළුවක් ද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් පවත්වන ලදී. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වැනි ආයතනවලින් ද නවක සිසුන් සඳහා පාඨමාලාව 2024 සිට ඉදිරිපත් කෙරේ. හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය පිළිගත් පුහුණු මධ්‍යස්ථානයේදී පූර්ව දැනුම පරීක්ෂා කිරීම මගින් සූර්ය බලශක්ති තාක්ෂණ ශිල්පීන් වෙත යෝග්‍යතා සහතික කරන ලදී. සූර්ය බලශක්ති කාර්මික ශිල්පීන්ට පුහුණුව ලබාදීම සඳහා දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 13ක් පිහිටුවා ඇත.









රූපය 9: පියැසි මත සූර්ය බල පද්ධති ස්ථාපනය පිළිබඳ පුහුණු වැඩසටහන්

පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් පිළිබඳ පුහුණු වැඩසටහන් භෞතික හා මාර්ගගතව අඛණ්ඩව පවත්වන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයේදී ආරාධිත දේශන කිහිපයක් ද පැවැත් විණ.



රූපය 10: පුනර්ජනනීය බලශක්ති පුහුණු වැඩසටහන්

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය

## 2.2 ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණ ක්‍රියාකාරකම්

### 2.2.1 බලශක්ති දත්ත සහ තොරතුරු

ශ්‍රී ලංකා ජාතික බලශක්ති තුලනය, බලශක්ති අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු කරන වාර්ෂික ප්‍රකාශනයකි. යම් වර්ෂයක බලශක්ති නිෂ්පාදනය, සංරක්ෂණය සහ පරිභෝජනය එමගින් සිතියම්ගත කෙරේ. බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන කොටස්කරුවන් වන විදුලි උපයෝගිතා, ඛනිජ තෙල් ආයතන, LP ගෑස් ආයතන ඇතුළු අනෙකුත් සංවිධානවලින් දත්ත රැස් කිරීම මගින් එය සම්පූර්ණ කරනු ලැබේ. ඒ අනුව ප්‍රකාශයට පත් කෙරෙන දත්ත, දත්ත විශ්ලේෂණයට, සැසඳීම්වලට සහ ඉල්ලුම පුරෝකථනය කිරීමට වැදගත් වේ.

2023 වසරේදී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා වූ ජාතික බලශක්ති තුලනය ප්‍රකාශයට පත් කරන ලදී. ජාතික බලශක්ති තුලනය - 2021 මුද්‍රණය කිරීමේ අදියරේ පවතින අතර, 2022 වාර්තාව සඳහා දත්ත ඇතුළත් කිරීම මේ වනවිට සම්පූර්ණ කෙරෙමින් පවතී.

### 2.2.2 බලශක්ති කළමනාකරණ පද්ධති පිහිටුවීම

#### 2.2.2.1 බලශක්ති කළමනාකරු සහ බලශක්ති විගණක වැඩසටහන

බලශක්ති කළමනාකරු/ බලශක්ති විගණක නියාමන වැඩසටහන් යටතේ කාර්මික සහ වාණිජ අංශවල අඛණ්ඩ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් පත් කරනු ලැබේ. ධාරිතාව ගොඩනැගීම, අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහාය යනාදිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සපයනු ලැබේ. බලශක්ති සේවා සමාගම්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇත. එම සමාගම් බලශක්ති විගණන සිදු කිරීමට සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වේ.

මිණුම් සලකුණු නියාමනය ක්‍රියාත්මක කිරීමෙන් පසු බලශක්ති විගණකයින් සඳහා ඉල්ලුම වැඩි විණ. එය සපුරාලීම සඳහා බලශක්ති විගණක ප්‍රතිතන යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ඒජන්සියේ ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන සමඟ සහයෝගයෙන් 2023 වසරේදී වැඩසටහන නැවත ගොඩනගන ලදී. ඊට සමගාමීව, යෝජිත යෝජනා ක්‍රමය පිළිබඳ කෙටුම්පත් සංකල්ප සටහනට බලශක්ති විගණකවරුන්ගෙන් අදහස් සහ යෝජනා ලබා ගැනීම සඳහා පාර්ශවකරුවන්ගේ උපදේශන සැසියක් පවත්වන ලදී.

මෙය සාර්ථකව නිම කිරීමෙන් පසු බලශක්ති කළමනාකරුවන් 250 ක්, පිළිගත් බලශක්ති විගණකවරුන් 24 ක් සහ බලශක්ති සේවා සමාගම් 30 ක් කාර්මික හා වාණිජ අංශවල බලශක්ති කළමනාකරණ කටයුතුවල යෙදවීමට අපේක්ෂා කෙරේ.

#### 2.2.2.2 බලශක්ති පරිභෝජන මිණුම් සලකුණු නියාමනය

තෝරාගත් ආර්ථික උප අංශවල බලශක්ති භාවිතය පිළිබඳව මිණුම් සලකුණු කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් රෙගුලාසියක් බලාත්මක කර ඇත. මූල්‍ය සේවාවල නියමිත උප අංශ සහ සුපිරි වෙළඳසැල් ලෙස වඩාත් හොඳින් හඳුන්වනු ලබන නිශ්චිත නොවන සිල්ලර විකුණුම් සමාගම් නියාමනය මගින් මුලදී ආවරණය කෙරේ. නියාමනය ක්‍රියාත්මක කිරීම සඳහා ඩිජිටල් වේදිකාවක් ලෙස සකසන ලද වෙබ් ද්වාරයකට (web portal) කාර්තුමය වශයෙන් දත්ත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. අවසාන පරිශීලකයන්ට බලශක්ති දත්ත ග්‍රහණ කරගැනීමට, දත්ත විශ්ලේෂණය කිරීමට සහ සමාන ආයතන අතර බලශක්ති කාර්ය සාධනය සංසන්දනය කිරීමට එමගින් පහසුකම් සැලසේ.




රූපය 11: සිල්ලර සහ මූල්‍ය අංශ සඳහා මිණුම් සලකුණු ද්වාරයකට විවෘත කළ අවස්ථාව

බලශක්ති මිණුම් සලකුණු පිළිබඳ අතිවිශේෂ ගැසට් පත්‍රය 2023 ජූලි 04 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ඒජන්සියේ ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහනේ සහාය ඇතිව ජාතික බලශක්ති මිණුම් සලකුණු ද්වාරය සංවර්ධනය කිරීම අවසන් කරන ලදී. වෙබ් ද්වාරයේ සංවර්ධකයා සුපිරි වෙළඳසැල් සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරීන් සඳහා බලශක්ති මිණුම් සලකුණු වෙබ් ද්වාරයෙ පිළිබඳ පුහුණුව පැවැත් වූයේ ය. ද්වාරය විවෘත කිරීම සහ බලශක්ති මිණුම් සලකුණු නියාමනය පිළිබඳව දැනුවත් කිරීමේ සැසිය 2023 සැප්තැම්බර් 14 දින පවත්වන ලදී. සුපිරි වෙළඳසැල් අලෙවිසැල් 45ක් ජාතික බලශක්ති මිණුම් සලකුණු ද්වාරයහි ලියාපදිංචි වී දත්ත වාර්තා කිරීම ආරම්භ කරන ලදී.

මිණුම් සලකුණු සහ බලශක්ති ඉතිරිකිරීම් පිළිබඳව කර්මාන්ත සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා සරල භාෂාවෙන් ලියැවුණු බලශක්ති ප්‍රකාශනයක් මුද්‍රණය කර ඇත. ඒ සඳහා JICA - JCP අරමුදල් මගින් ප්‍රතිපාදන සපයන ලදී.

#### 2.2.2.3 උපදේශන සහ උපදේශන සේවා

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය රජයේ සහ අනෙකුත් ආයතනවල ISO 50001 EnMS විගණන ඇතුළු බලශක්ති විගණන සහ උපදේශන සේවා සපයයි. එවැනි සේවාවක් සපයන්නේ බලශක්ති විගණනයක් සම්බන්ධීකරණය කිරීම සඳහා බලශක්ති සේවා සමාගම්වල සේවය ලබා ගැනීම ලාභදායී නොවන විට හෝ / සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ නොමැති විට එම ආයතන මගින් කරනු ලබන ඉල්ලීම් මත ය. ආයතන, උපදේශකයින්, වෘත්තිකයන්, බලශක්ති සේවා සමාගම් මෙන්ම බලශක්ති පරිභෝජන සංවිධානවල බලශක්ති මිනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ඉහළ මට්ටමේ උපකරණ බැංකුවක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පවත්වාගෙන යයි. බලශක්ති රාජ්‍ය අමාත්‍යවරයාගේ නිවෙසේ, වැලිකඩ මොබිටෙල් ඉංජිනේරු අංශයේ සහ මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ බලශක්ති විගණන 2023 වසරේදී සිදු කර විගණන වාර්තා ද අවසන් කරන ලදී. බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අවස්ථා හඳුනා ගැනීම සඳහා දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ වීදි ආලෝක පද්ධතිය විශ්ලේෂණය කෙරිණ. අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා බලශක්ති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර බලශක්ති විගණනයක් ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය සමඟ එක්ව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ බලශක්ති විගණනයක් සිදු කෙරිණ. ශ්‍රී ලංකා

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය

ප්‍රමිති ආයතනයේ බලශක්ති විගණනයක් සිදු කෙරෙමින් පවතී. බලශක්ති ලොගර් සහ උෂ්ණත්ව ලොගර් ක්‍රමාංකනය කිරීම සිදු කරන ලදී. ආසියා සංවර්ධන බැංකුවේ නියමු ව්‍යාපෘතියක් යටතේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ තැපැල් මූලස්ථානය යන ආයතනවල කාර්යක්ෂම මධ්‍යගත සිසිලන පද්ධති ස්ථාපනය කිරීම සිදු කෙරෙමින් පවතී. දළදා මාලිගාවේ සහ දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේදී සූර්ය බලශක්ති පද්ධති සැලසුම් කිරීම සඳහා උපදේශනයන් ලබා දෙන ලදී. නාලන්දා විද්‍යාලයේ බලශක්ති විගණනයක් ආරම්භ කරන ලද අතර සිසුන් දැනුවත් කිරීමේ සැසියක් ද පැවැත්වීමට හැකි විණ.



රූපය 12: බලශක්ති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන්

රාජ්‍ය ආයතන සහ අධි බලශක්ති පරිභෝජනයක් සහිත ආයතන ඉලක්ක කර ගනිමින් බලශක්ති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා බලශක්ති විගණනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට හැකි විණ.

### 2.2.3 සමීක්ෂණ සහ පර්යේෂණ

බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ සංරක්ෂණය කිරීම හෝ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහනක්, ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා, මූලික තත්ත්වය හඳුනා ගැනීම අවශ්‍ය වේ. මේ සඳහා සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම බෙහෙවින් ම වැදගත් ය. 2023 දී සිදු කරන ලද සමීක්ෂණ සහ පර්යේෂණ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් කිහිපයක් පහත සඳහන් වේ.

#### 2.2.3.1 සිසිලන යන්ත්‍ර සමීක්ෂණය

සිසිලන යන්ත්‍ර සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ රටට සිසිලන යන්ත්‍ර පිළිබඳ තොග ලේඛනයක් සකස් කිරීම, බලශක්ති භාවිතය හඳුනාගැනීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව හා අනෙකුත් බලශක්ති පරාමිතීන් හඳුනා ගැනීම, බලශක්ති ඉතිරිකිරීමේ විභවය හඳුනාගැනීම මෙන්ම පැරණි අකාර්යක්ෂම සිසිලන යන්ත්‍ර වෙනුවට නව කාර්යක්ෂම සිසිලන යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීමේ මූල්‍ය විශ්ලේෂණය ද සිදු කිරීමයි. උණුසුම් කිරීම, වාතාශ්‍රය ලබාදීම සහ සිසිලනය සිදු කෙරෙන පද්ධති සඳහා සැලකිය යුතු බලශක්ති ප්‍රමාණයක් අවශ්‍ය වේ. කිසියම් ආයතනයක බලශක්ති පරිභෝජනයෙන් වැඩි කොටසක් සිසිලන යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය සඳහා මේ නිසා යෙදෙ වේ. සිසිලන යන්ත්‍ර සමීක්ෂණය සඳහා කුරුණෑගල කර්මාන්ත සේවා කාර්යාංශය සේවා සපයයි. තවද, ඉතිරි අරමුදල් ලබා ගැනීම සඳහා ජාතික ඕසෝන් ඒකකය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. 2023 වසරේදී, මූලික මට්ටමේ බලශක්ති විගණන 100 ක් පවත්වන ලද අතර, වාර්තා ද සම්පූර්ණ කර ඇත. සවිස්තරාත්මක බලශක්ති විගණන 10 ක් පවත්වා ඇති අතර වාර්තා සකස් කෙරෙමින් තිබේ.

#### 2.2.3.2 කාර්යක්ෂම ශීතකරණ ප්‍රතිස්ථාපන වැඩසටහන (සිසිලසින් ඉතිරියක් වැඩසටහන)

පැරණි, අකාර්යක්ෂම ශීතකරණ, බලශක්ති කාර්යක්ෂම, අවම බලශක්ති කාර්ය සාධන ලේබලය සහිත (MEP ලේබලය සහිත) නව ශීතකරණ මගින් ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරුවන් වන්නේ ශීතකරණ වෙළඳුන් (සිංගර්, දමිරෝ සහ අබාන්ස්), පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අපද්‍රව්‍ය කළමනාකරණ සමාගම් (Recotel) සහ පොලියුරේතන් බැහැර කිරීම සඳහා වන INSEE වැනි ආයතනයන් ය.

සාමාන්‍ය නිවසක බලශක්ති සමතුලිතතාවයට අනුව, ශීතකරණයක් මගින් මුළු විදුලි පරිභෝජනයෙන් 50% ක් පමණ පරිභෝජනය කෙරේ. ඉන්වර්ටර් තාක්ෂණය, R600a වැනි පරිසර හිතකාමී ශීතකරණ වායු, උසස් පරිවාරක ක්‍රම සහ තිරසාර සංකල්ප වැනි බලශක්ති ඉතිරිකිරීමේ තාක්ෂණයන් හඳුන්වාදීමත් සමඟ පැරණි ශීතකරණ වෙනුවට නවීන ශීතකරණ භාවිතයට ගැනීම වඩාත් කාර්යක්ෂම ය. නවීන ශීතකරණවලින් පරිභෝජනය කෙරෙන්නේ ද අඩු ශක්තියක් ප්‍රමාණයකි. වසරකට කිලෝවොට් පැය 480,000 ක විදුලිය ඉතිරියක් මෙමගින් ඇස්තමේන්තු කර ඇත. එසේ ම එමගින් සාමාන්‍ය නිවෙසක විදුලි බිලෙන් දළ වශයෙන් 30% ක පමණ අඩුවීමක් සිදු වනු ඇතැයි ද ඇස්තමේන්තු කර තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන බලශක්ති පාරිභෝගිකයන් සිටින්නේ ගෘහස්ත අංශයෙහි ය.

කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අකාර්යක්ෂම පැරණි ශීතකරණ 1000ක් වෙනුවට නව කාර්යක්ෂමතාවයෙන් යුත් අවම බලශක්ති කාර්ය සාධන ලේබලය සහිත ශීතකරණ හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතිය බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කර ඇත. බලශක්ති පරිභෝජනය පරීක්ෂා කිරීමට කැමැත්ත පළ කර ඇති නිවෙස්වල ශීතකරණ සම්බන්ධයෙන් ස්ථානීය මිනුම් ද ලබාගෙන තිබේ. මෙම ව්‍යාපෘතිය සඳහා යොදාගෙන තිබෙන්නේ ලීටර් 190 - 250 ධාරිතාවකින් යුත් තනි දොර සහ ද්විත්ව දොර සහිත ගෘහස්ත වර්ගයේ ශීතකරණයන් ය. අදියර දෙකකින් මුළු රට ම ආවරණය වන පරිදි ව්‍යාප්ත පුළුල් කිරීමට බලාපොරොත්තු වේ. පළමු අදියර සමන්විත වන්නේ වසර පහක් ඇතුළත පැරණි, අකාර්යක්ෂම ඒකක 100,000ක් ඉවත් කිරීම ය. එමඟින් ගිගාවොට් පැය 169ක විදුලිය ඉතිරි කිරීමක් ඇස්තමේන්තු කර තිබේ. දෙවන අදියරයේදී වසර පහක් ඇතුළත පැරණි, අකාර්යක්ෂම ඒකක 500,000ක් ඉවත් කිරීමට අපේක්ෂා කෙරේ. එමඟින් ගිගාවොට් 500ක විදුලිය ධාරිතාවක් (ජාතික විදුලි පරිභෝජනයෙන් දළ වශයෙන් 3%ක්) ඉතිරි කර ගැනීමට ඇස්තමේන්තු කර ඇත.

පාර්ශවකරුවන් සමඟ රැස්වීම් මාලාවක් 2023 වසරේදී පැවැත්විණ. පත්‍රිකා සහ මාර්ගෝපදේශ පිටපත් 100 ක් මුද්‍රණය කරන ලදී. විදුලි මීටර් ( Plug-in ) 24 ක් මිලදී ගැනිණ. වෙළඳුන් සමඟ රැස්වීම් මාලාවක් පවත්වන ලද අතර විශේෂයෙන් ම සිංගර් ආයතනය එයට ඇතුළත් විණ. සිංගර් සහ අබාන්ස් ආයතනවලින් පාරිභෝගිකයන් 500 කගේ සහ නිවාස 150ක පමණ ලැයිස්තුවක් ලැබී තිබේ. අතුරු වාර්තාව සකස් කෙරී ඇත. නිවාස 143ක් සඳහා වාර්තාවක් සකස් කර තිබේ. නිවාස 190 ක් මේ වනවිට සමීක්ෂණය කර ඇත.

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය



රූපය 13(ශීතකරණ සඳහා ලේබල්කරණ වැඩසටහන සහ බලශක්ති කාර්යක්ෂම ශීතකරණ බෙදාහැරීමේ වැඩසටහන දියත් කිරීම

### 2.2.3.3 වීදි ආලෝකකරණය සඳහා සුදුසු තාක්ෂණයන් පිළිබඳ අධ්‍යයනය

ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශයේ වීදි ආලෝකකරණය සඳහා සුදුසු තාක්ෂණයන් පිළිබඳ අධ්‍යයනයක් විශේෂයෙන්ම ලංකා විදුලිය සමාගම සමග එක්ව ආරම්භ කරන ලදී.
2023 වසරේදී නුගේගොඩ සුපර් මාර්කට් ප්‍රදේශයේ වීදි ලාම්පු දාහතරක් ප්‍රතිස්ථාපනය කෙරිණ. දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ අකාර්යක්ෂම වීදි ලාම්පු ප්‍රතිස්ථාපනය කිරීම සහ දිවුලපිටිය ප්‍රාදේශීය සභාවෙහි නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන ලේඛන සකස් කරන ලදී. ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තු වේ. දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ ස්ථාන සමීක්ෂණ සිදු කර ඇත. ටෙන්ඩර් ලේඛන කෙටුම්පත් සකස් කර ඇත. දත්ත එක්රැස් කිරීම, වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඵලදායී ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කිරීම සහ ශ්‍රී ලංකාව තුළ පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම සමීක්ෂණ සහ පර්යේෂණ ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වේ. මෙම අධ්‍යයනයන්හි සොයාගැනීම් සහ නිර්දේශ රටෙහි තිරසාර බලශක්ති මූලාරම්භයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සහ සංවර්ධනයට දායක වනු ඇත.

### 2.2.4 පද්ධති සහ සැලසුම්

මහා පරිමාණ වෙළඳපොළ පරිවර්තනයක් ශාක්සාත් කර ගැනීම සඳහා ජාතික පරිමාන මැදිහත් වීම සහ ඒකාබන්ධ යෝජනාක්‍රම සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

### 2.2.4.1 බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ නීති සංග්‍රහය

ගොඩනැගිලි කාර්යක්ෂම බලශක්ති භාවිතය සහතික කිරීමේ සන්දර්භය තුල, 2009 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ නීති සංග්‍රය ගොඩනැගිලි ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ සහය ඇතිව සහ පසුව ලැබුණු මහජන අදහස් සැලකිල්ලට ගනිමින් සංශෝධනය කෙරිනි. නව සංස්කරණයේ 2021 වසරේදී සම්පාදනය කරන ලදී. අන්තර්ජාතික සංවර්ධනය සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ පත්කරන ලද විශේෂඥ කමිටුවක් සංශෝධනය කර සම්පාදනය කරන ලද ගොඩනැගිලි නීති සංග්‍රහය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත 2023 වසරේදී ඉදිරිපත් කරන ලදී. මෙම සංශෝධන ගොඩනැගිලි නීති සංග්‍රහයේදී මීලඟ සංස්කරණය ඇතුලත් කෙරේ. ගොඩනැගිලි සංග්‍රයේදී දෙවන කෙටුම්පත සකස්කර ඇත. නීති සංග්‍රය අනිවර්ය කිරීම සඳහ රෙගුලාසිය හඳුන්වාදීමට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අපි සාකච්චා කරමින් සිටින්නෙමි.

### 2.2.4.2 ප්‍රවාහන බලශක්තිය

දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම යටතේ යාවත්කාලීන කරන ලද ශ්‍රී ලංකාව ජාතිකව නිර්ණය කල දැයකත්ව නිර්ණායකයන්ට අනුකූලව ප්‍රවාහන ක්ෂේත්‍රයේ පොසිල ඉන්ධන පරිභෝජනය අඩු කිරීම මෙහි අරමුණයි. ඉහත කරුණු සපුරාලීම සඳහා වැඩසටහන් කිහිපයක් ආරම්භ කර ඇත. වාහනවල බලශක්ති ලේබල් කිරීම, පරිශීලක චර්යාවන් වැඩිදියුණු කිරීම, විද්‍යුත් සංචලතාව දිරිමත් කිරීම යනාදිය ඒ අතර ඇත. ඉන්ධන ඉතිරි කිරීම සඳහා මාර්ගෝපදේශයක් මෝටර් රථ පදවන්නන් සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2022දී හඳුන්වා දෙන ලදී. ඉන්ධන පිරිමැස්ම පිළිබඳව මෝටර් රථ රියදුරන් සඳහා දැනුවත් කිරීමේ වීඩියෝ පටයක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2023 වසරේදී නිර්මාණය කළේ ය. ඉන්ධන කාර්යක්ෂමතා ලේබල් කිරීමේ ප්‍රමිතිය සංවර්ධනය කිරීම සඳහා වාහන ලියාපදිංචිය පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් දත්ත ඉල්ලා ඇත. ඉන්ධන කාර්යක්ෂමතාව ලේබල් කිරීමේ ප්‍රමිතීන් කෙටුම්පත කිරීමේ කාර්යයෙන් 25% සම්පූර්ණ කර ඇත. විද්‍යුත් සංචලතා ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යංශය සමඟ අපි සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් සිටින්නෙමු.

### 2.2.5 ගෘහස්ත, කෘෂි සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ

### 2.2.5.1 උපකරණ බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන

උපකරණ බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහනේ අරමුණ, වෙළඳපොළට ඇතුළු වන අකාර්යක්ෂම නිෂ්පාදන පාලනය කරමින් බලශක්ති කාර්යක්ෂම උපකරණ වෙළඳපොලේ බෙදා හැරීම මගින් ඉල්ලුම් - පාර්ශ්වීය බලශක්ති පරිභෝජනය අඩු කිරීමයි. බලශක්ති කාර්යක්ෂම උපකරණ වෙළඳපොළේ බෙදා හැරීම සිදු කෙරෙන්නේ නිෂ්පාදනවල බලශක්ති ලේබලය ප්‍රදර්ශනය කිරීමෙන් බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන මිලදී ගැනීමට පාරිභෝගිකයන් දැනුවත් කිරීම මගිනි. බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන වැඩි වැඩියෙන් සැපයීමට නිෂ්පාදන කිරීමට සැපයුම්කරුවන් ද දිරිමත් කෙරෙයි. වෙළඳපොළට ඇතුළු වන අකාර්යක්ෂම නිෂ්පාදන පාලනය කිරීම සිදු කරනු ලබන්නේ ප්‍රකාශන මගින් සහ රෙගුලාසි පැනවීම මගිනි.

2023 දී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය එල්.ඊ.ඩී. පැනල් ලයිට් සඳහා ස්වේච්ඡා ලේබල් කිරීමේ වැඩසටහන දියත් කරන ලද අතර එල්.ඊ.ඩී. පැනල් ලයිට් සැපයුම්කරුවන්, ආනයනකරුවන්, නිෂ්පාදකයින් සහ එකලස් කරන්නන් සඳහා සැපයුම් සංසදයක් පවත්වන ලදී. තවද, ශීතකරණ සඳහා අවම බලශක්ති කාර්ය සාධන ලේබලය ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය කරමින් ගැසට් නිවේදනය නිකුත් කෙරිණ. එම ගැසට් නිවේදනය සහ නිෂ්පාදන මත ලේබලය ප්‍රදර්ශනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය පිළිබඳව ශීතකරණ සැපයුම්කරුවන්ට සැලැස්වීමේ සංසදයක් වසර අවසානයේ පවත්වන ලදී. QR කේතය සංවර්ධනය කිරීම සහ උපකරණ ලේබල් කිරීම

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය

පිළිබඳ දත්ත සමුදාය විමර්ශනය කෙරුණේ ඒ සඳහා ප්‍රතිපාදන ලබාදෙන අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ආධාර වැඩසටහනද සමගිනි. වායු සමීකරණ පරීක්ෂණාගාරය පිහිටුවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. පරීක්ෂණාගාරය සඳහා ගොඩනැගිල්ලේ සිවිල් වැඩ නිම කෙරෙමින් තිබේ. ලංකා විදුලි සමාගමේ සහ කොරියානු දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ ආයතනයේ සහ කොරියානු පරීක්ෂණ සහතික කිරීමේ ආයතනයේ (KTC) නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීම සඳහා මෙහෙයුම් කමිටුව පිහිටුවීම සිදු කෙරිණ. පරීක්ෂණාගාරය සඳහා අවශ්‍ය උපකරණ ඇතුළුව දෙවන නැවිගත කිරීම ලබා ගැනීම ද සිදු විණ.

ජල පොම්ප ප්‍රමිතියේ අවසන් කෙටුම්පත ප්‍රකාශයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත යවා ඇත. ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ (NERDC) සහයෝගීතාවය ද ඇතිව විද්‍යුත් ජල පොම්පවල බලශක්ති ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂණ පවත්වනු ලැබේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සහ ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයෙහි සහභාගීත්වයෙන් ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණි. පළමු අදියරයේදී පාදස්ථලය සහිත විදුලි පංකා 10ක් මිණුම් ලකුණ සඳහා පරීක්ෂා කරන ලදී. පාදස්ථලය සහිත පංකා, මේසය මත තබන පංකා සහ බිත්තියට සවිකරන පංකා පිළිබඳ තවත් බොහෝ පරීක්ෂණ පරීක්ෂා කිරීමට නියමිත ය. ප්‍රමිතීන්ට අනුකූල නොවන නිෂ්පාදන පිළිබඳ වෙළෙඳපළ විමර්ශන සිදු කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය සමඟ රැස්වීම් පවත්වන ලදී.





රූපය. 14 වායු සමීකරණ පරීක්ෂණාගාරයෙහි කටයුතු සම්බන්ධව කොරියානු පාර්ශ්වය අතර හමුවීමක්

### 2.2.5.2 ගෘහස්ත අංශය

ගෘහස්ත පාරිභෝගිකයන් අතර සුදුසු වැඩසටහන් සකස් කිරීම සහ සංරක්ෂණ පිළිවෙත් හඳුන්වාදීම මගින් ගෘහස්ත අංශයේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සහ සංරක්ෂණය කිරීමට අදාළ පියවර ගන්නා ලදී.

ගෘහස්ත බලශක්ති නිරීක්ෂණ භාවිතයෙහි අන්තර්ගත පිටු සම්පූර්ණ කර ඇත. තිරසාර බලශක්ති නිවාස මාර්ගෝපදේශයේ යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් දකුණු පළාතේ සහ ඌව පළාතේ පවත්වන ලදී. ප්‍රධාන වශයෙන් තාප කාර්යක්ෂමතාව සහ විමෝචනය සඳහා බලශක්ති කාර්යක්ෂම ජෛව ස්කන්ධ පිසුම් උදුන් නවයක් ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේදී පරීක්ෂා කරන ලදී. ජෛව ස්කන්ධ පිසුම් උදුන පිළිබඳ වාර්තාමය වීඩියෝවක් නිෂ්පාදනය කෙරෙමින් පවතී.



රූපය. 15 විදුලි උඳුන් පිළිබඳව NERD ආයතනයේදී පරීක්ෂා කිරීම

### 2.2.6 ප්‍රචාරක සහ ප්‍රවර්ධන

බලශක්ති සවිඥානික ජාතියක් ගොඩනැගීමේ ප්‍රධාන වගකීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සතු වේ. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, බලශක්ති කළමනාකරණය සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳව සමාජයේ සියලු ම කොටස් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ජාතික මට්ටමේ බලශක්ති අධ්‍යාපන වැඩසටහනක් නිර්මාණය කරමින් සිටී. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ආකල්ප වෙනස් කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව දිරිගැන්වීම සහ අදාළ පනතට අනුකූලව පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය සඳහා උපාය මාර්ගිකව කටයුතු කරයි. තිරසාර බලශක්ති ක්ෂේත්‍රයේ නව දැනුම හුවමාරු කර ගැනීම සඳහා 'දැනුම බෙදා හැරීමේ කෑම නිර්මාණය කිරීමට සංවිධානය ක්‍රියාකාරීව සම්බන්ධ වේ. තවද, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය "අනාගත පුරවැසියන්ගේ" ධාරිතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් සංවර්ධනය කරමින් සිටිති. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය රජයේ පාසල්වල පාසල් බලශක්ති සමාජ පිහිටුවීම සඳහා ජාතික මට්ටමේ 'සක්‍රිය කිරීමේ වැඩසටහනක්' ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් සිටී.

#### 2.2.6.1 බලශක්ති අධ්‍යාපන වැඩසටහන

විද්‍යා විෂය මාලාව සංශෝධනය කිරීමට සහ බලශක්තිය පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ජාතික අධ්‍යාපන ආයතනය සමඟ රැස්වීමක් පැවැත්වීය. බාලදක්ෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් කොළඹ ලුම්බිණි විද්‍යාලයේ දී පැවැත්විණි. "විදුලි මීටරයට පැරදීලා" පෙර පාසල් කාටූනයේ වැඩ අවසන් කර ඇත. විජය පුවත්පත සමඟ එක්ව පෙර පාසල් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විණි. ප්‍රවාහනයේදී බලශක්ති සංරක්ෂණය පිළිබඳ ප්‍රශ්න 10ක් නව රියදුරු බලපත්‍ර ලිඛිත පරීක්ෂණයට ඇතුළත් කිරීම සඳහා මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. "සණස සමඟ ගමට" නමින් බලශක්ති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හතක් පවත්වා ඇත. බලශක්ති කාර්යක්ෂමතා පිසුම් උදුන් වැඩසටහනේ සමීක්ෂණයක් දිස්ත්‍රික්ක 12 ක පවත්වන ලදී. 6 සිට 11 ශ්‍රේණිය දක්වා විද්‍යා ගුරුවරුන් සඳහා ධාරිතා වර්ධන පුහුණු වැඩසටහනක් දිවයිනේ පළාත් 09 ක පවත්වන ලදී. ඒ යටතේ ගුරුවරුන් 440 දෙනෙකු පුහුණු කිරීමට හැකි විණ. මෝටර් රථ පදවන්නන් සඳහා වූ ප්‍රවාහන බලශක්ති කාර්යක්ෂමතා මාර්ගෝපදේශය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව පරීක්ෂකයින් 100 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. පෙර පාසල් වැඩසටහන යටතේ විජය පුවත්පතේ පෙර පාසල් බලශක්ති සංරක්ෂණය සඳහා යෝජනා තරගයක් පවත්වන ලදී.



# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේෂණය

### 2.2.6.2 ප්‍රචාරක වැඩසටහන්

බලශක්ති සංරක්‍ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාර මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍යවල දක්නට ලැබේ. සජීවී වැඩසටහනක් ලෙස 'ප්‍රභාතය' ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ද, මාර්ග ගත ක්‍රමය මඟින් ලංකාදීපයෙහි ද ප්‍රචාරය කෙරේ. "Rise up SL" සජීවී වැඩසටහන TV 1 නාලිකාව මඟින් ද "ගෙත්තම" වැඩසටහන දිදුල රූපවාහිනී නාලිකාව මඟින් ද විකාශනය කෙරේ. මෙම වැඩසටහන් තොරතුරු බෙදා හැරීමට දායක වේ. 'ඩේලි නිවුස්' සහ 'සිරිකත' පුවත්පත්වල ලිපි පළ වී තිබේ. කන්දකාඩු, නවසෙන්පුර සහ වවුනියාව පුනරුත්ථාපන මධ්‍යස්ථානවලදී බලශක්ති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් විණ. 'සංරක්ෂා' සඟරාව තුන්වන කාර්තුව සඳහා නිකුත් වී ඇත.

ප්‍රශ්න විචාරාත්මක තරඟයක් සමඟින් බලශක්ති සංරක්ෂණය සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ සතිපතා ලිපි මාලාවක් නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී 'සිරිකත' පුවත්පතේ පළ විය. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි 15 වන සංවත්සරයට සමගාමීව බලශක්ති සංරක්ෂණය සහ පුනර්ජනනීය බලශක්ති පිළිබඳ විශේෂ පුවත්පත් අතිරේක 'ඩේලි නිවුස්' සහ 'ලංකාදීප' පුවත්පත්වල පළ කරන ලදී.

### 2.2.7 අරමුදල් සම්පාදනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලෙහි තිරසාර බලශක්ති ආයෝජනයට අරමුදල් ප්‍රවාහය ශක්තිමත් කිරීමේ වගකීම දරන්නේ අරමුදල් සම්පාදන අංශයයි. ඒ අනුව, සංවර්ධකයින් විසින් බලශක්ති උත්පාදනය කිරීමේදී ඊට සෙස් බදු සහ රාජ්‍ය භාගය පැනවීමටත්, ණයකර නිකුත් කිරීමටත් පනත මගින් විධිවිධාන සපයා ඇත.

### 2.2.7.1 තිරසාර බලශක්ති මෙහෙයුම් කටයුතු සඳහා අදාළ අරමුදල් නගා සිටුවීම

තිරසාර බලශක්ති අරමුදල සඳහා වන මෙහෙයුම් මාර්ගෝපදේශ කෙටුම්පත විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

### 2.2.7.2 පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත ව්‍යාපෘතිවල කාලසීමාවන් අධීක්ෂණය / අයවැය භාවිතය

පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත ව්‍යාපෘති දෙකක් සඳහා අයවැය උපයෝජනය අධීක්ෂණය කිරීම සහ ඒවා සඳහා මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කිරීම සිදු කෙරිණ.

### 2.3 ජය ගැනීමට ඇති ප්‍රධාන අභියෝග සහ උපාය මාර්ග

වගුව 7: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන ප්‍රධාන අභියෝග

### 3. ප්‍රධාන අභියෝග සහ උපාය මාර්ග

| ක්ෂේත්‍ර | අභියෝග | ජය ගැනීමට උපාය මාර්ග |
|---|---|---|
| රෙගුලාසි ස්ථාපනය කිරීම | නියාමන සංවර්ධනය තීරණාත්මක වන අතර පිරිවැය ඵලදායී වේ. සම්පත් - අධික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට වඩාත් ප්‍රමුඛත්වය ගත යුතුය. ගොඩනැගිලි සංග්‍රහය සහ මිණුම් සලකුණු රෙගුලාසි බලශක්ති පරිභෝජනය අඩු කිරීමට කාර්යක්ෂම ක්‍රම වේ. නමුත්, පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් නොවීම හේතුවෙන් එම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම බොහෝ විට ප්‍රමාද වේ. | පිල්ලකුණු නියාමනය වැනි රෙගුලාසි ගැසට් කිරීම සඳහා දැනුවත් කිරීම සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවධානය සක්‍රීයව ඉල්ලා සිටීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් මැදිහත් වීම අවශ්‍ය වේ. |
| | විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වායු සමීකරණ පරීක්ෂණාගාරයක් නිර්මාණය කිරීම වැනි විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය තුළ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම වැනි දීර්ඝ ක්‍රියා පටිපාටි අභියෝගවලට ඇතුළත් ය. එසේම, වාර්ෂික අරමුදල් නොමැතිකම හේතුවෙන් නව ව්‍යාපෘති සහ උපකරණ ලේබල් කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම ප්‍රමාද වේ. | නම්‍යශීලී බව වැඩි දියුණු කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ කැලැන්ඩර වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත්දැයි සහතික කිරීම |
| | දත්ත හිඟකම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී තීරණාත්මක ගැටලුවක් වේ. මෙය විසඳීම සඳහා, ISIC වර්ගීකරණය යටතේ ආනයනික විදුලි උපකරණ වර්ග කළ හැකි ය. මෙම වර්ගීකරණය උපකරණ ලේබල් කිරීමේ පද්ධතියකින්, බලශක්ති ඉතිරිකිරීම් මැනීමට උපකාරී වේ. | වැදගත් උපකරණ ISIC යටතේ වර්ගීකරණය කිරීමට ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම. පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණයට අමාත්‍යාංශ මට්ටමෙන් මැදිහත් වියයුතුයි. |
| | කාර්යක්ෂම දත්ත රැස් කිරීම, ආයතන හරහා අනුපිටපත් ලබා ගැනීමේ උත්සාහයන් වළක්වා ගැනීම සහ කර්මාන්තශාලා මට්ටමින් නිෂ්පාදනය විධිමත් කිරීම මගින් කාලය සහ සම්පත් ඉතිරි කිරීම සඳහා ISIC වර්ගීකරණයට අනුකූල වීම ඉතා වැදගත් වේ. | බලශක්ති, මූල්‍ය සහ සමාජීය අංශ ආවරණය කරමින් කාර්මික, ගෘහස්ත සහ වාණිජ අංශවලින් දත්ත රැස් කිරීම. ඒ සඳහා ආයතන ජනලේඛන දෙපාර්තමේන්තුව සමඟ එක්ව ප්‍රායෝගික ප්‍රශ්නාවලියක් ගොඩ නගාගෙන සහයෝගයෙන් කටයුතු කළ යුතු ය. |

# කළමණාකරන සාකච්ඡා සහ විශ්ලේශණය

| ක්ෂේත්‍ර | අභියෝග | ජය ගැනීමට උපාය මාර්ග |
|---|---|---|
| පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය | ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වන අතර ඒ අනුව ව්‍යාපෘති පිරිවැය වැඩි වේ. | ඉඩම් අත්පත් කර ගැනීම සමාලෝචනය කිරීම. |
| | විවිධ පාර්ශ්වකරුවන්ගෙන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමත කිරීම් බොහෝ විට මන්දගාමී වේ. | ව්‍යාපෘති අනුමත කිරීමේ ඉහළ මට්ටමේ කමිටුවක් පිහිටුවීම. |
| | මේ නිසා ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රමාදය වේ. | අධීක්ෂණ ගැටළු සහ බාධක සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කිරීම. |
| | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීමේදී නොගැළපෙන ප්‍රතිපත්ති මගින් ආයෝජකයින් අධෛර්යමත් කෙරේ. | නීතිමය හිඩැස් හඳුනාගෙන සංශෝධනය කිරීම සහ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම. |
| | පවතින විදුලිබල ජාලයට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ඒකාබද්ධ කිරීම සංකීර්ණ විය හැකි ය. මෙවැනි තත්ත්වයක් ඇති වන්නේ විශේෂයෙන් ම සූර්ය / සුළං බල එකතු කිරීමේදී ය. | පුනර්ජනනීය බලශක්ති සඳහා සඳහා ජාලය ඉහළ නැංවීම |
| | පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳව සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය සහ අවබෝධය නොමැතිකම ප්‍රගතියට බාධාවක් විය හැකි ය. | පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම. |
| මූල්‍ය මැදිහත්වීම | ජාතික වශයෙන් 70% පුනර්ජනනීය බලශක්ති ඉලක්කය සහ බලශක්ති කළමනාකරණ මූලික වශයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල අභියෝගයක් වී තිබෙන්නේ අරමුදල්වල සීමිත බව සහ ආර්ථික අර්බුදය ය. | සෙස් සහ රාජ්‍ය භාග බදු ස්වාධීනව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත අරමුදල් සපයයි. |
| | | පුනර්ජනනීය බලශක්ති සඳහා දිරිගැන්වීම් සහ ණය සඳහා ප්‍රතිපත්ති අවශ්‍ය වේ. ජාතිකව නිර්ණය කළ දායකත්ව සහ තිරසාභ සාංවර්ධන ඉලක්ක සඳහා හවුල්කරුවන්ගෙන් මූල්‍ය ආධාර ලබා ගැනීම |
| සම්පත් | පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධාන ගැටළු අතර මානව සම්පත් සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් හිඟකම තිබේ. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් බලශක්ති අමාත්‍යාංශ සමඟ සහයෝගී ප්‍රයත්නයන් ආරම්භ කිරීම |
| | | පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය පුළුල් කිරීමට සිදුව ඇත. ඒ, සූර්ය, සුළං, පියැසි මත ඉදි කරන සූර්ය පැනල සහ තවත් අංශවල සම්පත් වර්ගවල විවිධාංගීකරණය කිරීමෙනි. එසේ ම සේවක තනතුරු වැඩි කිරීම ද අවශ්‍ය වේ. |

# ක්‍රියාකාරී සැලැස්ම - 2024

සැපයුම් පාර්ශවීය කළමණාකරණ අංශය

1. සම්පත් අනුරූප

- පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතාවයන් සහිත ව්‍යාපෘති භූමීන් හඳුනා ගැනීම.
- නිවැරදි සම්පත් ඇස්තමේන්තුවක් සිදු කිරීමට අවශ්‍ය ඉහළ නිරවද්‍යතාවයකින් යුතු දත්තයන් ලබා ගැනීමට හැකි වන පරිදි සුළං දත්ත මැනීමේ කුළුණු කාලීනව නඩත්තු කිරීම හා පවත්වා ගෙන යාම.

2. පර්යේෂණ හා සංවර්ධන

- පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා රිදියගම ජලාශය, ඉරක්කාමන් ජලාශය හා කාසල්රී ජලාශයන් සඳහා විස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.
- මෙ.වො. 234 ක පුනරීන් සුළං බල ව්‍යාපෘතිය සහ මෙ.වො. 286 ක මන්නාරම් සුළං බල ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කිරීම.
- මෙ.වො. 210 ක වෙරවිල් සුළං බල උද්‍යානය සඳහා පාරිසරික බලපෑම ඇගයීම අවසන් කිරීම.
- කරච්චි සුළං බල ව්‍යාපෘතිය (මෙ.වො. 100) , මන්තායි බටහිර සුළං බල ව්‍යාපෘතිය (මෙ.වො.100) සහ තුනුක්කායි සූර්ය බල ව්‍යාපෘතිය (මෙ.වො. 100) සඳහා පූර්ව සංවර්ධන කටයුතු සිදු කිරීම.

3. පුනර්ජනනීය බලශක්ති සේවා

■ සූර්ය බල සංග්‍රාමය
මෙ.වො. 160 ක ධාරිතාවක් අළුතින් එක් කිරීමට අපේක්ෂා කරමින් පියැසි මත වන සූර්ය බල ව්‍යාපෘතිය අඛණ්ඩව දියත් කිරීම.

■ ඉන්දීය ණය පහසුකම යටතේ වන ව්‍යාපෘතිය
ආගමික ස්ථාන හා රජයේ ගොඩනැගිලි සඳහා මෙ.වො. 135 ක සූර්ය බල ව්‍යාපෘතීන් ඉදි කිරීම සඳහා අධ්‍යයනය සිදු කිරීම.

- යාපනයේ කුඩා දූපත් 03ක් සඳහා දෙමුහුම් සූර්ය බලශක්ති ව්‍යාපෘතීන් ඉදි කිරීම.
- චන්ද්‍රිකා වැව හා කිරිඉබ්බන් වැව පාවෙන සූර්ය බල ශක්ති ව්‍යාපෘතීන් ඉදි කිරීම.

4. සම්පත් පැවරීම හා සංවර්ධනය

- පුනර්ජනනීය බලශක්ති සම්පත් පැවරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීම.
- අනිකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සඳහා පවතින ගැටළු නිරාකරණය කිරීම සඳහා මැදිහත් වීම.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම.

# ක්‍රියාකාරී සැලැස්ම - 2024

ඉල්ලුම් පාර්ශවීය කළමණාකරණ අංශය

1. පද්ධති හා සැලසුම්

- බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සංග්‍රහය බලාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි සැකසීම.
- බලශක්ති ඉතිරි කිරීම සඳහා වන පද්ධති ප්‍රවර්ධනය කිරීම
- ප්‍රවාහනය සඳහා විකල්ප ඉන්ධන භාවිතා කිරීම සඳහා අධ්‍යයනයන් සිදු කිරීම.

2. කර්මාන්ත හා සේවා අංශය

- බලශක්ති කළමණාකරණ වැඩසටහන්, බලශක්ති විගණන වැඩසටහන් හා බලශක්ති පරිභෝජන පිල් ලකුණු හඳුන්වා දීම මඟින් වාණිජ හා කර්මාන්ත අංශයේ බලශක්ති සංරක්ෂණ ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගෙන යාම.
- බලශක්ති විගණන, උපදේශන සේවා හා සහයෝගය දැක්වීම හරහා ආයතන, උපදේශකයන්, වෘත්තිකයන්, බලශක්ති කළමණාකරුවන් හා බලශක්ති සේවා සැපයුම් සමාගම් සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

3. ගෘහස්ථ, කෘෂි හා සුළු මධ්‍ය පරිමාණ ව්‍යවසාය
උපකරණ බලශක්ති ලේබල වැඩසටහන 2024 වර්ෂය සඳහා පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- ශීතකරණ සඳහා බලශක්ති කාර්ය සාධන ලේබලය අනිවාර්ය කරමින් නියම ක්‍රියාවට නංවයි.
- වායු සමීකරණ යන්ත්‍ර, බෑෘ මොඩුල, වතුර පොම්ප, රූපවාහිනි, පාදස්ථලය සහිත පංකා, රෙදි සෝදන යන්ත්‍ර, ගෑස් උඳුන්, විදුලි උඳුන් සඳහා බලශක්ති ලේබල වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

4. සමීක්ෂණ හා පර්යේෂණ

- අයෝජන මණ්ඩලයට අයත් කලාප හතරක ත්‍රිත්ව ජනනය සඳහා ඇති හැකියාව සොයා බැලීම.
- සිසිලන යන්ත්‍ර මඟින් විදුලිය ඉතිරි කිරීම පිළිබඳව සමීක්ෂණය තවදුරටත් කරගෙන යාම (සම්පූර්ණ විගණන වාර්තා දහයක් හා අවසන් වාර්තාව සම්පූර්ණ කර වසර දහයකට වැඩි සිසිලන යන්ත්‍ර ඉවත් කිරීමෙන් ලැබිය හැකි කර්මාන්තමය ප්‍රගතිය බැලීම.
- කාර්යක්ෂම වීදි ආලෝකකරණ සහිත නියමු ව්‍යාපෘතිය - දිවුලපිටිය
- කාර්යක්ෂම ශීතකරණ ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩසටහන

අනෙකුත් අංශයන්

1. ප්‍රතිපත්ති උපදේශන

- 2022 හා 2023 වර්ෂ සඳහා බලශක්ති තුලනය ප්‍රකාශයට පත් කිරීම.
- පියැසි මත ඉදි කෙරෙන සූර්ය විදුලි බලාගාරයන් කාර්ය සාධනය සඳහා සමීක්ෂණ පැවැත්වීම.

2. ප්‍රචාරක හා ප්‍රවර්ධන

- බලශක්ති සංරක්ෂණය දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රවර්ධන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම.

3. සම්පත් සම්පාදන අංශය

- විදේශ මූල්‍යාධාර යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය හා මූල්‍ය භාවිතය පිළිබඳ සමාලෝචනය අඛණ්ඩව සිදු කිරීම.





# ආදායම් ප්‍රකාශය

| **ආදායම් ප්‍රකාශය**<br>*2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | සටහන් | 2023<br>රු | 2022<br>(ප්‍රතිප්‍රකාශිත)<br>රු |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මෙහෙයුම් ආදායම | 3 | 228,348,312 | 217,257,665 |
| මෙහෙයුම් නොවන ආදායම | 4 | 278,221,379 | 339,903,616 |
| **මුළු ආදායම** | | **506,569,692** | **557,161,281** |
| **වියදම්** | | | |
| **ව්‍යාපෘති / ක්‍රියාකාරකම් මුදල්** | 5 | | |
| පුනර්ජනනීය බලශක්ති | 5.1 | 21,695,518 | 103,141,753 |
| දැනුම කළමනාකරණය | 5.2 | 2,305,658 | 5,268,601 |
| සම්පත් අනුරූපණය | 5.4 | 26,519,319 | 20,598,578 |
| ජාතික ව්‍යාපෘති සංවර්ධනය | 5.5 | 25,369,340 | 61,139,899 |
| ප්‍රභව සංවර්ධනය සහ පහසුකම් සැපයීම | 5.6 | 1,752,747 | 518,685 |
| පද්ධති සහ සැලසුම් | 5.7 | 1,603,600 | 4,329,181 |
| කාර්මික හා සේවා අංශය | 5.8 | 11,640,989 | 2,225,510 |
| ගෘහ හා කෘෂි අංශය | 5.9 | 3,584,315 | 1,866,874 |
| සමීක්ෂණ හා පර්යේෂණ | 5.10 | 2,285,869 | 176,079 |
| ප්‍රතිපත්ති සහ උපදේශනය | 5.11 | 666,330 | 807,465 |
| තොරතුරු කළමනාකරණ තාක්ෂණය | 5.12 | 909,000 | 525,787 |
| | | **98,332,684** | **200,598,412** |
| **පුනරාවර්තන වියදම්** | 6 | | |
| වැටුප් සහ දීමනා | 6.1 | 116,694,604 | 121,023,862 |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා | 6.2 | 688,199 | 720,244 |
| සැපයුම් | 6.3 | 13,014,603 | 8,421,344 |
| නඩත්තු වියදම් | 6.4 | 18,003,972 | 21,125,019 |
| කොන්ත්‍රාත් සේවා | 6.5 | 36,429,413 | 30,925,519 |
| ක්ෂය වියදම් | 6.6 | 114,983,718 | 54,136,931 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 6.7 | 20,343,515 | 14,666,621 |
| | | **320,158,024** | **251,019,540** |
| **මුළු වියදම** | | **418,490,708** | **451,617,952** |
| **අතිරික්තය /(ඌනතාවය)** | | **88,078,983** | **105,543,329** |

පිටු අංක 45 සිට 52 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 53 සිට 80 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයන් වේ.
නිවැරදි බවට සහතික කරන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)

අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික

සභාපති

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**<br>*2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | සටහන් | 2023<br>රු | 2022<br>(ප්‍රතිප්‍රකාශිත)<br>රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 10 | | |
| නිදහස් වත්කම් | 10.1 | 620,580,232 | 449,541,094 |
| කල්බදුමය වත්කම් | 10.2 | 32,863,792 | 34,392,340 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 1,555,384 | 2,466,077 |
| නොනිමි කාර්යය | 12 | 31,247,453 | 97,785,461 |
| ආයෝජන | 13 | 633,426,742 | 521,875,090 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,319,673,603** | **1,106,060,062** |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු දෑ | 14 | 50,750,755 | 76,888,518 |
| කෙටි කාලීන තැන්පතු | 13.4 | 120,177,542 | 100,000,000 |
| වෙනත් ජංගම වත්කම් | 15 | 297,241,243 | 151,289,836 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 16 | 723,201,732 | 200,846,161 |
| **මුළු ජංගම වත්කම්** | | 1,191,371,273 | 529,024,515 |
| **වත්කම් එකතුව** | | 2,511,044,875 | **1,635,084,577** |
| **හිමිකම් සහ බැරකම්** | | | |
| **හිමිකම්** | | | |
| සමුච්චිත අරමුදල | 17 | 290,809,622 | 22,100,336 |
| ශුද්ධ අතිරික්තය /(ඌනතාව) | | (10,072,543) | 78,477,876 |
| විලම්බිත ප්‍රදානය | 18 | - | 268,709,286 |
| බලපත් ගාස්තු අත්තිකාරම් සංචිතය | | 771,557,719 | 493,317,848 |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 20 | 594,267,225 | 442,442,884 |
| සුනිත්‍ය ඇප අරමුදල | | 152,474,098 | 127,669,036 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 313,955,943 | 101,217,000 |
| **මුළු හිමිකම්** | | **2,112,992,064** | **1,533,934,266** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂිත ප්‍රතිදාන | | 40,757,123 | 39,001,758 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 40,757,123 | 39,001,758 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වෙනත් දෑ | 19 | 351,664,355 | 57,850,118 |
| ඉඩම් අත්පත් කර ගැනීමේ ශුද්ධ තැන්පතු | | 5,631,335 | 4,298,435 |
| **මුළු ජංගම වගකීම්** | | 357,295,689 | 62,148,553 |
| **මුළු හිමිකම් සහ බැරකම් ප්‍රමාණය** | | **2,511,044,875** | **1,635,084,577** |

පිටු අංක 45 සිට 52 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 53 සිට 80 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයන් වේ. නිවැරදි බවට සහතික කරන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)

අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික

සභාපති

# ප්‍රාග්ධන වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | සමුච්චිත අරමුදල රු. | ශුද්ධ අතිරික්තය / හිඟය | විලම්බිත ප්‍රදාන | බලපත්‍ර ආදායම පෙර ලැබීම් | නැවත ප්‍රත්‍යගනන කිරීමේ සංචිතය | ශ්‍රී සුනිත්‍ය බලශක්ති අරමුදල | ශ්‍රී සුනිත්‍ය බලශක්ති ඇපකාර අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 2020.12.31 වන දිනට ශේෂය | 22,100,336 | 194,966,950 | 338,856,524 | - | 101,217,000 | 385,061,623 | 115,895,545 | 1,158,097,978 |
| පෙර වසරට ගැළපීම් | | | | | | | | - |
| 2021 වර්ෂය සඳහා වැඩිවීම් /(අඩුවීම්) | | 181,807,729 | (35,321,954) | | | | | 146,485,775 |
| ඇපකාර මුදලට මාරු කිරීම | | (4,874,451) | | | | | 4,874,451 | - |
| බලශක්ති අරමුදලට මාරු කිරීම - ආදායම් | | (43,855,379) | | | | 43,855,379 | | - |
| බලශක්ති අරමුදලට මාරු කිරීම - ව්‍යාපෘති වියදම් | | 61,359,307 | | | | (61,359,307) | | - |
| ඉඩම් නැවත තක්සේරු කිරීම | | | | | | | | - |
| 2021.12.31 වන දිනට ශේෂය | 22,100,336 | 389,404,156 | 303,534,570 | - | 101,217,000 | 367,557,695 | 120,769,996 | 1,304,583,753 |
| පෙර වසරට ගැළපීම් | | | | | | | | - |
| බලපත් ගාස්තු අත්තිකාරම් සංචිතය වෙත මාරු කිරීම | | (334,685,380) | | 334,685,380 | | | | |
| 2022 වර්ෂය සඳහා වැඩිවීම් /(අඩුවීම්) | | 105,543,329 | (34,825,284) | 191,329,060 | | | | 262,047,105 |
| වර්ෂය සඳහා වූ ආදායම ලෙස හඳුනාගැනීම් | | | | (32,696,592) | | | | (32,696,592) |
| ඇපකාර අරමුදලට මාරු කිරීම | | (6,899,040) | | | | | 6,899,040 | - |
| බලශක්ති අරමුදලට මාරු කිරීම - ආදායම් | | (270,820,185) | | | | 270,820,185 | | - |
| බලශක්ති අරමුදලට මාරු කිරීම - ව්‍යාපෘති වියදම් | | 195,934,996 | | | | (195,934,996) | | - |
| ඉඩම් නැවත තක්සේරු කිරීම | | | | | | | | - |
| 2022.12.31 වන දිනට ශේෂය | 22,100,336 | 78,477,876 | 268,709,286 | 493,317,848 | 101,217,000 | 442,442,884 | 127,669,036 | 1,533,934,266 |
| ආරම්භක ශේෂයේ වෙනස්කම් | | | | | | | | - |
| පෙර වසරට ගැළපීම් | | | | | | | | - |
| 2023 වර්ෂය සඳහා වැඩිවීම් /(අඩුවීම්) | - | 88,078,983 | - | | - | - | - | 88,078,983 |
| වසර ඇතුළත ලැබීම් | | | | 327,301,540 | | | | 327,301,540 |
| වර්ෂය සඳහා වූ ආදායම ලෙස හඳුනාගැනීම් | | | | (49,061,669) | | | | (49,061,669) |
| ඇපකාර අරමුදලට මාරු කිරීම | - | (24,805,062) | - | | - | - | 24,805,062 | - |
| බලශක්ති අරමුදලට මාරු කිරීම - ආදායම් | - | (195,722,157) | - | | - | 195,722,157 | - | - |
| බලශක්ති අරමුදලට මාරු කිරීම - ව්‍යාපෘති වියදම් | - | 43,897,816 | - | | - | (43,897,816) | - | - |
| නැවත තක්සේරු කිරීම - ස්ථාවර වත්කම් | - | - | - | | 212,738,943 | - | - | 212,738,943 |
| සමුච්චිත අරමුදලට මාරු කරන ලද | 268,709,286 | | (268,709,286) | | - | - | - | - |
| 2023.12.31 වන දිනට ශේෂය | 290,809,622 | (10,072,543) | - | 771,557,719 | 313,955,943 | 594,267,225 | 152,474,098 | 2,112,992,064 |

පිටු අංක 45 සිට 52 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 53 සිට 80 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයන් වේ.

අධ්‍යක්ෂ (මූල්‍ය) අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික සභාපති

# මුදල් ප්‍රවාහ ප්‍රකාශ

| | සටහන් | 2023 රු | 2022 (ප්‍රතිප්‍රකාශිත) රු |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය) | | 88,078,983 | 105,543,329 |
| **ගැලපීම්:** | | | |
| අලාභ හා හානිවීම් | | - | - |
| පොලිය ආදායම | 4,9 | (174,500,646) | (34,965,577) |
| ක්‍රමික්ෂය ප්‍රදානය (ලැබුණු අරමුදල් සඳහා) | 8 | - | (34,825,292) |
| බලපත්‍ර ගාස්තු | 24 | (49,061,669) | (32,696,592) |
| පාර්තෝෂිත දීමනා | 6.1 | 3,462,715 | 3,569,503 |
| පරිත්‍යාග (ඉඳුරාන ඉඩම) | | - | (3,385,000) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලැබෙන අලාභ/(ලාභ) | 4 | 1,285,890 | (4,375) |
| ක්ෂය වීම | 6.6 | 114,983,718 | 54,136,931 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | **(15,751,009)** | **57,372,927** |
| අනෙකුත් ජංගම වත්කම්වල (අඩුවීම)/(වැඩිවීම) | | (148,079,340) | (245,386,983) |
| ජංගම වගකීම් (වැඩිවීම)/(අඩුවීම) | | 295,147,136 | 33,314,145 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද මුදල් ප්‍රවාහය** | | **131,316,787** | **(154,699,911)** |
| ගෙවන ලද පාර්තෝෂිත | | (1,707,351) | (877,250) |
| රඳවා ගැනීමේ බදු ගෙවීම් | | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **129,609,437** | **(155,577,161)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය** | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | 10.1 | (72,130,562) | (12,555,711) |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | - | (284,000) |
| නොනිම් කාර්යය | 12 | 66,538,008 | 23,824,033 |
| ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | 13 | (106,008,995) | (452,733,850) |
| භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබීම | | - | - |
| ලැබුණු පොළිය | | 177,046,143 | 20,139,880 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම් | | - | 10,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **65,444,594** | **(421,599,648)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහය** | | | |
| විලම්බිත ප්‍රදානය | | - | - |
| බලපත්‍ර ගාස්තු ලැබීම | | 327,301,540 | 191,329,060 |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | | - | - |
| සමුච්චිත අරමුදල | | - | - |
| සුනිත්‍ය ඇප අරමුදල | | - | - |
| විදේශීය ප්‍රතිදායකයන්ට ආපසු ගෙවිය යුතු ණය | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **327,301,540** | **191,329,060** |
| **මුදල් හා මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | **522,355,571** | **(385,847,750)** |
| **වසර ආරම්භයේදී මුදල් හා මුදල්වලට සමාන දේ** | 16 | **200,846,161** | **586,693,911** |
| **වසර අවසානයේදී මුදල් හා මුදල්වලට සමාන දේ** | | **723,201,732** | **200,846,161** |

පිටු අංක 45 සිට 52 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 53 සිට 80 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයන් වේ.
නිවැරදි බවට සහතික කරන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)

අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික

සභාපති

# අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් අතර සංසන්දනාත්මක ප්‍රකාශය - 2023

| **අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් අතර සංසන්දනාත්මක ප්‍රකාශය - 2023**<br>*2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | **සටහන්** | **සත්‍ය 2023 රුපියල්** | **අයවැය 2023 රුපියල්** | **වෙනස 2023 රුපියල්** |
|---|---|---|---|---|
| **පෞද්ගලික පඩිනඩි** | | | | |
| වැටුප් සහ වේතන | | 61,339,011 | 65,560,080 | 4,221,069 |
| E.P.F. 12% | | 8,963,932 | 9,768,010 | 804,077 |
| E.T.F. 3% | | 2,240,998 | 2,487,662 | 246,664 |
| අතිකාල සහ නිවාඩු දින දීමනා | | 6,411,210 | 10,295,715 | 3,884,505 |
| ජීවන වියදම | | 8,845,200 | 9,828,000 | 982,800 |
| වෙනත් දීමනා | | 5,340,000 | 5,892,000 | 552,000 |
| රුපියල් 5000 දීමනාව | | 5,622,184 | 6,300,000 | 677,816 |
| NAITA වැටුප | | 653,000 | 2,400,000 | 1,747,000 |
| ගමනාගමන දීමනාව | | 5,338,366 | 8,400,000 | 3,061,634 |
| ඉන්ධන දීමනාව | | 7,721,575 | 9,855,000 | 2,133,425 |
| පාරිතෝෂික | | 1,402,230 | 2,000,000 | 597,770 |
| | | - | - | - |
| | | **113,877,707** | **132,786,467** | |
| **ගමන් වියදම්** | | | | |
| දේශීය | | 1,423,960 | 1,600,000 | 176,040 |
| විදේශීය | | - | 2,000,000 | 2,000,000 |
| | | **1,423,960** | **3,600,000** | |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | | 2,191,017 | 3,055,000 | 863,983 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | BA01 | 9,925,344 | 10,500,000 | 574,656 |
| පුවත්පත් | | 160,360 | 250,000 | 89,640 |
| නිල ඇඳුම් | | 291,086 | 280,000 | (11,086) |
| | | **12,567,806** | **14,085,000** | |
| **අලුත්වැඩියා සහ නඩත්තු වියදම්** | | | | |
| වාහන නඩත්තුව සහ රක්ෂණය | BA02 | 14,945,667 | 15,000,000 | 54,333 |
| පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | | 2,199,020 | 2,200,000 | 980 |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | | 8,000 | 550,000 | 542,000 |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | | 53,200 | 3,000,000 | 2,946,800 |
| | | **17,205,887** | **20,750,000** | |

| අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් අතර සංසන්දනාත්මක ප්‍රකාශය - 2023 | සටහන් | සත්‍ය 2023 රුපියල් | අයවැය 2023 රුපියල් | වෙනස 2023 රුපියල් |
|---|---|---|---|---|
| **පෞද්ගලික පඩිනඩි** | | | | |
| ප්‍රවාහනය | | 170,055 | 1,200,000 | 1,029,945 |
| දුරකථන හා තැපැල් ගාස්තු | | 4,697,100 | 6,100,000 | 1,402,900 |
| වෙබ් අඩවි සහ මෘදුකාංග නඩත්තුව | | 1,483,429 | 2,000,000 | 516,571 |
| විදුලිය | | 11,368,533.53 | 11,480,000 | 111,466 |
| ජලය | | 1,039,615.00 | 1,172,000 | 132,385 |
| වෛද්‍ය රක්ෂණ | | 3,671,361 | 4,000,000 | 328,639 |
| උපයෝගිතා වියදම් | | - | 2,160,000 | 2,160,000 |
| ආරක්ෂක | | 4,359,900 | 5,280,000 | 920,100 |
| කුලිය | | 15,826,711 | 15,959,700 | 132,989 |
| | | - | - | |
| | | **42,616,706** | **49,351,700** | |
| **වෙනත්** | | | | |
| මණ්ඩල වියදම් | | 958,327 | 2,500,000 | 1,541,673 |
| දැන්වීම් | | 548,314 | 3,000,000 | 2,451,686 |
| මුද්‍රණ කටයුතු හා ප්‍රකාශන කටයුතු | | 1,015,199 | 5,500,000 | 4,484,801 |
| හර බදු සහ බැංකු ගාස්තු | | - | 675,000 | 675,000 |
| කාර්යාලීය වියදම් | | 1,655,677 | 5,000,000 | 3,344,323 |
| සංග්‍රහ දීමනා | | 296,199 | 1,000,000 | 703,801 |
| විගණන ගාස්තු | | 1,821,600 | 2,800,000 | 978,400 |
| නෛතික ගාස්තු | | 1,091,458 | 1,500,000 | 408,542 |
| පරිවර්තන ගාස්තු | | 213,478 | 300,000 | 86,523 |
| | | **7,600,251** | **22,275,000** | |

## අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් අතර සංසන්දනාත්මක ප්‍රකාශය - 2023
## ප්‍රාග්ධන අයවැය සහ සත්‍ය

| කේතය | ක්‍රියාකාරකම් | සත්‍ය 2023 රුපියල් | අයවැය 2023 රුපියල් | වෙනස රුපියල් |
|---|---|---|---|---|
| | **පරිපාලන අංශය** | | | |
| | පුනරුත්තාපන සහ වැඩිදියුණු කිරීම් | 1,046,539 | 2,000,000 | 953,461 |
| | ස්ථාවර වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 126,700 | 16,650,000 | 16,523,300 |
| | කාර්යය මණ්ඩල පුහුණුව | 3,332,875 | 4,000,000 | 667,125 |
| | | **4,506,114** | **22,650,000** | **18,143,886** |
| | **RMP සම්පත් අනුරූපකරණය** | | | |
| RMP01 | පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලසුම | 229,189 | 1,800,000 | 1,570,811 |
| RMP02 | සම්පත් තක්සේරුව | 3,361,642 | 5,300,000 | 1,938,358 |
| RMP 03 | SRIMCHP : ඉඳුරාන | 3,192,657 | 4,100,000 | 907,343 |
| | | **6,783,488** | **11,200,000** | **4,416,512** |
| | **RMP පර්යේෂණ සහ සංවර්ධන** | | | |
| RND02 | පුනරීන් සුළං - සූර්යය බල දෙමුහුම් බලශක්ති උද්‍යානය | 3,193,310 | 4,000,000 | 806,690 |
| RND03 | සියඹලාණ්ඩුව මෙගාවොට් 100ක සූර්යය බල උද්‍යානය | 9,893,189 | 10,500,000 | 606,811 |
| RND04 | මන්නාරම දෙවන අදියරය | 18,638,266 | 19,000,000 | 361,734 |
| RND05 | මුසාලි සුළං බලාගාර ව්‍යාපෘතිය | 127,869 | 82,350,000 | 82,222,132 |
| RND06 | කරච්චි සුළං සූර්යය දෙමුහුම් බලශක්ති උද්‍යානය | 523,528 | 36,250,000 | 35,726,472 |
| | | **32,376,162** | **152,100,000** | **119,723,838** |
| | **RMP පුනර්ජනනී බලශක්ති සේවා** | | | |
| RES01 | පුනර්ජනනීය බලශක්ති සේවා (සූර්යය බල සංග්‍රාමය) | 339,381 | 32,091,932 | 31,752,552 |
| RES01 | පුනර්ජනනී බලශක්ති සේවා (CEB Augmentation) | 24,420 | 19,000,000 | 18,975,580 |
| RES02 | අරමුදල් සහිත ප්‍රතිදායක ව්‍යාපෘති | 3,366,801 | 5,600,000 | 2,233,199 |
| RES03 | හම්බන්තොට සූර්යය බලශක්ති උද්‍යානය | 6,917,334 | 32,340,000 | 25,422,666 |
| RES04 | ඉඳුරාන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ ජල විදුලි බලාගාර | | | - |
| | | **10,647,936** | **89,031,932** | **78,383,996** |
| | **RDF - සම්පත් සංවර්ධන සහ පහසුකම්** | | | |
| RDF01 | ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටු රැස්වීම | 2,236,104 | 2,500,000 | 263,896 |
| RDF03 | බලශක්ති බලපත්‍ර දීර්ඝ කිරීම / ප්‍රගතිය අධීක්ෂණය | 121,658 | 350,000 | 228,342 |
| RDF05 | මාර්ග ගත පද්ධති සංවර්ධනය | - | - | - |
| RDF06 | SEADA පද්ධතිය සංවර්ධනය | 47,433 | 200,000 | 152,567 |
| RDF07 | ඉඩම් කටයුතුවලට අවධානය යොමු කිරීම | 621,154 | 1,200,000 | 578,846 |
| | | **3,026,349** | **4,250,000** | **1,223,651** |
| | **SNP - පද්ධති සහ සැලසුම්** | | | |
| SNP01 | ගොඩනැඟිලි කේත | 34,050 | 50,000 | 15,950 |
| SNP03 | ප්‍රවාහන බලශක්තිය | 1,547,560 | 1,500,000 | (47,560) |
| | | **1,581,610** | **1,550,000** | **(31,610)** |

# අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් අතර සංසන්දනාත්මක ප්‍රකාශය - 2023
## ප්‍රාග්ධන අයවැය සහ සත්‍ය

| කේතය | ක්‍රියාකාරකම් | සත්‍ය 2023 රුපියල් | අයවැය 2023 රුපියල් | වෙනස රුපියල් |
|---|---|---|---|---|
| | **ISS - කාර්මික සහ සේවා අංශය** | | | |
| ISS01 | සිල්ලර සහ මූල්‍ය ආයතන සඳහා බලශක්ති පරිභෝජන මිනුම් සලකුණු ස්ථාපනය කිරීම | 300,799 | 1,100,000 | 799,201 |
| ISS02 | බලශක්ති කළමනාකරු යෝජනා ක්‍රමය | 2,599,232 | 2,300,000 | (299,232) |
| | | **2,900,031** | **3,400,000** | **499,969** |
| | **SME - ගෘහස්ත, කෘෂි සහ කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය** | | | |
| SME1 | උපකරණ ලේබල් කිරීම | 1,600,448 | 2,450,000 | 849,552 |
| SME2 | ගෘහස්ත අංශය | 497,580 | 500,000 | 2,420 |
| | | **2,098,028** | **2,950,000** | **851,972** |
| | **SNR - සමීක්ෂණ සහ පර්යේෂණ** | | | 3,227,420 |
| SNR 02 | සමීක්ෂණ සහ පර්යේෂණ | 3,172,580 | 6,400,000 | 1,683,903 |
| SNR 03 | නව තාක්ෂණ සහ බලශක්ති ද්‍රාමයන් | 616,097 | 2,300,000 | 210,310 |
| SNR 04 | පවතින තාක්ෂණය සහ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යයන කිරීම | 39,690 | 250,000 | |
| | | **3,828,367** | **8,950,000** | **5,121,633** |
| | **POA - ප්‍රතිපත්ති සහ උපදේශන** | | | |
| POA01 | බලශක්ති තොරතුරු | 5,630 | 10,000 | 4,370 |
| POA02 | බලශක්ති තුලන වාර්තාව සම්පාදනය කිරීම | 759,235 | 2,000,000 | 1,240,765 |
| | | **764,865** | **2,010,000** | **1,245,135** |
| | **POA - ප්‍රචාරණ සහ ප්‍රවර්ධන** | | | |
| ONP01 | බලශක්ති අධ්‍යාපනික වැඩසටහන් | 1,645,045 | 8,900,000 | 7,254,955 |
| ONP02 | සන්නිවේදන වැඩසටහන් | 1,636,211 | 17,000,000 | 15,363,789 |
| | | **3,281,256** | **25,900,000** | **22,618,744** |
| IMT | **සේවක ධාරිතා සංවර්ධනය** | **43,500** | **500,000** | **456,500** |
| | **තොරතුරු කළමනාකරණය** | **36,425** | **500,000** | **463,575** |
| | අරමුදල් සම්පාදනය | | | - |
| **මුළු එකතුව** | | **71,874,130** | **324,991,932** | **253,117,802** |

# මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

2023.12.31 වන දිනට වන මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

**1. ආයතනික තොරතුරු**

**1.1 සාමාන්‍ය තොරතුරු**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2007 ඔක්තෝම්බර් 1 වන දින පිහිටුවන ලදී. එය කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ අංක 72 දරන ස්ථානයෙහි පිහිටා ඇත.

1985 අංක 02 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල (ECF) පනත, 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මගින් අවලංගු කරන ලදී. 2007 සැප්තැම්බර් 30 වන දිනට බලශක්ති සංරක්ෂණ අරමුදලෙහි තිබූ සියලුම වත්කම් සහ වගකීම් 2007 ඔක්තෝබර් 1 වන දින සිට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ගිණුම් වෙත ස්වයංක්‍රීයව මාරු කෙරිණ.

**1.2 අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම්**

බලශක්ති සංවර්ධන ක්ෂේත්‍ර ප්‍රකාශ කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, බලශක්ති සුරක්ෂිතතාව ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම, බලශක්ති බෙදාහැරීමේ විශ්වසනීයත්වය සහ පිරිවැය ඵලදායීතාවය සහ බලශක්ති සැපයුම හා ඉල්ලුම පිළිබඳ තොරතුරු කළමනාකරණය කිරීම ඇතුළු පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධනය කිරීම වැනි කටයුතු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ.

**1.3 අධිකාරියේ අරමුදල්**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනත ප්‍රකාරව, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අරමුදල් තුනක් පවත්වාගෙන යෑමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වේ. ඒවා පහත දැක්වෙන පරිදි වේ.

**1.3.1 අධිකාරියේ අරමුදල**

මූලික ප්‍රාග්ධනය, බලපත්‍ර ගාස්තු, ණය, බදු කුලී සහ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අනෙකුත් භාර ගැනීම් තැන්පත් කිරීම සඳහා මෙම අරමුදල පවත්වාගෙන යනු ලැබේ. පනතට අනුව එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී, කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමේදී අධිකාරිය දරන වියදම් පියවා ගැනීම සඳහා වන සියලුම මුදල් මෙම අරමුදලෙන් ගෙවනු ලැබේ.

**1.3.2 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී අරමුදල**

| මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් *2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | සටහන | 2023 | 2022 (ප්‍රතිප්‍රකාශිත) |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම - බලශක්ති අරමුදල | | 195,722,157 | 270,820,185 |
| | | | |
| **වියදම්** | | | |
| සම්පත් තක්සේරු කිරීම | | | 1,143,793 |
| පුනරින් සුළං - සූර්යය දෙමුහුම් බලශක්ති උද්‍යානය | | 3,193,310 | 47,923,834 |
| මෙගා වොට් 100ක ධාරිතාව සහිත සියඹලාණ්ඩුව සූර්යය බලශක්ති උද්‍යානය | | 9,839,184 | 69,490,776 |
| මන්නාරම දෙවන අදියර | | 18,638,215 | 10,635,538 |
| පුනර්ජනනීය බලශක්ති සේවා වැඩසටහන | | 3,133,600 | 57,777,316 |
| ඉඳුරාන ජලවිදුලිබල පුහුණු මධ්‍යස්ථානය | | | - |
| සූර්යය බලශක්ති පුහුණු මධ්‍යස්ථානය (හම්බන්තොට) | | | 3,180,482 |
| වෙළඳ හා මූල්‍ය ආයතන සඳහා බලශක්ති පරිභෝජන මිනුම් සලකුණු ස්ථාපනය කිරීම | | | - |
| බලශක්ති කළමණාකරු යෝජනාක්‍රමය | | | - |
| උපකරණ බැංකුව | | | - |
| බලශක්ති විගණන | | | - |
| බලශක්ති ලේබල්කරණ වැඩසටහන | | | 1,544,874 |
| ගෘහස්ත අංශය | | | - |
| බලශක්ති අධ්‍යාපන වැඩසටහන් | | | - |
| ප්‍රවර්ධන වැඩසටහන් | | 1,636,211 | 4,238,283 |
| රඳවා ගැනීමේ බදු වියදම | | 7,432,419 | |
| බැංකු ගාස්තු | | 24,877 | 100 |
| | | 43,897,816 | 195,934,996 |
| **අතිරික්තය / හිඟය** | | **151,824,341** | **74,885,189** |
| | | | |
| **සටහන් 21 - ශ්‍රී ලංකා සුනිත්‍ය ඇපකාර අරමුදල** | | | |
| **2023 වසරේ දෙසැම්බර් 31 වැනිදා අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය** | | | |
| **ආදායම** | | | |
| පොලී ආදායම - ස්ථාවර තැන්පතු | | 5,410,132 | 3,909,347 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 19,394,930 | 2,989,693 |
| මුළු ආදායම | | **24,805,062** | **6,899,040** |
| **අඩුකිරීම්** : | | | |
| වියදම | | - | - |
| මුළු වියදම | | - | - |
| | | | |
| ශුද්ධ අතිරික්තය / හිඟය | | **24,805,062** | **6,899,040** |

# මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

| **මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්**<br>*2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | **සටහන** | **2023** | **2022 (ප්‍රතිප්‍රකාශිත)** |
|---|---|---|---|
| සටහන් 21 - ශ්‍රී ලංකා සුනිත්‍ය ඇපකාර අරමුදල | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ආයෝජන | 27 | 136,497,242 | 123,375,090 |
| **ජංගම වත්කම්** | | | |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලිය | | 2,213,066 | 2,467,366 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලිය | | - | 1,826,209 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | | | |
| මහජන බැංකු ජංගම ගිණුම - 078100188503576 | | 13,763,790 | 370 |
| | | 152,474,098 | 127,669,035 |
| සමුච්චිත අරමුදල | | 127,669,036 | 120,769,996 |
| වර්ෂය සඳහා අතිරික්තය / හිඟය | | 24,805,062 | 6,899,040 |
| මුළු සමුච්චිත අරමුදල | | 152,474,098 | 127,669,036 |
| **ජංගම වගකීම්** | | | |
| **එකතුව** | | **152,474,098** | **127,669,036** |

| තැන්පතු ලියාපදිංචි අංකය | කල් පිරෙන දිනය | ආයෝජන අනුපාතය | 2023 වසර සඳහා ශුද්ධ පොලිය | 2023.12.31 වන දිනට තැන්පතුව | 2023.01.01 වන දිනට තැන්පතුව |
|---|---|---|---|---|---|
| 2/0061/11/33829 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33861 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33853 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33888 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33772 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33837 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33845 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33756 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33764 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33802 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33713 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33896 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33799 | 9/21/2024 | 9.00% | 224,741 | 2,185,839 | 1,962,154 |
| 2/0061/11/33870 | 9/25/2024 | 9.00% | 84,437 | 819,690 | 735,808 |
| 2/0061/09/60845 | 10/20/2024 | 8.50% | 84,111 | 814,724 | 731,350 |
| 2/0061/11/34051 | 9/30/2024 | 9.00% | 544,388 | 5,272,341 | 4,732,802 |
| 2/0061/09/49981 | 5/2/2024 | 12.00% | 2,073,697 | 16,929,753 | 14,880,029 |
| **එකතුව** | | | **5,708,260** | **52,252,419** | **46,587,987** |

සටහන 27 භාණ්ඩාගාර බැඳුම්කර - (මහජන බැංකුව, මූලස්ථානය)

| මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් 2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා | කල් පිරෙන දිනය | ආයෝජන අනුපාතය | 2023 වසර සඳහා පොලිය | 31.12.2023 වන දිනට බැඳුම්කර | 2023.01.01 වන දිනට තැන්පතුව |
|---|---|---|---|---|---|
| LKB00425F013 | 6/1/2025 | 17.00% | 4,723,991 | 28,474,416 | 24,947,261 |
| LKB00527I150 | 9/15/2027 | 20.00% | 14,582,084 | 55,770,407 | 51,839,842 |
| **එකතුව** | | | **19,306,075** | **84,244,823** | **76,787,103** |

| මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් 2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා | සටහන | 2023 | 2022 (ප්‍රතිප්‍රකාශිත) |
|---|---|---|---|
| **සටහන 22** | | | |
| අත්තිකාරම - Co-Energy (pvt) Ltd | | - | - |
| අත්තිකාරම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හම්බන්තොට | | 23,992 | 23,992 |
| අත්තිකාරම - සත්ත්ව පාලන දෙපාර්තමේන්තුව | | - | - |
| අත්තිකාරම - Co-Energy ^pvt& Ltd | | - | - |
| අත්තිකාරම - කොළඹ විශ්වවිද්‍යාලය | | - | - |
| අත්තිකාරම - ISB වයඹ පළාත | | 390,150 | 390,150 |
| අත්තිකාරම - ඉන්දි ක්‍රියේෂන් | | 222,500 | 222,500 |
| අත්තිකාරම -ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | | 68,990 | 68,990 |
| ADB - Exterm WEB | | 39,000 | 39,000 |
| | | **744,632** | **744,632** |

**23.1 - වියදම් ගිණුමට වැරදි ලෙස හර කරන ලද අත්තිකාරම් ගෙවීම නිවැරදි කර ඇත.**

2022දී වියදම් ගිණුමට වැරදි ලෙස හර කරන ලද ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පුනර්න් ප්‍රාදේශීය ලේකම්වරයාට කරන ලද අත්තිකාරම් ගෙවීම නිවැරදි කර ඇත.

| | බලපෑම 2022 |
|---|---|
| ආදායම් වැඩිවීම | 46,750,000 |
| අතිරික්ත වැඩිවීම | 46,750,000 |
| ජංගම වත්කම්වල වැඩිවීම | 46,750,000 |
| ශුද්ධ වත්කම් / හිමිකම් වැඩි වීම | 46,750,000 |

**23.2 - උපචිත ගිණුමට වැරදි ලෙස හර කරන ලද වියදම් නිවැරදි කර ඇත.**

කාර්යාල වියදම රු. 36,230/- වැරදි ලෙස උපචිත වියදම් ගිණුමට හර කිරීම නිවැරදි කරන ලදී.

| | බලපෑම 2022 |
|---|---|
| වැඩි කළ වියදම් | 36,230 |
| අතිරික්ත වැඩිවීම | 36,230 |
| අනෙකුත් ජංගම වත්කම්වල අඩුවීම | 36,230 |
| ශුද්ධ වත්කම් / හිමිකම් වැඩිවීම | 36,230 |

**23.3 - භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පොලිය**

භාණ්ඩාගාර බැඳුම්කර 2023 දී ක්‍රමක්ෂ ක්‍රමය සමඟ කල්පිරීම දක්වා රඳවා තබා ගැනීම යටතේ අනාවරණය කර ඇත. එහි පෙර වර්ෂයේ ලැබිය යුතු පොලී නිවැරදි කරන ලදී.

| | බලපෑම 2022 |
|---|---|
| අඩු කළ ආදායම් | 887,627 |
| අතිරික්තය අඩුවීම | 887,627 |
| අනෙකුත් ජංගම වත්කම්වල අඩුවීම | 887,627 |
| ශුද්ධ වත්කම් / හිමිකම් අඩුවීම | 887,627 |

# මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

**23.4 - භාණ්ඩාගාර බැඳුම්කර ක්‍රමක්ෂ කිරීම**

2022 වසර සඳහා භාණ්ඩාගාර බැඳුම්කර ක්‍රමක්ෂ කිරීම

| | බලපෑම 2022 |
|---|---|
| වැඩි කළ ආයෝජන | 1,107,718 |
| අතිරික්තය වැඩිවීම | 1,107,718 |
| | |
| වැඩි කළ ආයෝජන | 1,107,718 |
| ශුද්ධ වත්කම් / හිමිකම් වැඩිවීම | 1,107,718 |

**23.5 - හඳුනා නොගත් අයදුම්පත් ගාස්තුව**

පුනෙකෙරි වැවෙහි මෙගාවොට් 700 ව්‍යාපෘතිය සඳහා අයැදුම්පත් ගාස්තුව ගිණුම්ගත කර ඇත.

| | බලපෑම 2022 |
|---|---|
| ආදායම් වැඩිවීම | 30,000,000 |
| අතිරික්තය වැඩිවීම | 30,000,000 |
| | |
| ජංගම වත්කම්වල වැඩිවීම | 30,000,000 |
| ශුද්ධ වත්කම් / හිමිකම්වල වැඩිවීම | 30,000,000 |

**23.5 - ඉඩම් නිෂ්කාශන වියදම් නිවැරදි කර ඇත.**

සියඹලාණ්ඩුව ව්‍යාපෘතිය සඳහා ඉඩම් නිෂ්කාශනය සඳහා ලබාදී ඇති අත්තිකාරම් මුදල වියදමක් ලෙස පිළිගෙන ඇත.

| | බලපෑම 2022 |
|---|---|
| ආදායම් වැඩිවීම | 1,320,000 |
| අතිරික්තය අඩුවීම | 1,320,000 |
| | |
| ජංගම වත්කම්වල අඩුවීම | 1,320,000 |
| ශුද්ධ වත්කම් / හිමිකම්වල අඩුවීම | 1,320,000 |

**23.6 - වාහන බැහැර කිරීමේ මුදල්**

භාණ්ඩාගාරයේ වගකීමක් ලෙස හඳුනාගෙන ඇති වාහන බැහැර කිරීමේ මුදල්

| | බලපෑම 2022 |
|---|---|
| වැඩි කළ වියදම් | 3,827,970 |
| අතිරික්තය අඩුවීම | 3,827,970 |
| | |
| ජංගම වගකීම් වැඩි වීම | 3,827,970 |
| ශුද්ධ වත්කම් / හිමිකම්වල අඩුවීම | 3,827,970 |

**23.6 - වාර්තා නොකළ ඉඩම් බදු කුලිය**

සිරිඔය ජල විදුලි ව්‍යාපෘතියේ ඉඩම් බදු ආදායම වාර්තා වේ.

| | බලපෑම 2022 |
|---|---|
| ආදායම් වැඩිවීම | 390,000 |
| අතිරික්තය වැඩිවීම | 390,000 |
| | |
| ජංගම වත්කම්වල වැඩිවීම | 390,000 |
| ශුද්ධ වත්කම් / හිමිකම්වල වැඩිවීම | 390,000 |

# මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

**23.7 - බලශක්ති බලපත්‍ර ගාස්තු ආදායම වසර 20ක් සඳහා වෙන් කර ඇත.**

**2022 මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට අනුව වසර 20ක් සඳහා 2011 වසරේ සිට ලැබුණු බලශක්ති බලපත්‍ර ගාස්තුව**

| **මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්** *2023 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | බලපෑම 2022 | බලපෑම 2021 | බලපෑම 2020 | බලපෑම 2019 | බලපෑම 2018 |
|---|---|---|---|---|---|
| ආදායම අඩුවීම | 158,632,468 | 28,168,106 | 5,870,103 | 5,575,370 | 295,071,801 |
| අතිරික්තය අඩු වීම | 158,632,468 | 28,168,106 | 5,870,103 | 5,575,370 | 295,071,801 |
| බලශක්ති බලත්‍ර සංචිතය වැඩි කිරීම | 158,632,468 | 28,168,106 | 5,870,103 | 5,575,370 | 295,071,801 |
| ශුද්ධ වත්කම් / ප්‍රාග්ධන අඩු වීම | 158,632,468 | 28,168,106 | 5,870,103 | 5,575,370 | 295,071,801 |

**23.8 - පුනර්න් සුළං විදුලි බලාගාර ව්‍යාපෘති සමීක්ෂණය සහ පක්ෂි සමීක්ෂණය පිරිවැය වියදම් ලෙස පිළිගෙන ඇත.**

**පුනරීන් සුළං විදුලි බලාගාර ව්‍යාපෘතියේ සමීක්ෂණ සහ පක්ෂීන්, චවුලන් පිළිබඳ අධ්‍යයනය සඳහා ගෙවීම් පුනරීන් වියදම් ගිණුමට මාරු කර ඇති WIP හි ගිණුම්ගත කර ඇත.**

| | බලපෑම 2022 |
|---|---|
| වියදම වැඩිවීම | 23,726,193 |
| අතිරික්තය අඩු වීම | 23,726,193 |
| WIP හි අඩු වීම | 23,726,193 |
| ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය අඩු වීම | 23,726,193 |

23.9 - සියඹලාණ්ඩුව WIP, වියදම් ගිණුමට මාරු කර ඇත.

සියඹලාණ්ඩුව සූර්ය බලාගාර ව්‍යාපෘතියට අදාළ රුක් රෝපණ ව්‍යාපෘතිය සඳහා වන ජීවී දෙපාර්තමේන්තුවට කරන ලද ගෙවීම් වියදමක් ලෙස පිළිගැනේ.

| | බලපෑම 2022 |
|---|---|
| වියදම අඩුවීම | 12,786,940 |
| අතිරික්තය අඩු වීම | 12,786,940 |
| WIP හි අඩු වීම | 12,786,940 |
| ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය අඩු වීම | 12,786,940 |

**සටහන 24 - බලශක්ති බලපත්‍ර ගාස්තු වෙන් කිරීම**

විශේෂයෙන් බලශක්ති බලපත්‍ර ගාස්තු හා සම්බන්ධ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියේ වෙනස්කම් පිළිබඳ 2.2.4.1 සටහන, අධිකාරිය, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල, එහි ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් කිරීමක් ක්‍රියාත්මක කර ඇත. ඓතිහාසික වශයෙන් බලශක්ති බලපත්‍ර ගාස්තු හුවමාරු නොවන ගනුදෙනු ලෙස පිළිගැනිණි. කෙසේ වෙතත්, වත්මන් වාර්තාකරණ කාල සීමාවේ සිට බලපැවැත්වෙන පරිදි, අධිකාරිය එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය SLPSAS 10 - විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම' සමඟ සමපාත වන පරිදි සකස් කර ඇත. බලශක්ති බලපත්‍ර ගාස්තු, බලපත්‍ර ගාස්තු කාල සීමාව මත මේ වනවිට හඳුනා ගැනේ. අධිකාරිය බලපත්‍ර නිකුත් කර ඇති කාල සීමාව පිළිබිඹු කෙරේ. එය සාමාන්‍යයෙන් වසර 20ක කාලසීමාවකි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, අධිකාරිය 2011 වසරේ සිට බලශක්ති බලපත්‍ර ගාස්තු ආදායම නැවත ප්‍රකාශයට පත් කර ඇත. වත්මන් වර්ෂයේ ලැබුණු බලපත්‍ර ගාස්තු, බලපත්‍ර නිකුත් කරන දිනය සැලකිල්ලට නොගෙන, මුළු වසර සඳහා ම වෙන් කරනු ලැබේ. බලපත්‍ර ගාස්තුවේ ඉතිරිය බලශක්ති බලපත්‍ර ගාස්තු සංචිතයට මාරු කරනු ලබන අතර, බලශක්ති බලපත්‍ර ආදායමට වාර්ෂිකව මාරු කිරීමක් සිදු කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

| වර්ෂ | බලශක්ති බලපත්‍ර ආදායම | වසරකට ආදායම | බලශක්ති බලපත්‍ර සංචිතය සඳහා හඳුනාගැනීම |
|---|---|---|---|
| 2011 | 14,714,220 | 735,711 | 6,621,399 |
| 2012 | 30,269,950 | 1,513,498 | 15,134,975 |
| 2013 | 43,790,190 | 2,189,510 | 24,084,605 |
| 2014 | 51,125,464 | 2,556,273 | 30,675,278 |
| 2015 | 31,813,385 | 1,590,669 | 20,678,700 |
| 2016 | 57,407,265 | 2,870,363 | 40,185,086 |
| 2017 | 21,194,365 | 1,059,718 | 15,895,774 |
| 2018 | 109,735,536 | 5,486,777 | 87,788,429 |
| 2019 | 24,818,830 | 1,240,942 | 21,096,006 |
| 2020 | 26,435,330 | 1,321,767 | 23,791,797 |
| 2021 | 51,298,245 | 2,564,912 | 48,733,333 |
| බලශක්ති බලපත්‍ර සංචිතයට මාරු කර ඇත. | | | **334,685,380** |
| බලපත්‍ර ගාස්තුව 2022 ලැබිණි. | 191,329,060 | 9,566,453 | 181,762,607 |
| බලශක්ති බලපත්‍ර ගාස්තුව 2022ට මාරු කෙරිණ. | | 23,130,139 | (23,130,139) |
| බලශක්ති බලපත්‍ර ආදායම 2022 | | **32,696,592** | **493,317,848** |
| අවසර ගාස්තුව 2023 ලැබිණි. | 327,301,540 | 16,365,077 | 310,936,463 |
| බලශක්ති බලපත්‍ර ගාස්තුව 2023ට මාරු කෙරිණ. | | 32,696,592 | (32,696,592) |
| බලශක්ති බලපත්‍ර ආදායම 2023 | | **49,061,669** | **771,557,719** |

| | රු. |
|---|---|
| විහාරස්ථාන සඳහා සූර්ය බල විදුලිය සැපයීම | 7,508,660 |
| සූර්ය හා සුළං බලශක්ති සංවර්ධනය සඳහා විභවයක් සහිත තැනුම්පොළ සොයා ගැනීම සඳහා වේරවිල්, කරච්චි, මාන්තෙයි බටහිර, තුනුක්කායිහි ඩ්‍රෝන සමීක්ෂණය | 36,495,935 |
| | 44,004,595 |

**ව්‍යාපෘති සංවර්ධක වෙතින් වියදම් ප්‍රතිපූරණය කිරීම**

| | ඇමෙරිකා ඩොලර් | ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|
| පූනරින් | 208,331.71 | 50,420.489 |
| මන්නාරම දෙවන අදියර | 217,049.04 | 62,155.60 |
| | 425,380.75 | 112,576,249 |
| 2023.12.31 දිනට සංවර්ධකයා විසින් ප්‍රතිපූරණය කිරීම | | 90,478,814 |

උද්‍යාන සංවර්ධනය සඳහා සංවර්ධකයාගෙන් අත්තිකාරම් ලැබිණි.

| | |
|---|---|
| මන්නාරම ඉඩම් අත්පත් කර ගැනීම | 103,074,125 |
| මන්නාරම දෙවන අදියර ප්‍රවේශ මාර්ග සංවර්ධනය | 32,532,250 |
| | 135,606,375 |
| සංවර්ධකයාගෙන් ලැබුණු මුළු මුදල | 226,085,189 |

සංවර්ධකයාගෙන් ලැබුණු මුළු මුදල සටහන 2.4.4 හි දක්වා ඇති විස්තරයට අනුව වගකීමක් ලෙස අනාවරණය වේ.

ඉහත ව්‍යාපෘතිවලට අදාළ මතු සඳහන් ගෙවීම් අධිකාරිය සිදු කරන ලදී.

| | |
|---|---|
| පූනරින් ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අත්තිකාරම් | 46,750,000 |
| මන්නාරම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අත්තිකාරම් | 96,250,000 |
| මන්නාරම ව්‍යාපෘතියේ ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා අත්තිකාරම් | 32,532,250 |
| සම්පූර්ණ අත්තිකාරම් ගෙවීම | 175,532,250 |





# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ENR/B/SLSEA/1/23/26 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024 සැප්තැම්බර් 27 දින |

RECEIVED 01 OCT 2024 Chairman's Office CH 4153

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

විගණකාධිපති විසින් අත්සන් කරන ලද යථෝක්ත වාර්තාව සහ සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව් පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්:- 01. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

02. ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ENR/B/SLSEA/1/23/26

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 සැප්තැම්බර් 27 දින

RECEIVED 01 OCT 2024 Chairman's Office

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වල ශුද්ධ පොත් අගය රු. මිලියන 451.02 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල එය රු. මිලියන 449.54 ක් ලෙස නැවත ප්‍රකාශ කොට තිබුණි. කෙසේ වෙතත්, ඊට අදාල ගිණුම්කරණ සටහන් අංක 10 අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය පිරිවැය රු. මිලියන 660.99 ක් ලෙසත් සමුච්චිත ක්ෂය වටිනාකම රු. මිලියන 112.54 ක් ලෙසත් දක්වා තිබූයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01හි 29 සහ 53 ඡේදයන් ප්‍රකාරව සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබූ බව නිරීක්ෂණය විය.

1

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් යටතේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේදී ලැබිය යුතු ගිණුම් ශේෂයන් අඩුවීමෙන් වූ රු. මිලියන 26.14 ක මුදල් ගලා ඒම ගලපා නොතිබූ අතර අනෙකුත් ජංගම වත්කම්හි වැඩිවීමෙන් වූ මුදල් ගලා යාම රු.මිලියන 2.13 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පත්වල හා භාණ්ඩාගාර බැඳුම්කරවල පිළිවෙලින් රු.මිලියන 5.54 ක් හා රු. මිලියන 20.18 ක් ආයෝජනය කර තිබුණද එම අගයන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(iii) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 1.033 ක් වටිනා දේපළ,පිරියත හා උපකරණ අත්පත් කර ගෙන තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් ලෙස රු.මිලියන 72.13 ක් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කළ රු. මිලියන 66.54 ක කෙරීගෙන යන වැඩ ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු. මිලියන 85.9 ක් වූ සුළං මිනුම් කුළුණු 12 ක් සහ ඉන්වර්ටර් 2 ක් පොත්වලින් ඉවත් කර තිබුණද ප්‍රමිතයෙහි 81 ඡේදය ප්‍රකාරව ඉන් ඇති වූ වාසිය හෝ අවාසිය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 14 ඡේදය ප්‍රකාරව වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් අස්ථිත්වය වෙත ගලාඒමේ හව්‍යතාවයක් ඇති විට අදාල පිරිවැය වත්කමක් ලෙස හඳුනාගත යුතු වුවත් එවැනි හව්‍යතාවයක් නොමැති සියඹලාන්ඩුව සූර්යබල ව්‍යාපෘතිය වෙනුවෙන් පවරාගැනීමට යෝජිත ඉඩමේ මායිම් කණු සිටුවීම වෙනුවෙන් දරා තිබුණු රු.මිලියන 1.03 ක වියදමක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii) ප්‍රමිතයේ 42 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කළ දින සිට ඉදිරියට සමුච්චිත ක්ෂය වීම් ගණනය කළ යුතු වුවත් 2023 අගෝස්තු 31 සහ දෙසැම්බර් 31 දින සිදුකර තිබුණු වත්කම් ප්‍රත්‍යාගණන වටිනාකම් මත 2023 සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර රු. මිලියන 112.54 ක් ක්ෂය ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි.

(iv) 2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 259,095 ක් වූ අක්‍රිය උපකරණ අයිතම 266 ක් සම්බන්ධයෙන් ප්‍රමිතයේ 79 ඡේදය ප්‍රකාරව කිසිදු වෙන් කිරීමක් සිදු කොට නොතිබූ අතර 86 හා 91 ඡේදයන් ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) 1979 අංක 08 දරන රජයේ ඉඩම් අත්පත්කරගැනීමේ පනත යටතේ 2017 වර්ෂයේදී අධිකාරිය විසින් අත්කරගෙන තිබුණු 2020 වර්ෂයේදී රු. මිලියන 7.8 කට පෞද්ගලික සමාගමකට බදු දී තිබුණු හෙක්ටයාර් 0.62 ක අවිස්සාවේල්ල පිහිටි ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 13 ප්‍රකාරව ආයෝජන දේපළ ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) පාරිතෝෂික වෙන්කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි 76 ඡේදය ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කර ගණනය කර නොතිබුණු අතර ප්‍රමිතියේ 141 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. තවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව පාරිතෝෂික වෙන්කිරීම රු. මිලියන 40.7 ක් වූ අතර උපලේඛනය අනුව රු. 40.4 ක් වූයෙන් රු. 340,821 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ප්‍රත්‍යගණනය නොකල ගොඩනැගිලිවල ආරම්භක පිරිවැය ලෙස ඉකුත් වර්ෂයේ ශුද්ධ අගය වූ රු. මිලියන 86.28 ක් මත සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ගොඩනැගිලි ශුද්ධ වටිනාකම රු. මිලියන 3.75 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සියඹලාන්ඩුව ව්‍යාපෘතියේ නැවත වන වගා සඳහා ඉකුත් වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු රු. මිලියන 12.78 ක අත්තිකාරම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර තිබුණු අතර අත්තිකාරම වැය කල අකාරය පිළිබඳ තොරතුරු ලබා නොගෙන සම්පූර්ණ වටිනාකම වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.මිලියන 25.45 ක බැරකම් අයිතම 2 කට හා රු. මිලියන 2.8 ක වත්කම් අයිතමයකට අදාල විස්තරාත්මක උපලේඛණ, බිල්පත්, ශේෂ සනාථකිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ

ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලිකිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ) iv යටතේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත | |
| (i) 3 වගන්තිය | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය නිල බලයෙන් පත්වන සාමාජිකයින් 12 කින් සහ අමාත්‍යවරයා විසින් පත්කල යුතු සාමාජිකයින් 9 දෙනෙකුගෙන් සැදුම්ලත් සාමාජිකයින් 21 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් 2024 මාර්තු 31 දින වන විටත් ඉන් අමාත්‍යවරයා විසින් පත්කල යුතු එක් සාමාජිකයෙක් පත්කර නොතිබුණි. |
| (ii) 47(1) සහ 67 වගන්ති | බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ව්‍යාපෘති සඳහා ණය ඉල්ලුම්කරන ආයෝජකයින් සඳහා අවශ්‍ය ඇප ලබාදීමේ අරමුණින් පිහිටුවා තිබුණු සුනිත්‍ය බලශක්ති ඇප අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් සකස් කල යුතු රෙගුලාසි සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | |
| (i) පළමු කොටසෙහි පරිච්ඡේද (ii) හි 6 වන හා 7 වන ඡේදයන් | අධිකාරිය විසින් බද්දට යටත් වන අදායම් හා ආයෝජන ආදායම් ඉපයුවද, එම පනතේ 126 (i) ඡේදය ප්‍රකාරව බදු වාර්තා ඉදිරිපත් කොට එම පනතේ 145 වන ඡේදය ප්‍රකාරව බදු ගෙවීම් සිදු කර නොතිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 2022 හා 2023 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 105.54 ක හා රු.මිලියන 88.08 ක අතිරික්තයක්ද රු.මිලියන 34.8 ක හා රු.මිලියන 175 ක ආයෝජන ආදායම්ද උපයා තිබුණද අදායම් බදු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් හෝ සිදු කර තිබුණි. |
| (ii) 93(1) වගන්තිය සහ 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 113(1) වගන්තිය | අධිකාරිය විසින් 2018 වර්ෂයේ සිට 2023 නොවැම්බර් 30 දක්වා ආදායම් වාර්තා ගොනු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 | අක්‍රිය වී තිබුණු රු. මිලියන 20 ක් වටිනා ඉන්වර්ටර් දෙකක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | හා 110 | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | |
| | (i) 11 ඡේදය | අධිකාරියේ 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2024 අගෝස්තු වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) 15.1 ඡේදයේ සඳහන් මු.රෙ 877 (1) (ඇ) (ඇ) සහ 877 (2) (ඇ) වගන්තීන් | අධිකාරිය යටතේ පවතින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල සහ සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල සඳහා 2021, 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා අයවැය ලේඛන සකස් කර නොතිබුණු අතර අරමුදල්වල ලැබීම් සහ ගෙවීම් ගිණුම් තැබීම, කාර්තුමය වාර්තා සහ අවසන් ගිණුම් සකස්කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ සහ ආකෘති ප්‍රකාරව සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 | |
| (i) | රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදය සහ ඇමුණුම 01 හි 1 ඡේදය | අධිකාරියේ විවිධ ක්ෂේත්‍රයන්හි පවතින අවදානම් තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර නොතිබුණු අතර අධිකාරිය විසින් උපායමාර්ගික සැලැස්මට අනුකූලව පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සකස් කර නොතිබුණි. |
| (ii) | රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | 2019 අගෝස්තු 9 දිනැති අංක 2135/61 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග සංග්‍රහයේ අංක 4 හි සඳහන් කාලරාමුව | අධිකාරිය වෙත නෛතිකව වගකීම පවරා දී තිබූ කාර්යයන් 10 ක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

(i) ලංකා විදුලි බල මණ්ඩලයේ මධ්‍යම ජාලයේ පවතින ධාරිතාවය ( Available Grid Capacity ) ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට විසඳුම් ලෙස අධිකාරිය පනතේ 5 (ඇ) වගන්තිය ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර වූ ( off grid ) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් පනතේ 25 (අ) වගන්තිය ප්‍රකාරව 2024 ජූලි වන විටත් මධ්‍යම ජාලයෙන් බැහැර කිසිදු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ii) පනතේ 19 (1) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රය ක්‍රියාත්මකව පවතින්නේ කවර කාලයක් තුලදීද එම කාලය තුලදී ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙනුවෙන් මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ගාස්තුවක් රාජ්‍ය භාගය ලෙස වාර්ෂිකව අධිකාරියට ගෙවීමට සංවර්ධනකරුවන් බැඳී සිටිය යුතුය. නමුත් ඊට අදාල රාජ්‍ය භාගය අයකිරීමට අදාල ක්‍රමවේදය මේ දක්වා තීරණය කර නොතිබීම හේතුවෙන් අදාල රාජ්‍ය භාගය අයකිරීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

(iii) පනතේ 30 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් කුඩා ජල විදුලි ව්‍යාපෘති 15 ක් සඳහා 1979 අංක 08 දරන රජයේ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ හෙක්ටයාර් 14.13 ක් අත්පත්කර ගැනීමේ කටයුතු ආරම්භකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉඩම් විධිමත්ව අත්පත්කරගෙන නොතිබුණි. එම නිසා පනතේ 32 වගන්තිය ප්‍රකාරව එම ඉඩම් බදු දීම හෝ භුක්තිය භාර දීම කර වාර්ෂිකව බදු මුදල් අයකිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. තවද බදු දුන් වෙනත් ඉඩමක් වෙනුවෙන් 2021 සිට 2024 මාර්තු දක්වා අය විය යුතු රු. මිලියන 1.3 ක බදු සහ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(iv) පනතේ 45(1) වගන්තිය ප්‍රකාරව මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන නියමයක් මගින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන සෙස් බද්දක් ආනයනය කරනු ලබන සියළුම පාශානිභූත ඉන්ධන නිෂ්පාදන මත පැනවීම, අයකිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු වුවද ඒ සඳහා ක්‍රමවේද සකස් නොකිරීම හේතුවෙන් අදාල ගාස්තු අයකිරීමට නොහැකි වී තිබුණි.

(v) පනතේ 61 (1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි සහ පරිශ්‍රවලට ඇතුළු වී සෝදිසි කිරීම, සමීක්ෂණය කිරීම, පරීක්ෂාකිරීම හෝ විමර්ෂණය කිරීම සඳහා මණ්ඩලයේ ලිඛිත අධිකාරි බලය සහිතව විශේෂ නිලධාරීන් පත්කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2007-2009 වර්ෂවල විදුලි වාහන ආකෘති 3 ක් නිෂ්පාදනය සඳහා අධිකාරිය විසින් පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 7.8 ක මුදලක් ලබා දී තිබුණි. 2012 දෙසැම්බර් 07 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය ප්‍රකාරව 2013 ජනවාරි 4 දින විගණකාධිපතිගේ ප්‍රධානත්වයෙන් රැස් වී තිබුණු කමිටුවේදී මෙම කාර්යයට සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, මේ සම්බන්ධ සත්‍ය තත්ත්වය ප්‍රධාන ගණන්දීමේ නිලධාරී මඟින් පොදු ව්‍යාපාර කාරක සභාව වෙත දැනුම් දීමටත් තීරණය කර තිබුණි. කෙසේ නමුත්, මීට සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙන නොතිබුණි. තවද අධිකාරිය විසින් අදාල පෞද්ගලික සමාගමට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට කල් ඉකුත් වී තිබූ ගිවිසුමේ 19 කොන්දේසිය ප්‍රකාරව බේරුම්කරණ ක්‍රියාවලියකට පිවිස තිබුණි. එහිදී විදුලි වාහන ආකෘති 3 වෙනුවට එක් ආකෘතියක් පමණක් ලබාගැනීමට තීරණය කර බේරුම්කරණ ක්‍රියාවලිය අවසන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එක් විදුලි වාහන ආකෘතියක් හෝ අධිකාරිය වෙත ලබාගෙන නොතිබුණි.

(ආ) මන්නාරම සහ පූනරින්හි මෙගාවොට් 500 ක ධාරිතාවයෙන් යුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර ඉදිකිරීම විදේශීය පෞද්ගලික ආයෝජකයෙකු වෙත පිරිනැමීම සඳහා 2022 මාර්තු 15 දිනැති අංක අමප/22/0380/301/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ වන විට අධිකාරිය උක්ත ව්‍යාපෘතිවල සිදුකර තිබුණු මූලික සංවර්ධන කාර්යයන් වෙනුවෙන් දරා තිබුණු එ.ජ.ඩො. 747,733 ට සමාන රු.මිලියන 261.7 ක් ව්‍යාපෘති සංවර්ධකගෙන් 2022 නොවැම්බර් 08 දිනැති අංක රහිත ලිපිය මඟින් ඉල්ලුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ව්‍යාපෘති සංවර්ධකගෙන් ලැබිය යුතු එ.ජ.ඩො 425,381 ට සමාන රු. මිලියන 112.5 ක් ලෙස එ.ජ.ඩො 322,352 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කර තිබුණි. එම වටිනාකම් අඩුකිරීම් සඳහා ව්‍යාපෘති සංවර්ධක සමඟ ඇතිකරගත් එකඟතාවයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

(ඇ) පියසි මත සූර්යබල පද්ධති සම්බන්ධතා ලබාදීමට අවශ්‍ය ජාල නවීකරණයට රු. මිලියන 50 ක් ලංකා විදුලි බල මණ්ඩලය වෙත ඉකුත් වර්ෂයේදී ලබා දී තිබුණු අතර එම කාර්යයන්හි ප්‍රගතිය පසුවිපරම් කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ අරමුණු ඉටුකරගැනීමට සෘජු දායකත්වයක් ලබා ගත හැකි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ - (ඉංජිනේරු) අනුමත තනතුරු 48 න් තනතුරු 22 ක්ද තාක්ෂණික සහකාර අනුමත තනතුරු 17 න් 9 ක්ද 2023 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි.

(ඉ) 2021-2025 සංයුක්ත සැලැස්මට අනුව විදුලි වාහන බැටරි ආරෝපණ මධ්‍යස්ථාන 90 ක් සංවර්ධනය කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට කිසිදු මධ්‍යස්ථානයක් ඉදිකර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් පුනර්ජනනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට අදාළ කාර්යයන් 3 ක කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ වෙනත් ව්‍යාපෘති කාර්යයන් 24 ක ප්‍රගතිය සියයට 10 සිට 54 ක වැනි අවම මට්ටමක් පැවතුණි.

(ඊ) කුඩා ජල විදුලි ව්‍යාපෘති 19 ක ආයෝජකයින් විසින් ඉඩම් අත්පත් කරගැනීමට ලබාදුන් මුදලින් ඉතිරි රු. මිලියන 5.6 ක් ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර ඉන් වර්ෂ 05 ඉක්මවූ නිරවුල් නොකල ශේෂය රු. මිලියන 4.2 ක් විය.

ඩබ්ලිව් පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

2024.10.04

විගණකාධිපති

ජාතික විගණන කායර්ාලය,

306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල.

<u>**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාතර්ාව**</u>

උක්ත කරුණට අදාළව 2024.09.27 දින ඔබ විසින් එවන ලද විගණකාධිපති වාතර්ාව සඳහා පිළිතුරු මේ සමග ඉදිරිපත් කරමි.

**1.2.** <u>**තත්වාගණනය කල මතය සඳහා පදනම**</u>

(අ) අධිකාරිය සතුව එක් එක් වත්කම් කාණ්ඩය යටතේ ලෙජරයෙහි පැවැති ශේෂය සඳහා එක් එක් වත්කම් වල මිල දී ගත් පිරිවැය සමුජිතයක් ලෙස හා වත්කමෙහි භෞතික තත්ත්වය පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් පරිදි නොතිබීම මත සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට නොහැකි විය. එනමුත් ඉදිරියේදී වඩාත් විශ්වාසදායි හා ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කිරීමට වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම, කාණ්ඩ කිරීම හා ස්ථාවර වත්කම් ලෙජරය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබිණ.කෙසේ වෙතත් ඉදිරියේදී මේ සම්බන්ධ නිසි ක්‍රියාමාගර් ගැනීමට කටයුතු කරමු.

(ආ)(i).මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ කරන ප්‍රත්‍යාගණන වෙනස්වීම් ගැලපීමේ දී සමස්ථ ජංගම වත්කම් වල වෙනස්වීම් ගැලපීමට කටයුතු කරන ලදි. එනම් සමස්ථ ජංගම වත්කම් වල වැඩිවීම (ලැබිය යුතු පොලිය හැර) මුදල් ගලායාම රු. 148,079,340/= මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා ඇත. මෙය ගණනය කළ ආකාරය ඇමුණුම අංක 2 යටතේ දක්වා ඇත.

(ii) 2023 වෂර්යේ දී අධිකාරිය විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද මුදල රු. 104,093,932/= ක් වන අතර, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා 2023 වෂර්යේ දී එකතු කරන ලද වටිනාකම රු. 1915,064/= ක මුදලකි. එබැවින් එහි මුලු වටිනාකම රු. 106,008,995/= ක ආයෝජන වටිනාකම නිවැරිදිව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබේ.

(iii) මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේ දී ශේෂ පත්‍රය හා එයට අදාල සටහන්වලට අගයන් සම්බන්ධ කිරීමෙන් මෙය සිදු වී ඇත. එනමුත් මෙමගින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන

ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයට බලපෑමක් වී නොමැති බව විශ්වාස කරමු. එමෙන්ම විගණනයේ නිරීක්ෂණය පරිදි 2024 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී මෙය නිවැරදි කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඇ) (i)මෙම අක්‍රිය වී ඇති ඉන්වටර්ර් නැවත අලුත්වැඩියා කිරීමට ඇති හැකියාව සොයා බලමින් පවතී.එය ප්‍රදශර්න භාණ්ඩයක් ලෙස හෝ අධ්‍යන කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ.

සුළං කුළුණු 2012 වෂර්යේ දී අපහරණය කර තිබූ අතර, සුළං කුළුණුවල ඓතිහාසික පිරිවැය හා අදාල අනෙකුත් තොරතුරු නිවැරදිව සොයාගැනීමට අපහසු වූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට අපහසු වූ බැවින්, මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් එළිදරවු කිරීමට කටයුතු කරන ලදි.

(ii) සියඹලාණ්ඩුව ඉඩම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට නීත්‍යානුකූලව බදු අයිතිය පැවරීම සඳහා අවශ්‍ය කටයුතු අවසන් වී තිබෙන අතර, අධිකාරිය විසින් අදාල ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට මූලික කටයුතු වෙනුවෙන් බදු මුදල් 2023 වෂර්යේ දී ගෙවන ලදී. කෙටුම්පත් බදු ගිවිසුම නීතිපති දෙපාතර්මේන්තුව වෙත අනුමැතිය සඳහා යවා ඇති අතර, අනුමැතිය ලද වහාම බදු ගිවිසුම අත්සන් කිරීමට නියමිතව ඇත. එබැවින් මෙම මායිම් කණු සිටුවීම මගින් වත්කම් හඳුනාගැනීම හා අනිකුත් කායර්යන් සඳහා දායකත්වයක් ලබාදෙන බැවින් මායිම් කණු සිටුවීම සඳහා දරණ ලද පිරිවැය ප්‍රාග්ධනික කරණ ලදි.

(iii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 42 හි සඳහන් වන්නේ වත්කම් ප්‍රත්‍යාගණනය කළ දිනට පසු සිදු කරනු ලබන සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු හා අනෙකුත් අපහරණ අඩුකිරීමෙන් පසු අගයට වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු බවයි.

බොහෝ ගිණුම්කරණ ඒකකයන් ක්ෂය ගණනය කිරීමේ දී වත්කම් මිල දී ගන්නා වෂර්ය සඳහා මුලු වෂර්යටම එය ගැලපීමත් වත්කම් විකුණන හෝ ඉවත් කරන වෂර්යේ දී ක්ෂය ගැලපීම් නොකර සිටීමටත් ක්‍රියා කරණු ලබයි. සුනිත්‍ය බලශක්ති අධිකාරිය ද අනුගමණය කරණු ලබන්නේ වත්කම් මිල දී ගත් වෂර්ය සඳහා සම්පූණර් ක්ෂය ගැලපීමටත් ඉවත් කරන වෂර්යේ දී ක්ෂය ගැලපීම් නොකිරීමටත් අදාල වන ලෙසය. මෙම වත්කම් ප්‍රත්‍යාගණන කාලසීමාව ප්‍රමාද වුවද මෙම සියලු වත්කම් 2022 වෂර්යට පෙර මිල දී ගත් වත්කම් වන අතර, බොහෝ වත්කම් පූණර් ලෙස ක්ෂය ගණනය කරන ලද වත්කම් ද වේ. එබැවින් මෙම වත්කම් මුලු වෂර්ය පුරාවටම අධිකාරිය මගින් භාවිතා කර ඇති බැවින් මුලු වෂර්ය සඳහාම ක්ෂය ගැලපීමෙන් මූල්‍ය ප්‍රකාශන වෙත ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවී ඇති බැවින්ඉන් වඩා ඵලදායි අගයක් නිරූපණය කරනු ලබන බවත්, අප විශ්වාස කරමු. අධිකාරිය සතුව වත්කම් වල පූවර් වෂර්වල තොරතුරු නොමැති බැවින් පවත්නා තොරතුරු පරිදි මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

(iv). විගණනයේ නිදෙර්ශ පරිදි ඉදිරි මූල්‍ය ප්‍රකාශන වල දී මෙම තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාගර් ගනිමි.

(ඇ) ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ඉඩම් පනතේ 6.1 සම්පූර්ණ කළ පසු ඉඩමේ නීත්‍යානුකූල ලිපිලේඛන සුනිත්‍ය බලශක්ති අධිකාරියට ලැබෙන අතර, ඉන්පසු තක්සේරු කිරීමේ දෙපාතර්මේන්තුව මගින් තක්සේරු කිරීමෙන් පසුව පොත්වල ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. රු. මිලියන7.8 කට තක්සේරු කර තිබෙනුයේ සංවධරීත ආයතනයේ ඉල්ලීම පරිදි ඔවුනට බදු දීමට ගන්නා බදු වටිනාකමයි.

(ඉ) පාරිතෝෂික වෙන්කිරීම ගිණුම්ගත කිරීමේ දී සිදු වූ දෝෂයන් හේතුවෙන් මෙම වෙනස නිමර්ාණය වී ඇත. 2023/12/31 දිනට මුළු පාරිතෝෂික වෙන්කිරීම් ප්‍රමාණය රු. 140,757,123/= ක් වන අතර, මෙය 0.1% ත් වඩා අඩු ප්‍රතිශතයකි. එනමුත් විගණනය නිරීක්ෂණය පරිදි 2024 මූල්‍ය ප්‍රකාශන සැලකීමේ දී එය නිවැරදි කිරීමට බලාපොරොත්තු වෙමි.

(ඊ) වත්කම් ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීමේ දී සියලුම අයිතම වල සමුජ්චිත ක්ෂය පිරිවැය ගිණුම්වලට මාරුකිරීමේ දී ගොඩනැගිලි සඳහා වන සමුජ්චිත ක්ෂය ද පිරිවැය ගිණුමට වැරදීමකින් මාරු වී ඇත. ඒ අනුව ඉතිරි වූ අගය සඳහා ගොඩනැගිලි සඳහා ක්ෂය ගැපීම් සිදු කර ඇති අතර, මේ පිළිබඳ ගිණුම්කරණ කටයුතු නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාගර් ගැනීමට උපදෙස් ලබාදෙන ලදී.

(උ) අධිකාරිය මෙහිදී ක්‍රියාත්මක වන්නේ ව්‍යාපෘති සංවධර්ක වරයාගේ ක්‍රියාවලියට සමාන ක්‍රියාවලියකිනි. මෙහිදී ව්‍යාපෘතිය සාථර්ක කර ගැනීම හා වන සංරක්ෂණ දෙපාතර්මේන්තුවේ අනුමැතිය ලබාගැනීමේ අරමුණ ඇතිව වන වගා කටයුතු සඳහා රු. 12,786,940/= ක මුදලක් වන සංරක්ෂණ දෙපාතර්මේන්තුව වෙත ලබා දී ඇත. මෙම මුදල වන වගා සඳහා ලබාදුන් දායකත්ව මුදලකි. ව්‍යාපෘතියකට සෘජුව සම්බන්ධ නොවන දායකත්ව මුදල් (ප්‍රාග්ධනික කළ නොහැකි) එම වියදම දරණ ලද වෂර්යේ ආදායමට එරෙහිව ගැලපිය යුතු බැවින් එය 2022 වෂර්යේ වියදමක් ලෙස ගිණුම්ගත කරන ලදී. මෙහි දී ගිණුම්කරන ප්‍රමිත උල්ලංඝණය කිරීමක් සිදු වී නොමැති බව අප විශ්වාස කරමු.

(ඌ) උපචිත වියදම් හා රඳවාගත් මුදල් සඳහා විස්තරාත්මක උපලේඛණ විගණනය වෙත ලබාදීමට කටයුතු කරන අතර, NAMA ව්‍යාපෘතියේ අදාල වියදම් වාතර්ා අධිකාරිය වෙත ලැබීමට සලස්වන මෙන් දකුණු පළාත් සභාවට ලිපි යොමු කර ඇත. එහි පිටපත් විගණනය වෙත ලබාදීමට කටයුතු කරමි.

**2.2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාතර්ාව**

(අ) (i) සභාපති තුමාගේ 2024.05.16 දිනැති ලිපිය මගින් ගරු අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතත් මේ දක්වා එකී පත් කිරීම සිදු කර නැත.

(ii) සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල පිහිටුවීම සඳහා වන කෙටුම්පත් සකසා අවසන් කර ඇති අතර, එය නීති කෙටුම්පත් දෙපාතර්මේන්තුව වෙත යොමු කර ඇත.

(ආ) (i) සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මහා භාණ්ඩාගාරය මත යැපෙන අධිකාරියක් බැවින් හා මහා භාණ්ඩාගාරය මගින් ලැබෙන ප්‍රතිපාදන අඩු කළ විට අලාභයක් පවතින බැවින් බදු ප්‍රතිපාදන

නොකළ මුත් විගණකාධිපතිතුමාගේ නිදෙර්ශ පරිදි ආදායම් බදු සඳහා ලියාපදිංචි වී ආදායම් බදු ගෙවීමට අදාල ක්‍රියාමාගර් ගෙන ඇත.

(ii) ආදායම් බදු සඳහා ලියාපදිංචි වූයේ 2024 වෂර්යේ දී බැවින් ඉලෙක්ට්‍රොනික ආදායම් බදු වාතර්ා අප වෙත නිකුත් කරන මෙන් ආදායම් බදු දෙපාතර්මේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. ඉදිරියේ දී ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට කටයුතු කර ඇත.

(ඇ) මෙම අක්‍රිය වී ඇති ඉන්වටර්ර් නැවතඅලුත්වැඩියා කිරීමට ඇති හැකියාව සොයා බලමින් පවතී.එය ප්‍රදශර්න භාණ්ඩයක් ලෙස හෝ අධ්‍යන කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) (i) වාෂර්ික භාණ්ඩ සමීක්ෂණ වාතර්ාව අවසන් අදියරයේ පවතින අතර, 2024/09/31 දින වන විට අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාගර් ගනිමි.

(ii)මෙම අරමුදල් භාවිතා කිරීමේ ක්‍රමවේද නිසියාකාරව නිම වී නොමැති අතර, ඉදිරියේදී අරමුදල් භාවිතාවට ගැනීමේ දී ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියා කරමි.

(ඉ) (i) මෙම කමිටුව කඩිනමින් පත් කිරීමට බලාපොරොත්තු වන අතර මෙම අරමුදල් භාවිතා කිරීමේ ක්‍රමවේද නිසියාකාරව නිම වී නොමැති අතර, ඉදිරියේදී අරමුදල් භාවිතාවට ගැනීමේ දී ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියා කරමි.

(ii) ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති තුමා වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාගර් ගනිමි.

(ඊ) මෙම බලශක්ති ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගයක් වූ 2030 දී 70 % වූ පුනජර්නනීය බලශක්තිය ප්‍රධාන පද්ධතියට සම්බන්ධීකරණය සඳහා වූ ප්‍රතිපත්තියට සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සහය දෙන ලදී.එහිදී ඉඩම් මැනීමේ කායර්යන් සහ අනෙකුත් කටයුතු වලට මැදිහත් වීම නිසා ඒ වෙනුවෙන් විශාල පරිශ්‍රමයක් දැරීමට සිදු විය.තවද බලපොරොත්තු වූ පරිදි ආසියානු බැංකුව, ලෝක බැංකුව යන ආයතන වලින් ලැබීමට නියමිතව තිබූ මුදල් නොලැබුන නිසා (IMF Condition) මෙමෙ ක්‍රියාවන් කරගෙන යාමට නොහැකි විය.නමුත් අවස්තනුකූලව හැකි සියලු ව්‍යාපෘති දැනටමත් පටන් ගෙන ඇත.

**2.2.3 අධිකාරියේ බලතල, කතර්ව්‍ය සහ කායර්යන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව**

(අ)(i) 2007 වසරේ පනත ප්‍රකාරව ජාතික පද්ධතියේ විදුලි සැපයුම් ප්‍රතිශතය අනුව ජාතික පද්ධතිය දිගු කළ නොහැකි පළාත් වල වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක වන ආකාරය අනුව විදුලි සැපයුම් අවශ්‍යතාවයන් හඳුනාගෙන තිබූ අතර 2021 වන විට ජාතික විදුලිබල පද්ධතියට දිගු කළ ප්‍රතිශතය 98% දක්වා වධර්නය වී ඇති බැවින් ජාතික පද්ධතියෙන් බැහැරව විදුලිය ලබාදිය නොහැකි 2% ප්‍රතිශතයක් සඳහා විදුලිය ලබාදීමට අවශ්‍ය පියවර භූමිය පිහිටීම හා තත්ත්වය අනුව ගැනීමට බලශක්ති අධිකාරිය පියවර ගෙන ඇත.

මැද කැලේ ,උඩගල දෙබොක්ක ,ගල මුදුන වැනි ප්‍රදේශ ජාතික පද්ධතිය දිගු කළ නොහැකි ස්ථාන හඳුනාගෙන විදුලිය ලබාදීම සඳහා සුදුසු ක්‍රියාමාගර් ගෙන ඇත.

තාක්ෂණය දියුණු වීමත් සමග මධ්‍යම ජාලයෙන් බැහැර වූ විදුලි අවශ්‍යතාවයක් ඇති කණ්ඩායම් වෙතොත් ඒ අය සඳහා එම අයගේ අවශ්‍යතාවය මත පෞද්ගලික විදුලියෙන් ලබා ගැනීමේ ක්‍රමවේද ඇත. උදාහරණයක් ලෙස සූයර් කට්ටල සමග බැටරි පද්ධති වෙළඳපොලේ ඇති බැවින් ඒවා තාක්ෂණික ක්‍රමවේද අනුව ලබාගැනීම හා නම් කරන ලද ආයතනයකින් සකස් කර ගැනීමේ පහසුව සලසා ඇත. ඒවාට අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේද අත්පොත් සහ ප්‍රමිතීන් සකසා ඇත. තවද මෙවැනි කට්ටල ස්ථාපිත කිරීම සඳහා පුහුණු කරන ලද පිරිස සුනිත්‍ය බලශක්තිය අධිකාරිය මගින් නිරන්තරයෙන් බිහිකර ඇත.

තවද මේ සඳහා අවශ්‍ය කරන මාගෙර්ාපදේශයන් සකස් කර ඇත.එය ඉදිරියේදී නීති කෙටුම්පත් සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය වෙත වසර 2007 සිට පත් වූ සෑම අමාත්‍යවරයකු සමගම පාහේ මෙම රාජ්‍ය භාගය අයකර ගැනීම පිළිබඳව අධිකාරිය සාකච්ඡා කොට ඇත. විවිධ අවස්ථා ගණනාවක දී මෙම අයකිරීම් සඳහා අවශ්‍ය මුදල් අමාත්‍ය තුමන්ගේ එකඟතාව ලබාගැනීමට ද අධිකාරිය උත්සාහ දරා ඇත. ඒ අයුරින්ම මෙම සංකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකා ද පිළියෙළ කොට අමාත්‍යංශය වෙත යොමු කොට ඇත. අමාත්‍යංශය එකඟ වූ වහාම මෙම අයවීම් අධිකාරිය සතුකර ගැනීමට කටයුතු කරනු ඇත.

(iii) අධිකාරිය විසින් භුක්තිය භාර ගන්නා ලද ඉඩම් කැබලි 45 න් ඉඩම් කැබලි 16 ක් නිවැරදිව බදු දී ඇති අතර ඉතිරි ඉඩම් කැබලි 29 පනතේ 9 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ අවසන් කිරීමෙන් පසුව රෙජිස්ටාර් කායර්ාලයේ ලියාපදිංචි කිරීමෙන් පසු හිඟ බදු මුදල් ද සමඟ නියමිත බදු මුදල් අය කිරීමට කටුයුතු කරන බව දන්වමි.

සිරිඔය කුඩා ජල විදුලි බලාගාරය සඳහා අවශ්‍ය ඉඩම් පනතේ විධිවිධාන අනුව අත්පත් කරගෙන නීතිපති දෙපාතර්මේන්තුවෙන් නිසි පරිදි බදු ගිවිසුමක් අනුමත කර ගැනීමෙන් පසු අදාල කාලවකවානුව තුල අධිකාරිය අයත්ව තිබූ සූයර්බල සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවධර්න රාජ්‍ය අමාත්‍යතුමාගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් ව්‍යාපෘති යෝජක සමඟ බදු ගිවිසුම් ඇති කර ගන්නා ලදී. කෙසේ නමුත් ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මෙතෙක් ආරම්භ වී නොමැති අතර බදු මුදල් ගෙවන ලෙසට අධිකාරිය අදාල ව්‍යාපෘති යෝජක දැනුවත් කර ඇත. අදාල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම අධිකාරියේ පාලනයෙන් තොර හේතු මත සිදු ව ඇත.

(iv) විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය වෙත වසර 2007 සිට පත් වූ සෑම අමාත්‍යවරයකු සමගම පාහේ මෙම සෙස් බදු අයකර ගැනීම පිළිබඳව අධිකාරිය සාකච්ඡා කොට ඇත. විවිධ අවස්ථා ගණනාවක දී මෙම අයකිරීම් සඳහා අවශ්‍ය මුදල් අමාත්‍ය තුමන්ගේ එකඟතාව ලබාගැනීමට ද අධිකාරිය උත්සාහ දරා ඇත. ඒ අයුරින්ම මෙම සංකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය

කැබිනට් අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකා ද පිළියෙළ කොට අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. අමාත්‍යාංශය එකඟ වූ වහාම මෙම අයවීම් අධිකාරිය සතුකර ගැනීමට කටයුතු කරනු ඇත.

(v) බලශක්ති පිල් ලකුණු පිළිබඳ රෙගුලාසියට අනුව, බලශක්ති තොරතුරු වාතර්ා කිරීමට යම් ආයතනයක් අසමත් වූ අවස්ථාවක හෝ බලශක්ති පිල් ලකුණ අනුගමනය කරනු ලබන බවට සහතික වීම සඳහා යම් ආයතන පරිශ්‍රයකට ඇතුළු වී ඒවා පරීක්ෂා කිරීමට, තොරතුරු ලබා ගැනීමට, තොරතුරු තහවුරු කිරීමට හෝ යම් පරීක්ෂාවකට අධිකාරිය විසින් විධිමත් ලෙස ප්‍රතීතනය කරනු ලැබූ බලශක්ති කළමනාකරුවෙකුට හෝ බලශක්ති සේවා සපයන්නෙකුට බලය ලබා දී ඇත.

ඒ අනුව මේ නියමයන් බලපාන යම් පරිශ්‍රයන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා නොදෙන අවස්ථාවක ඒ වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාවලි ක්‍රියාත්මක වීම සඳහා සූදානම් කොට ඇත.

## 2.3 වෙනත් කරුණු

(අ) මේ සම්බන්ධව අභ්‍යන්තර විමශර්නයක් සිදු කර වගකිව යුතු නිලධාරීන්ට අවශ්‍ය ක්‍රියාමාගර් ගතයුතු බවට 2024.07.02 අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේ තීරණය වූ අතර ඒ සඳහා සුදුසු කමිටුවක් පත් කිරීමට පියවර ගෙන ඇති අතර කමිටු වාතර්ාව ඉදිරියේදී විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මේ සඳහා අවශ්‍ය තොරතුරු 2024.08.06 වන දින විගණකාධිපති තුමා වෙත යොමු කරන ලද 2023 වෂර්යේ කෙටුම්පත් වාතර්ාවට අදාල පිළිතුරු සමඟ ඉදිරිපත් කර ඇත.

(ඇ) මෙහි ප්‍රගතිය විමසීම සඳහා විදුලිබල මණ්ඩලය වෙත ලිපි යොමු කරන ලදී. එහෙත් එහි ප්‍රගතිය පිළිබඳ වාතර්ාවක් අධිකාරිය වෙත නොලැබුණු අතර නැවත සිහිකැඳවීම් ද විදුලිබල මණ්ඩලය වෙත සිදු කරන ලදී.

(ඈ) අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය 2020 අගෝස්තු මස කලමණාකරණ සේවා දෙපාතර්මේන්තුව මඟින් අනුමත කරන ලදී. ඉන්පසුව නව කායර් මණ්ඩල අනුමැතිය අනුව එවකට සිටි සේවකයින් අන්තග්‍රර්හණයෙන් පසු නව බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සුදුසුකම් ලබා සිටි අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා උසස් වීම් ලබා දීම 2020 දෙසැම්බර් 15 දින සිදු කරන ලදී.

ඉන්පසුව රට තුල පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීම හේතුවෙන් බාහිර බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රමාද විය.

කෙසේ වෙතත් 2021 මැයි මසදී පූරප්පාඩු සහකාර අධ්‍යක්ෂ ඉංජිනේරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවන ලද අතර ඒ අනුව ඉහල ලකුණු ලබාගත් ඉංජිනේරුවන් 16 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය මඟින් තෝරා 2022.01.01 දින සිට ඔවුන්ට පත්වී ම් ලබාදෙන ලදී. ඉන් 10 දෙනෙකු පමණක් පත්වීම් ලබා ගත් අතර ඔවුන්ගේ 05 දෙනෙකු මේ වන විට ඉල්ලා අස් වී ඇත. ඉන්පසුව 2022 වෂර්යේදී රජය විසින් බඳවා ගැනීම් සීමා කරමින් චක්‍රලේඛ නිකුත් කිරීමෙන්

අනතුරුව අත්‍යාවශ්‍ය තනතුරුවලට බඳවා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අනුව සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුරු 08 ක් ද බඳවා ගැනීම සඳහා 2024.01.02 දින අනුමැතිය ලබා දෙන ලද අතර ඒ අනුව මේ වන විට නව සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) 06 දෙනෙකු බඳවා ගැනීම් සිදු කරන ලදී.

තාක්ෂණික සහකාර තනතුරු 05 ක් සඳහා බඳවා ගැනීම සඳහා කළමණාකරණ සේවා දෙපාතර්මේන්තුව මඟින් 2023.09.18 දින අනුමැතිය ලබා දෙන ලද අතර ඒ අනුව එම බඳවා ගැනීම් මේ වන විට සිදු කර ඇත.

(ඉ) මෙය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

(ඊ) අධිකාරිය සතුව ඉඩම් කටයුතු නිරීක්ෂණය හා අනෙකුත් අදාල ආයතන සමග ගනුදෙනු කිරීමට සිටිනුයේ එක් නිලධාරි මහතෙකු පමණි. මේ දිනවල ක්‍රියාත්මක වන සියඹලාණ්ඩුව, පූනරීන් හා මන්නාරම පුනජර්නනීය බලශක්ති ව්‍යාපෘතීන් සඳහා ඔහු බොහෝ කාර්යබහුල වී තිබිණ. මේ සඳහා ඉදිරියේ දී අධිකාරියට අනුමත කාර්මණ්ඩල සංඛ්‍යාව නැවත ප්‍රතිස්ථාපනය කර ඉඩම් ගැටලුව ඉතා ඉක්මනින් නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි.

**සභාපති**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

# ආයතනික තොරතුරු

අධිකාරියේ නම
**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

නීතිමය තත්ත්වය
2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මගින්
ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත අධිකාරියකි.

ලියාපදිංචි කල කාර්යාලය
72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07
දුරකථන : 0112575203 / 0112575030
ෆැක්ස්: 0112575089
විද්‍යුත් තැපෑල: info@energy.gov.lk
වෙබ් අඩවිය : www.energy.gov.lk